ධර්මදානය පිණිස යි.

# සුපිරිසිදු නිවන් මග

## ( සප්ත විශුද්ධි )

සම්පාදක

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

තෙවන මුද්‍රණය - සංස්කරණය I

# සුපිරිසිදු නිවන් මග
## (සප්ත විශුද්ධි)

සම්පාදක

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | : **වෙසක්/2551** | **(2007 මැයි)** |
| දෙවන මුද්‍රණය | : **නවම්/2551** | **(2008 පෙබරවාරි)** |
| තෙවන මුද්‍රණය - සංස්කරණය I | : **නවම්/2551** | **(2008 පෙබරවාරි)** |


Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007

## *<u>ශ්‍රී සද්ධර්ම සංසදයෙන් ප්‍රකාශිත වෙනත් ධර්මග්‍රන්ථ</u>*

පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේ

- අසිරිමත් දනය
- ධම්මචක්කප්පවත්තන සූත්‍රය සහ අමාදම්ඇස පහළ වීම
- ආනාපානසති භාවනාව
- ඉරියාපථ භාවනාව සහ සම්පජඤ්ඤ භාවනාව
- තෙරුවන් වන්දනාව, සෙත් පිරිත් සහ තෙසැත්තෑ-ඤාණ වන්දනාව
- මහාසාරෝපම සූත්‍රය
- ධම්මානුස්සති භාවනාව
- පටික්කූලමනසිකාර භාවනාව (පිළිකුල් භාවනාව)
- පින සහ කුසලය එකක් ද? දෙකක් ද?
- කර්මය පිළිබඳ අගනා දෙසුමක් (චූළකම්මවිභඞ්ග සූත්‍රය)
- ක්‍රෝධය නසන මග (ආඝාතපටිවිනය සූත්‍රය)

පූජ්‍ය දිප්පිටිගොඩ සෝමශාන්ත ස්වාමීන් වහන්සේ

- ධාතුමනසිකාර භාවනාව
- නවසීවථික භාවනාව
- බුද්ධානුස්සති භාවනාව

බන්දුල ආනන්ද පෙරේරා

- පරාභව සූත්‍රදේශනාව සහ මහාමඞ්ගල සූත්‍රදේශනාව

නැවත මුද්‍රණය සඳහා, සියලු විමසීම්,

**ශ්‍රී සද්ධර්ම සංසදය**
**ධම්මාරාම යෝගාශ්‍රමය**
**උග්ගල්බොඩ, ගම්පහ.**

Tel : **071-4417813**
E-mail : **info@sadaham.net**
Web : **www.sadaham.net**

## ධර්මදානය සඳහා දයකත්වය

* මාතලේ කොටුවේගෙදර විසූ **N. M.** යසෝමැණිකේ මැණියන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස එතුමියගේ දියණියන් වන **J. E. M.** ටිකිරිකුමාරිහාමි, **J. E. M.** චන්ද්‍රාකුමාරිහාමි, **J. E. M.** චිත්‍රාකුමාරිහාමි සහ **J. E. M.** ලලිතාකුමාරිහාමි විසින්,
* 'ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කලණමිතුරු හවුල' විසින් තමන්ට ධර්මාවබෝධය පිණිස,
* **S.** රත්නායක උපාසක මහතා විසින් තමන්ට ධර්මාවබෝධය පිණිස,
* **W. P. C.** සම්පත් ප්‍රේමරත්න උපාසක මහතා විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස සහ තමාට ධර්මාවබෝධය පිණිස,

මෙම ධර්මදානය සිදු කරන ලදී.

--*--


**ප්‍රකාශනය**

## ශ්‍රී සද්ධර්ම සංසදය

**ධම්මාරාම යෝගාශ්‍රමය**
**රයියාදෙළුව, උග්ගල්බොඩ, ගම්පහ.**

**විමසීම්:- 071 - 4417813**
**වෙබ් අඩවිය: www.sadaham.net**

**වෙබ් අඩවිය සඳහා දයකත්වය**

e-Artefacts Technologies
**305/5, Hansagiri Road, Gampaha.**
**Tel: 071-4417813, 077-3021777**
**Web: www.eartefacts.com**

# පෙරවදන

සාගරය ගැඹුරු වූයේ අනුපිළිවෙළිනි. බුදුසසුනත් ගැඹුරු වන්නේ අනුපිළිවෙළිනි. මහසයුර දශවිධ රත්නයනට ආකරයකි. රත්නාකරය යනුවෙන් මහසයුර හඳුන්වනුයේ එහෙයිනි. සම්බුදුසසුන ද රත්නාකරයකි. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නමැති රත්නයන්ට ආකරයක් වැනි බැවිනි. රත්නාකරයක් වැනි වූ සම්බුදුසසුනෙහි මාර්ග-ඵල, නිවන තෙක් ගැඹුර, නුවණින් දක ගැනීමට බැස ගත යුත්තේ අනුපිළිවෙළිනි. ශීලයෙන් සමාධියට, සමාධියෙන් ප්‍රඥාවට, ප්‍රඥාවෙන් විමුක්තියට, විමුක්තියෙන් විමුක්තිඥානදර්ශනයටත් නුවණින් පැමිණිය යුතු වන බැවිනි.

සත්තවිසුද්ධියෙන් බුදුසසුනෙහි අනුපිළිවෙළ විවරණය වෙයි. සීලවිසුද්ධියෙන් බුදුසසුනෙහි ආදිකල්‍යාණය නම් වූ ශීලශික්ෂාව ද, චිත්තවිසුද්ධියෙන් මධ්‍යකල්‍යාණය නම් වූ සමාධිශික්ෂාව ද, ඉතිරි විසුද්ධි පසෙන් ම පර්යවසාන-කල්‍යාණය නම් වූ ප්‍රඥාශික්ෂාව ද සපිරේ. යථෝක්ත ශික්ෂාත්‍රයෙන් ම නිර්වාණාවබෝධයට ප්‍රත්‍යය වන සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ අනුපිළිවෙළින් වැඩෙති.

අනවරාග්‍ර සංසාරයෙන් එතෙර වී ශාන්ත නිවන් සුව සාක්ෂාත් කිරීම පිණිස සැමදෙනා විසින් සත්තවිසුද්ධි වැඩිය යුතු ම ය. ත්‍රිපිටකයෙහි සහ අර්ථකථාවන්හි ඇතිතාක් කරුණු එක්කොට සංක්ෂේප වූත් සරල වූත් අර්ථ විවරණය කරමින් <u>සුපිරිසිදු නිවන් මග</u> යන නමින් මේ දහම් පොත සම්පාදනය වී ඇති ආකාරය අතිශයින් ප්‍රශංසනීය යි. නිවන් මග තත්ත්වාකාරයෙන් විවරණය කරන විසුද්ධිමග්ග අර්ථකථාව මේ සඳහා විශේෂයෙන් ගුරුතැන තබා ගෙන ඇත. පිටකත්‍රයාගත සත්තවිසුද්ධි සඞ්ඛ්‍යාත නිවන් මග සර්වාකාරයෙන් හෙළි කරනුයේ විසුද්ධිමග්ගය ම බැවිනි.

ශ්‍රද්ධාවත් ප්‍රඥාවත් යොදා ඉතාමත් නිවැරදි ව මේ දහම් පොත සම්පාදනය කළ පූජ්‍ය නාවල ධම්මානන්ද ස්වාමීන් වහන්සේට රත්නත්‍රය සතු අසීමිත සුවිසි මහාගුණානුභාව බලයෙන් තව තවත් ධර්මඥානයත් භාවනාඥානයත් විංශත්ශතවර්ෂාධික කාලයක් ආයුරාරෝග්‍යාදි ශ්‍රී සම්පත් ද අත්වේවා.!

**'සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා'**

**මෙයට මෙතැති,**

**නා උයනේ අරියධම්ම ස්ථවිර.**
**නා උයන අරණ්‍ය සේනාසනය,**
**පන්සියගම,**
**මැල්සිරිපුර.**

# හැඳින්වීම

**දසබලසේලප්පභවා - නිබ්බානමහාසමුද්දපරියන්තා,**
**අට්ඨඞ්ගමග්ගසලිලා - ජිනවචනනදී චිරං වහතු.**

තුන්ලෝකාග්‍ර වූ ශාන්තිනායක අප බුදුරජාණන් වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය අනුපිළිවෙලින් නිවන කරා ගැඹුරට යන්නකි. ඒ බව පැහැදිලි වන උතුම් දේශනාවකි, මජ්ඣිමනිකායේ මූලපණ්ණාසකයෙහි සඳහන් 'රථවිනීත' සූත්‍රය. භාග්‍යවතුන් වහන්සේගේ ඖරසපුත්‍ර වූ ධර්මසේනාපති සාරිපුත්ත මහරහතන් වහන්සේගේත් ධර්මකථික භික්ෂූන් අතරින් අගතැන් පත් මන්තානිපුත්තපුණ්ණ මහරහතන් වහන්සේගේත් ධර්ම සාකච්ඡාවකි, මෙම සූත්‍රයෙන් ඉදිරිපත් කෙරෙන්නේ. සීලවිසුද්ධියෙන් ඇරඹෙන යෝගාවචර ප්‍රතිපදාව අනුපිළිවෙලින් චිත්තවිසුද්ධි, දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි, ඤාණදස්සනවිසුද්ධි යන සප්ත විශුද්ධීන් සම්පූර්ණ වීමෙන් නිර්වාණධාතුව සාක්ෂාත් කිරීම දක්වා පිළිවෙලින් සම්පූර්ණ වී සන්තානය විශුද්ධියට පත් වන ආකාරය එම සූත්‍රයෙහි සඳහන් ව තිබේ. සප්ත විශුද්ධීන් පිළිබඳ සංක්ෂිප්ත සඳහනක් පමණි, 'රථවිනීත' සූත්‍රයෙහි දක්වෙන්නේ. සප්ත විශුද්ධීන් පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් දක්නට ලැබෙන්නේ මහාඅට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සඞ්ග්‍රහ කරන ලද 'විසුද්ධිමග්ග' ග්‍රන්ථයෙහි ය. 'විසුද්ධිමග්ග' ග්‍රන්ථය වනාහි 'සුත්තානුලෝම' ගණයට අයත් අට්ඨකථාවන් අතර විශිෂ්ට ග්‍රන්ථ රත්නයකි. මුළුමහත් ත්‍රිපිටකයෙහි හා අට්ඨකථාවන්හි සාරය විසුද්ධිමග්ගයෙහි සඞ්ග්‍රහ වී ඇතැ'යි පවසතොත් එය අතිශයෝක්තියක් නො වනු ඇතැ'යි සිතමි. සම්පූර්ණ ත්‍රිපිටකය ම අධ්‍යයනය කිරීමට අපහසු යෝගාවචරයන් විසින් අඩු ම තරමින් 'විසුද්ධිමග්ග' ග්‍රන්ථය හෝ ඉගෙනීමට වෑයම් කළ යුතු ය. ශීල - සමාධි - ප්‍රඥා යන ත්‍රිශික්ෂාවන් අනුව සප්ත විශුද්ධීන් අනුපිළිවෙලින් විවරණය කෙරෙමින් ශ්‍රීමත් බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින්

විසුද්ධිමග්ග ග්‍රන්ථයෙහි ධර්ම කරුණු පෙළගස්වා ඇත්තේ බබළන මිණිරුවන් පෙළක් පෙළගස්වන පරිද්දෙනි. විසුද්ධිමග්ගය වනාහි භාවනා උපදෙස් ලබා දෙන ගුරුවරුන්ට ගුරු - අත්පොතකි. එසේ ම නිවන් අවබෝධ කරනු රිසියෙන් භාවනා කරන යෝගාවචරයන්ට නිවැරදි මග පෙන්වන මහාර්ඝ උපදේශ ග්‍රන්ථයකි. ධර්මකථිකයනට සදහම් ආකරයකි. එහි වටිනාකම අවබෝධ කර නො ගත් පෙර - අපර දෙදිග ඇතැම් විචාරකයන් විසුද්ධිමග්ගය පිළිබඳ නොයෙක් සදෙස් විවේචන ඉදිරිපත් කරමින් නිවන් මග අසුරා ගත්තත් බුරුමයෙහි වැඩවසන අග්ගමහාකම්මට්ඨානාචරිය අතිපූජනීය එා-අවුක් (ආචිණ්ණ) සෙයාඩෝ මාහිමිපාණන් වහන්සේ බඳු බහුශ්‍රැත යෝගාවචරයන් වහන්සේලා විසුද්ධිමග්ගය ඇසුරින් නිවන් මග විවර කර ගෙන ලොවුතුරු මිහිර අත්විඳිති. විසුද්ධිමග්ගය වනාහි එදත් අදත් කවදත් සදහම් මිහිර හඳුනන නුවණැති සත්පුරුෂයන්ගේ ශ්‍රද්ධා-බුද්ධි වඩවන උතුම් ග්‍රන්ථරත්නයකි.

විසුද්ධිමග්ග ග්‍රන්ථය කියවා කරුණු දැනගැනීමට අවස්ථාවක් නො ලබන සැදැහැති උපාසක-උපාසිකාවන්ගේ ශ්‍රද්ධා-බුද්ධි වර්ධනය පිණිස සප්ත විශුද්ධීන් පිළිබඳ ව කෙටියෙන් හඳුන්වා දෙමින් අප විසින් සකස් කරන්නට යෙදුණු දහම්-ලිපි පෙළ පසු ව එක්තැන් කරමින් '**සුපිරිසිදු නිවන් මග**' නම් මෙම කුඩා ධර්මග්‍රන්ථය සඞ්ග්‍රහ කරන ලදී. මෙම ග්‍රන්ථයෙන් ඉදිරිපත් කෙරෙන්නේ සප්ත විශුද්ධීන් පිළිබඳ මූලික හැඳින්වීමක් පමණක් බැවින් වැඩි දුරටත් විස්තර දැනගනු කැමති සත්පුරුෂයෝ විසුද්ධිමග්ග (විශුද්ධිමාර්ගය) ග්‍රන්ථය පරිශීලනය කරත්වා!

මහාඅට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සප්ත විශුද්ධීන් මැනවින් විවරණය කෙරෙමින් විසුද්ධිමග්ග ග්‍රන්ථය සම්පාදනය කරනු ලැබූ නිසා ය, ඒ ඇසුරින් අපට ද මෙබඳු ධර්මග්‍රන්ථයක් සම්පාදනය කළ හැකි වූයේ. එනිසා පළමු ව **මහාඅට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේට** මාගේ නමස්කාර පූර්වක ප්‍රණාමය පුද කර සිටිමි.

අපගේ පරම පූජනීය උපාධ්‍යායන් වහන්සේ වූ අපවත් වී වදාළ, ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක ආර්යවිලාසවංසාලඞ්කාර සද්ධර්මවාගීශ්වරාචාර්ය පටිපත්තිසෝභන ගණපාමොක්ඛාචරිය රාමඤ්ඤ මහානිකායේ මහෝපාධ්‍යාය රාජකීය පණ්ඩිත **අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන මාහිමිපාණන් වහන්සේට** ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම ධර්මදානමය කුසලය ද හේතු වාසනා වේවා!

අපවත් වී වදාළ ප්‍රව්‍රජ්‍යාචාර්ය අතිගරු කිතුලම්පිටියේ ආනන්ද ස්වාමීන් වහන්සේට ද මෙම ධර්මදානමය කුසලය අත්පත් වීමෙන් ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව සැලසේවා!

අපගේ වත්මන් ගෞරවණීය උපාධ්‍යායන් වහන්සේ වන ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ මහෝපාධ්‍යාය, බුත්තල - බුදුගල්ලෙණ අරණ්‍ය සේනාසනාධිපති **අතිගරු පූජනීය මාවතගම ගුණානන්දාභිධාන මාහිමිපාණන් වහන්සේට** ද මෙම ධර්මදානමය කුසල බලයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳීමට මෙම ධර්මදානමය කුසලය ද හේතු වාසනා වේවා!

මෙබඳු ධර්මසඞ්ග්‍රහයන් සැකසීමට අවශ්‍ය කෙරෙන ධර්මඥානය දියුණු කර ගැනීම සඳහා මහත් වූ කරුණාවෙන් මාහට අනුග්‍රහ කරන්නා වූ ගිලන් ව සිටිමින් පවා අපගේ දහම් ගැටළු විසඳා දෙමින් දුරවබෝධ සියුම් දහම් කරුණු ඉතා පැහැදිලි ලෙස තේරුම් කර දෙන්නා වූ ද ශීල - ශ්‍රැත - සති - ප්‍රඥා ආදි උතුම් ගුණයන්ගෙන් ශෝභමාන ව මහාසංඝරාජයාණන් වහන්සේනමක් බඳු ව සසුනඹර බබළවන්නා වූ වත්මන් ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති මහාධර්මකථික මහාකම්මට්ඨානාචරිය ත්‍රිපිටකධරාචාර්ය **අතිපූජනීය නා උයනේ අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේට** මෙම ධර්මදානමය කුසල බලයෙන් විංශත්ශතවර්ෂාධික කාලයක් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා! ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුව අත්විඳුමට මෙම

මෙම ධර්මදානමය කුසලය ද හේතු වාසනා වේවා!

විවිධාකාරයෙන් මාහට උපකාර කරන පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානයෙහි අනුශාසක **අතිගරු පූජනීය මීතලාවේ විනීත ස්වාමීන් වහන්සේට** ද **පූජනීය ග්‍රීසියේ ඤාණදස්සන ස්වාමීන්** වහන්සේට ද **දිද්දෙණිය රණගිරිය අරණ්‍ය සේනාසනාධිවාසී පූජනීය නුවරඑළියේ ඤාණසීල ස්වාමීන් වහන්සේට** ද පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසී **පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේට** ද මෙම ධර්මදානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් මෙන් ම ප්‍රාර්ථනීය බෝධියකින් අමා නිවන් සුවය ද සැලසේවා!

හැදූවැඩූ මවුපිය දෙදෙනා වහන්සේටත් සිවුපසයෙන් උපස්ථාන කරන දායකකාරකාදි සැමටත් පරිගණක මුද්‍රණ කටයුතු සිදු කළ පුණ්‍ය ශ්‍රී තුෂන්ත තරුණ උපාසක මහතාටත් මුද්‍රණාලයේ කාර්යමණ්ඩලයටත් ධර්මදානය සිදු කරන දායක පින්වතුන්ටත් සදේවකලෝකයාටත් මෙම ධර්මදානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍ය සම්පත් මෙන් ම අමා නිවන් සුවය ද නො පමා ව සැලසේවා!

සාධු ! සාධු !! සාධු !!!

**මෙයට,**

**සසුන් ලැදි,**

**පූජ්‍ය නාවල ධම්මානන්ද හිමි.**
**ධම්මාරාම යෝගාශ්‍රමය,**
**උග්ගල්බොඩ,**
**ගම්පහ.**
**(වෙසක් - 2551)**

# පටුන


1. සීලවිසුද්ධි - **10**
2. චිත්තවිසුද්ධි - **12**
3. දිට්ඨිවිසුද්ධි - **16**
4. කඞ්ඛාවිතරණවිසුද්ධි - **20**
5. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි - **22**
    - **I.** චත්තාළීසාකාර විපස්සනා භාවනාව - **24**
    - **II.** රූපසත්තක ක්‍රමය - **32**
    - **III.** අරූපසත්තක ක්‍රමය - **39**
    - **IV.** විදර්ශනා උපක්ලේශ - **46**

6. පටිපදාඤාණදස්සනවිසුද්ධි - **49**
7. ඤාණදස්සනවිසුද්ධි - **62**
8. මාර්ග-ඵල ලැබීම සඳහා සපුරා ගත යුතු බෝධිපාක්ෂික ධර්ම - **69**
9. සප්ත විශුද්ධීන් ඇති කර ගත් ආර්යශ්‍රාවකයන් වහන්සේලා - **73**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස !!!
භාග්‍යවත් වූ අර්හත් වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

# සුපිරිසිදු නිවන් මග
## (සප්ත විශුද්ධි)

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් නිර්වාණගාමිනී ප්‍රතිපදාව පිළිබඳ ව දේශනා කරනු ලැබූ තවත් ක්‍රමයකි, 'සප්ත විශුද්ධි' නමින් හැඳින්වෙන්නේ. මහාඅට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිත 'විසුද්ධිමග්ග' ග්‍රන්ථයෙහි නිවන් මග විස්තර කර ඇත්තේ ද මජ්ඣිමනිකායේ 'රථවිනීත' සූත්‍රයෙහි සඳහන් වන මෙම සප්ත විශුද්ධි අනුසාරයෙනි. පරම විශුද්ධිය වන නිර්වාණය සාක්ෂාත් කිරීම සඳහා ශීලාදි ප්‍රතිපත්ති පිරිසිදු ලෙස සම්පූර්ණ කර ගැනීම මෙහි 'විශුද්ධි' නාමයෙන් දක්වා ඇත. එම විශුද්ධි හත නම්,

1. සීලවිසුද්ධි
2. චිත්තවිසුද්ධි
3. දිට්ඨිවිසුද්ධි
4. කඞ්ඛාවිතරණවිසුද්ධි
5. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි
6. පටිපදාඤාණදස්සනවිසුද්ධි
7. ඤාණදස්සනවිසුද්ධි

## 1. සීලවිසුද්ධි

ගෘහස්ථ හා ප්‍රව්‍රජිත යෝගාවචරයන්ගේ කාය, වාග් සංවරයේ පිරිසිදු බව සීලවිසුද්ධිය යි. 'පඤ්චසීල', 'අට්ඨාඞ්ගුපෝසථසීල', 'නවාඞ්ගුපෝසථසීල', 'ගහට්ඨදසසීල' යන මේවා ගෘහස්ථ යෝගාවචරයන්ට අයත් ශීල ප්‍රතිපදාවෝ ය. 'සාමණේරදසසීල', 'උපසම්පදාසීල' යන මේවා ප්‍රව්‍රජිත යෝගාවචරයන් වහන්සේලාගේ ශීල ප්‍රතිපදාවෝ ය. තමා රක්නා

ශීලය කඩ නො කොට නිවන සාක්ෂාත් කිරීම පිණිස පිරිසිදු ව රැක ගැනීම <u>සීලවිසුද්ධිය</u> යි. ප්‍රමාදයකින් ශීලය අපිරිසිදු වී නම් වහා ශීලය ප්‍රකෘතිමත් කර ගෙන 'ආයතිසංවරයෙහි' පිහිටිය යුතු ය.

ගෘහස්ථ ශ්‍රාවකයන්ගේ පඤ්චසීලාදි ශීලයන් ද ප්‍රව්‍රජිතයන් වහන්සේලාගේ සාමණේර, උපසම්පද ශීලයන් ද විශුද්ධ වූ ශීලයක් බවට පත් වන්නේ එම ශීලය අංග අටකින් සමන්විත වීමෙනි. ඒවා නම්,

1. **අඛණ්ඩ** - සමාදන් වූ ශීලයෙහි මුලින් හා අගින් ශික්ෂාපද නො බිඳීම.
2. **අච්ඡිද්ද** - සමාදන් වූ ශීලයෙහි මැදින් ශික්ෂාපද නො බිඳීම.
3. **අසබල** - සමාදන් වූ ශීලයෙහි පිළිවෙළින් ශික්ෂාපද දෙක-තුනක් නො බිඳීම.
4. **අකම්මාස** - සමාදන් වූ ශීලයෙහි තැනින් තැන ශික්ෂාපද නො බිඳීම.
5. **භුජිස්ස** - තෘෂ්ණාදාසභාවයෙන් තොර ව (එනම්, ලෞකික ලාභයන් ලැබීමේ අපේක්ෂාවෙන් තොර ව) ශීලය ආරක්ෂා කිරීම.
6. **විඤ්ඤූප්පසත්ථ** - නුවණැති උතුමන්ගේ ප්‍රශංසාවට ලක් වන සේ පිරිසිදු ව ශීලය ආරක්ෂා කිරීම.
7. **අපරාමට්ඨ** - තෘෂ්ණා, දෘෂ්ටි ආදියෙන් වැරදි ලෙස ග්‍රහණය කර නො ගෙන පිරිසිදු ව ශීලය ආරක්ෂා කිරීම.
8. **සමාධිසංවත්තනික** - උපචාර, අර්පණා සමාධීන් ලැබීමට සුදුසු වන සේ ශීලය ආරක්ෂා කිරීම.

මෙම අංග අටෙන් සමන්විත වන ගෘහස්ථ මෙන් ම ප්‍රව්‍රජිත යෝගාවචරයන් වහන්සේලාගේ සුපිරිශුද්ධ ශීලය වනාහි <u>සීලවිසුද්ධිය</u> යි.

# 2. චිත්තවිසුද්ධි

උපචාර සමාධි සහිත වූ අෂ්ට සමාපත්ති ඇති කර ගැනීම 'චිත්තවිසුද්ධි' නම් වේ. සිත අඳුරු කරන, කිලිටි කරන පඤ්ච-නීවරණ ආදි උපක්ලේශ දුරු කරමින් සිත පිරිසිදු කර ගෙන සමාධිය ඇති කර ගැනීම චිත්තවිසුද්ධිය යි. එය අවම වශයෙන් උපචාර සමාධිය ලෙස ද මධ්‍යම වශයෙන් රූපාවචර ධ්‍යාන සතර ලෙස ද උපරිම වශයෙන් උපචාර සහිත අෂ්ට සමාපත්ති ලෙස ද දැක්විය හැකි ය. මෙම චිත්තවිසුද්ධිය ඇති කර ගැනීමට උපකාරී වන භාවනා ක්‍රම (කර්මස්ථාන) සතළිසක් **(40)** විසුද්ධිමග්ගයෙහි විස්තර සහිත ව දක්වා ඇත. ඒවා නම්,

- **දස කසිණ**

1. පඨවී - කසිණ
2. ආපෝ - කසිණ
3. තේජෝ - කසිණ
4. වායෝ - කසිණ
5. නීල - කසිණ
6. පීත - කසිණ
7. ලෝහිත - කසිණ
8. ඕදාත - කසිණ
9. ආලෝක - කසිණ
10. ආකාස - කසිණ

- **දස අසුභ**

1. **උද්ධුමාතක-අසුභය** - හිසේ සිට දෙපතුළ දක්වා ඉදිමී ගිය මළසිරුරු ය.
2. **විනීලක-අසුභය** - බොහෝ සෙයින් නිල් පැහැති (ප්‍රකෘති ශරීර වර්ණය වෙනස් වූ) මළසිරුරු ය.
3. **විපුබ්බක-අසුභය** - ශරීරයේ සිදුරුවලින් සැරව වැගිරෙන මළසිරුරු ය.
4. **විච්ඡිද්දක-අසුභය** - කඳ මැදින් දෙකඩ වූ මළසිරුරු ය.
5. **වික්ඛායිතක-අසුභය** - සතුන් විසින් තැනින් තැන කඩා කනු ලැබූ මළසිරුරු ය.
6. **වික්ඛිත්තක-අසුභය** - තැන තැන විසිරී ගිය අවයව ඇති මළසිරුරු ය.
7. **හතවික්ඛිත්තක-අසුභය** - කාකපාදාකාරයෙන් පෙති පෙති ගසා වෙන් කිරීමෙන් අවයව විසිරී ගිය මළසිරුරු ය.

8. **ලෝහිතක-අසුභය** - ලේ වැකුණු මළසිරුර ය.
9. **පුලවක-අසුභය** - පණුවන්ගෙන් පිරිගත් මළසිරුර ය.
10. **අට්ඨික-අසුභය** - එක ඇට කැබැල්ලක් හෝ ඇටසැකිල්ල ම අට්ඨික අසුභය යි.

මෙම කර්මස්ථාන දහය ම අයත් වන්නේ බාහිර මළසිරුරක් නිමිත්ත වශයෙන් ගෙන භාවනා කළ යුතු 'අවිඤ්ඤාණක-අසුභ' ගණයට යි. මෙම 'අසුභ නිමිති' අරමුණු කර ගෙන භාවනා කිරීමෙන් ප්‍රථමධ්‍යාන සමාධිය ඇති කර ගත හැකි ය.

- <u>දස අනුස්සති</u>

1. **බුද්ධානුස්සති** - බුදුගුණ සිහි කිරීම.
2. **ධම්මානුස්සති** - දහම්ගුණ සිහි කිරීම.
3. **සඞ්ඝානුස්සති** - සඟගුණ සිහි කිරීම.
4. **සීලානුස්සති** - තමා රකින ශීලයෙහි පිරිසිදු බව මෙනෙහි කිරීම.
5. **චාගානුස්සති** - තමා තුළ පවතින පරිත්‍යාගශීලි බවෙහි අනුසස් සිහි කිරීම.
6. **දේවතානුස්සති** - දෙවියන් සාක්ෂ්‍යස්ථානයෙහි තබා ගෙන තමා තුළ පවතින ශ්‍රද්ධා ආදි ඉන්ද්‍රිය ධර්මයන්ගේ අනුසස් සිහි කිරීම.
7. **උපසමානුස්සති** - නිර්වාණධාතුවෙහි ගුණ සිහිපත් කිරීම.
8. **කායගතාසති** - තම සිරුරෙහි තිබෙන දෙතිස් කුණපයන්ගේ පිළිකුල් බව සිහි කිරීම.
9. **මරණානුස්සති** - ජීවිතයෙහි අනියත බවත් මරණයෙහි නියත බවත් සිහි කිරීම.
10. **ආනාපානසති** - ආශ්වාස-ප්‍රශ්වාස දෙක අනුව සිහිය පිහිටුවා ගැනීම.

- <u>සතර බ්‍රහ්මවිහාර</u>

1. **මෙත්තා** - සියලු සත්ත්වයන් කෙරෙහි වෛර රහිත, ක්‍රෝධ රහිත බව ඇති කර ගනිමින් මෛත්‍රිය පැතිරවීම.
2. **කරුණා** - සියලු සත්ත්වයන් කෙරෙහි දුක් රහිත බව කැමති වෙමින් කරුණාව පැතිරවීම.

3. මුදිතා - සියලු සත්ත්වයන් පිළිබඳ ඔවුන්ගේ සැපතෙහි ඊර්ෂ්‍යා නො කරමින් අවංක ව ම සතුටු වීම් වශයෙන් මුදිතාව පැතිර වීම.

4. උපේක්ඛා - සියලු සත්ත්වයන් කෙරෙහි ඇලීමක් හෝ ගැටීමක් නැති ව හිතවත් අහිතවත් සියලුදෙනා කෙරෙහි මැදහත් ව බැලීම් වශයෙන් සෑමදෙනා ම කර්මය ස්වකීය කොට ඇති බව මෙනෙහි කිරීම.

- <u>සතර අරූප</u>

1. ආකාසානඤ්චායතනය - අනන්ත වූ ආකාශ ප්‍රඥප්තිය අනුව මෙනෙහි කරමින් ඇති කර ගන්නා ප්‍රථම අරූප සමාපත්තිය.
2. විඤ්ඤාණඤ්චායතනය - අනන්ත වූ ආකාශය අරමුණු කෙරෙන සිත හෙවත් ප්‍රථම අරූප-විඤ්ඤාණය අනන්ත වශයෙන් මෙනෙහි කිරීම.
3. ආකිඤ්චඤ්ඤායතනය - ප්‍රථම අරූප - විඤ්ඤාණය (ආකාසානඤ්චායතන - සිත) මෙනෙහි <u>නො කරමින්</u> එම විඤ්ඤාණය නැති බව මෙනෙහි කිරීම.
4. නේවසඤ්ඤානාසඤ්ඤායතනය - සංඥාවක් ඇත්තේත් නැති නැත්තේත් නැති තරමට සියුම් වූ ද තෘතීය අරූප විඤ්ඤාණය (ආකිඤ්චඤ්ඤායතනය) ශාන්ත, ප්‍රණීත වශයෙන් මෙනෙහි කිරීමෙන් ලැබෙන ඉතා සියුම් වූ සමාපත්තිය.

❖ ඉහත දැක්වූ කර්මස්ථාන සියල්ලේ එකතුව **38** කි.

*39.* ආහාරේ පටික්කුලසඤ්ඤාව - ‘කබළීකාරාහාරය’ (අනුභව කරන ආහාරය) පිළිකුල් වශයෙන් නුවණින් සිහි කිරීම.

*40.* ධාතුමනසිකාරය - ශරීරයෙහි පවතින පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ධාතූන් අනුව නුවණින් මෙනෙහි කිරීම.

මෙම සතළිස් කර්මස්ථාන අතුරෙන් කායගතාසතිය හා ආනාපානසතිය හැර සෙසු <u>අනුස්සති අට</u> ද ආහාරයෙහි පිළිකුල්සංඥව ද ධාතුමනසිකාරය ද යන කර්මස්ථාන දහය, උපචාර-සමාධිය (ප්‍රථමධ්‍යානයට ඉතා ආසන්න සමාධිමත් බවක්) පමණක් ලබා දෙයි. අර්පණා-ධ්‍යාන (රූපාවචර, අරූපාවචර-සමාධි) මෙම දහයෙන් නො ලැබේ. පඨවි-කසිණය ආදි සෙසු කර්මස්ථාන තිහ අර්පණා-ධ්‍යාන ද ලබා දෙයි.

අර්පණා (රූපාවචර, අරූපාවචර) සමාධි ලබා දෙන කර්මස්ථාන තිහ අතරින් දස කසිණ හා ආනාපානසති යන කර්මස්ථාන එකොළසෙන් රූපාවචර ධ්‍යාන සතර ලැබේ. දස අසුභ හා කායගතාසති යන කර්මස්ථාන එකොළසෙන් ප්‍රථමධ්‍යානය ලැබේ. මුල් බ්‍රහ්මවිහාර තුන වන මෙත්තා - කරුණා - මුදිතා යන කර්මස්ථානයන්ගෙන් ප්‍රථම - ද්විතීය - තෘතීයධ්‍යාන තුන පමණක් ලැබේ. උපේක්ඛා බ්‍රහ්මවිහාරය හා අරූපාවචර සමාපත්ති හතර, චතුර්ථධ්‍යානය පමණක් ලබා දේ. (අරූපාවචර සමාපත්ති හතර, ධ්‍යානාංග වශයෙන් සලකන කල්හි රූපාවචර චතුර්ථධ්‍යානයේ අංගවලින් යුතු වන බැවින් මෙසේ දක්වන ලදී.) මෙහි දී රූපාවචර ධ්‍යාන පිළිබඳ ව දක්වන ලද්දේ 'චතුෂ්ක' නය ක්‍රමයට ය.

# 3. දිට්ඨිවිසුද්ධි

මුලින් සමථය වඩා අනතුරු ව විදර්ශනාවට යොමු වන යෝගාවචරයාට ඉහත සඳහන් කර්මස්ථාන අතුරින් චරිතානුකූල කර්මස්ථානයක් පාදක කර ගෙන උපචාර - අර්පණා සමාධීන් ලබා ගෙන අනතුරු ව විදර්ශනාවට යොමු විය හැකි ය. එය 'සමථපූර්වාඞ්ගම විදර්ශනා' ක්‍රමය යි. එසේත් නැති නම් උපචාර - අර්පණා සමාධීන් සමථ වශයෙන් දියුණු නො කොට, සතර සතිපට්ඨානයට අනුගත වන ලෙස මනා සිහි - නුවණින් යුතු වෙමින් රූප හා නාම ධර්ම පරිග්‍රහ කරමින් (නුවණින් සම්මර්ශනය කරමින්) ද යෝගාවචරයාට විදර්ශනාවට යොමු විය හැකි ය. එය 'ශුද්ධ-විදර්ශනා' ක්‍රමය යි. (මෙහි දී පූර්වයෙන් සමථ වශයෙන් සමාධිය දියුණු නො කළ ද ස්කන්ධ - ධාතු - ආයතන - පටිච්චසමුප්පාද ධර්ම විදර්ශනා නුවණින් සම්මර්ශනය කරන යෝගාවචරයා තුළ නීවරණ සන්සිඳී යාම නිසා සමාධිමත් බවක් ඇති වේ.) මෙලෙස <u>විදර්ශනා භූමියට</u> අවතීර්ණ වන යෝගාවචරයා විසින් ප්‍රථමයෙන් ම සපුරා ගත යුත්තේ <u>දිට්ඨිවිසුද්ධිය</u> යි. පෘථග්ජනයන් විසින් 'සත්ත්වයා' - 'පුද්ගලයා' - 'මම' - 'ආත්මය' වශයෙන් වරදවා ග්‍රහණය කර ගෙන තිබෙන්නේ <u>විසිඅටක්</u> වූ රූප ධර්ම සහ <u>තෙපනස්</u> නාම ධර්ම (<u>දෙපනස්</u> චෛතසික සහ විඤ්ඤාණය) පමණි. මෙම නාම-රූප ධර්ම තුළ පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ ආත්මයක් ඇතැ'යි කියා වරදවා ගැනීම වැරදි දෘෂ්ටියකි. එම වැරදි දෘෂ්ටිය දුරු කර ගනිමින්, තමා තුළ පවතින නාම-රූප ධර්ම නුවණින් වෙන් කර ගෙන එම නාම-රූප ධර්ම තුළ 'සත්ත්ව' - 'පුද්ගල' - 'ආත්ම' - 'මම' වශයෙන් ගත හැකි කිසිවක් නැති බව මනා නුවණින් වටහා ගෙන, 'සත්ත්ව' දෘෂ්ටිය ඉක්මවා යමින් නාම-රූප පිළිබඳ ව යථාවබෝධය ඇති කර ගැනීම <u>දිට්ඨිවිසුද්ධිය</u> යි.

නාම-රූප ධර්මයන්ගේ යථාස්වභාවය නුවණින් සැලකීමෙහි යෙදෙන යෝගාවචරයා අටවිසි රූප සහ තෙපනස් නාම ධර්මයන්ගේ ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන යන කරුණු පිළිබඳ ව අවබෝධ කර ගත යුතු ය.

1. **ලක්ඛණ** :-'පච්චත්තලක්ඛණ' හෙවත් නාම-රූප ධර්මයන්ගේ ස්වභාව-ලක්‍ෂණ අවබෝධ කර ගැනීම. උදාහරණයක් ලෙස පඨවිධාතුව ගත් කල්හි එහි තද - මොළොක් - රළු - සිනිඳු - බර - සැහැල්ලු වශයෙන් ලක්‍ෂණ හයක් ඇත. එම ස්වභාවයන් පඨවිධාතුවේ **'පච්චත්තලක්ඛණ'** හෙවත් ස්වභාව ලක්‍ෂණයෝ ය.
2. **රස** :-නාම-රූප ධර්මයන්ගේ කෘත්‍යයන් අවබෝධ කර ගැනීම.
3. **පච්චුපට්ඨාන** :-නාම-රූප ධර්ම සිතට වැටහෙන ආකාරය නුවණින් සැලකීම.
4. **පදට්ඨාන** :-නාම-රූප ධර්මයන්ට ආසන්න කරුණු අවබෝධ කර ගැනීම.

මෙලෙස නාම-රූප ධර්ම නුවණින් වෙන් කර ගෙන දකින යෝගාවචරයාට එම නාම-රූප ධර්ම වනාහි සත්ත්ව, පුද්ගල, ආත්ම නො වන හුදෙක් හේතු-ඵල ධර්ම මාත්‍රයක් ම බව අවබෝධ වේ. නාමයත් - රූපයත් එකිනෙකින් වෙන් කර ගෙන නුවණින් දකින යෝගාවචරයා එම නාම-රූප ධර්ම පිළිබඳ ව අවබෝධ කර ගනු ලබන්නේ කොරාගේ (පිළාගේ) සහ අන්ධයාගේ උපමාවට අනුව ය. ඒ මෙසේ යි. එනම්, දෑස නො පෙනෙන අන්ධයෙක් සහ ඇවිද යා නො හැකි කොරෙක් ඔවුනොවුන් කතිකා කර ගෙන ඔවුනොවුන්ගේ උපකාරයෙන් අවශ්‍ය තැනට ගියහ. ඇවිද යා නො හැකි කොරාව තම පිට මත හිඳුවා ගත් අන්ධයා, තමාගේ දෑස නො පෙනුණු ද කොරාගේ මග පෙන්වීම අනුව නිවැරදි ලෙස ගමන් කළේ ය. මෙම උපමාව අනුව රූප ධර්ම අන්ධයා බඳු ය. අරමුණු දැනගැනීමේ හැකියාවක් රූපයට නැත. නාම ධර්ම (චිත්ත, චෛතසික ධර්ම) කොරා බඳු ය. නාම ධර්මයන්ට අරමුණු දැනගත හැකි වුව ද ගමනාදි ඉරියවු පැවැත්වීම කළ නො හැක. නාම ධර්මයන්ගේ මෙහෙයවීම මත රූපය ඉරියවු පැවැත්වීමාදිය සිදු කරන්නේ කොරාගේ මෙහෙයවීම අනුව අන්ධයා ගමන්

කරන්නාක් මෙනි. මෙලෙස 'රුප්පනය' වන (වහා වෙනස් වන) ලක්ෂණයෙන් යුතු දේ රූපය වශයෙනුත් අරමුණට නැමෙන ලක්ෂණයෙන් යුතු චිත්ත, චෛතසික ධර්ම නාමය වශයෙනුත් පැහැදිලි ලෙස නුවණින් වෙන් කර ගැනීමෙන් (නාම-රූප ධර්ම තුළ සත්ත්ව, පුද්ගල, ආත්ම වශයෙන් ගත හැකි කිසිවක් නැති බව වටහා ගැනීමෙන්) වැරදි දෘෂ්ටීන් බැහැර වී ගොස් දිට්ඨිවිසුද්ධිය ඇති වේ. රථයක අවයව වෙන් කළ කල්හි පරමාර්ථ වශයෙන් රථයක් දක්නට නො ලැබෙන අතර රථයේ කොටස් සියල්ල මනා ව ගැළපූ කල්හි පමණක් 'රථය' යන ව්‍යවහාරය යෙදේ. එලෙසින් ම නාමරූපපරිච්ඡේදඤාණය ඇති කර ගත් යෝගාවචරයාට නාම-රූප ධර්ම තුළ පරමාර්ථ වශයෙන් සත්ත්වයෙකු නැති බව මැනවින් අවබෝධ වේ.

**(1) "යථාහි අඞ්ගසම්භාරා**
**හෝති සද්දෝ රථෝ ඉති,**
**ඒවං ඛන්ධේසු සන්තේසු**
**හෝති සත්තෝති සම්මුති."**

නානාවිධ අවයව සමූහයක් එකට ගැළපූ කල්හි 'රථය'ය යන ව්‍යවහාරය (සම්මුතිය - ප්‍රඥප්තිය) යෙදෙන්නේ යම් සේ ද එසේ ම ස්කන්ධයන් ඇති කල්හි 'සත්ත්වයා'ය යන ව්‍යවහාරය යෙදේ.

**(2) "දුක්ඛමේවහි සම්භෝති**
**දුක්ඛං තිට්ඨති වේති ච,**
**නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භෝති**
**නාඤ්ඤත්‍ර දුක්ඛා නිරුජ්ඣතී."**

මෙහි හටගන්නේ දුකක් ම ය. (සත්ත්වයෙක් නො වේ!) පවතින්නේත් නැති ව යන්නේත් දුකක් ම ය. දුක හැර අන් කිසිවක් මෙහි පහළ නො වේ. දුක හැර අන් කිසිවක් මෙහි නිරුද්ධ නො වේ.

*(භික්ඛුනීසංයුත්තයේ - වජිරා සූත්‍රය)*

මෙලෙස නාම-රූප ධර්මයන්ගේ යථාස්වභාවය නුවණින් වටහා ගත් යෝගාවචරයා තුළ ශාශ්වත දෘෂ්ටිය ('සදාතනික ආත්මයක් ඇතැ'යි කියා වරදවා ගත් දෘෂ්ටිය) මෙන් ම උච්ඡේද දෘෂ්ටිය ('සත්ත්වයා මරණින් මතු විනාශ වී යන්නේ ය' යි කියා වරදවා ගත් දෘෂ්ටිය) බඳු වැරදි දෘෂ්ටි පහළ නො වේ. (මෙහි දී වැරදි දෘෂ්ටීන් දුරු වී යන්නේ සමුච්ඡේද වශයෙන් නොව තදඞ්ග වශයෙනි.) මෙලෙස ශාශ්වත, උච්ඡේද, සත්ත්ව, ආත්මාදි වැරදි දෘෂ්ටීන්ගෙන් සිත මුදවා ගනිමින් නාම-රූප ධර්මයන්ගේ යථාස්වභාවය (ලෞකික වශයෙන්) අවබෝධ කර ගෙන දෘෂ්ටිය පිරිසිදු කර ගැනීම <u>දිට්ඨිවිසුද්ධිය</u> යි.

දිට්ඨිවිසුද්ධිය ඇති කර ගැනීමෙන් 'නාමරූපපරිච්ඡේදඤාණය' (නාම - රූප පිළිබඳ ව මූලික වශයෙන් අවබෝධ කර ගැනීමේ නුවණ) සම්පූර්ණ වීම සිදු වන අතර මෙය 'නාමරූපවවත්ථාන' - 'සඞ්ඛාරපරිච්ඡේදඤාණ' යන නම්වලින් ද හැඳින්වේ. දිට්ඨිවිසුද්ධිය අයත් වන්නේ 'ඤාතපරිඤ්ඤා' හෙවත් නාම-රූප ධර්ම පිළිබඳ ස්වභාව-ලක්ෂණ (පච්චත්තලක්ඛණ) වටහා ගැනීමේ අවබෝධයට ය.

# 4. කඞ්ඛාවිතරණවිසුද්ධි

දිට්ඨිවිසුද්ධිය සම්පූර්ණ කර ගත් යෝගාවචරයා විසින් ඤාතපරිඤ්ඤාවේ මීළඟ අදියර වන කඞ්ඛාවිතරණවිසුද්ධිය සම්පූර්ණ කර ගැනීමට වෑයම් කළ යුතු ය. නාම-රූප ධර්මයන් හටගැනීම සඳහා මුල් වන හේතු-ප්‍රත්‍යයයන් පිළිබඳ ව මනා ව අවබෝධ කර ගනිමින් අතීත - වර්තමාන - අනාගත යන කාලත්‍රය පිළිබඳ සැක දුරු කර ගැනීම <u>කඞ්ඛාවිතරණවිසුද්ධිය</u> යි. නාම-රූප ධර්ම 'සත්ත්ව' - 'පුද්ගල' - 'ආත්ම' වශයෙන් වරදවා ගත් පෘථග්ජනයා තුළ, 'මම අතීතයෙහි සිටියෙම් ද? නැතහොත් නො සිටියෙම් ද? මම මරණින් මතු අනාගතයෙහි වන්නෙම් ද? නැතහොත් නො වන්නෙම් ද? දැන් සිටින්නේත් පෙර සිටි මම ද නැතහොත් අනෙකෙක් ද? මරණින් මතු සත්ත්වයෙක් සිටියි ද?' යනාදි වශයෙන් සත්ත්වයා පිළිබඳ ව නොයෙක් ආකාර වූ සැක පවතී. තමා තුළ සත්ත්වයෙකු හෝ පුද්ගලයෙකු හෝ ආත්මයක් වශයෙන් ගත හැකි පැවැත්මක් නැති බවත් ඇත්තේ හුදෙක් ම නාම-රූප දෙකෙහි හේතු - ඵල පැවැත්ම පමණක් බවත් මැනවින් අවබෝධ කර ගෙන දිට්ඨිවිසුද්ධිය ඇති කර ගත් යෝගාවචරයා එම නාම - රූප ධර්ම හටගැනීමට හේතු වූ ප්‍රත්‍යයයන් පිළිබඳ ව අනතුරු ව නුවණින් විමසා බැලිය යුතු ය.

නාම-රූප ධර්මයන්ගේ හේතු-ඵල සම්බන්ධතාව වටහා ගත යුත්තේ පටිච්චසමුප්පාදයට අනුව ය. අවිද්‍යාව නිසා සංස්කාර (කුසලාකුසල කර්ම) ද සංස්කාර නිසා විඤ්ඤාණය (පටිසන්ධි) ද විඤ්ඤාණය නිසා නාම - රූප ද නාම - රූප නිසා සළායතන ද සළායතන නිසා ස්පර්ශය ද සපර්ශය නිසා විඳීම ද විඳීම නිසා තණ්හාව ද තණ්හාව නිසා උපාදානය ද උපාදානය නිසා භවය (කර්ම) ද භවය නිසා උපත ද උපත නිසා ජරාමරණ ද ඇති වන බව පටිච්චසමුප්පාදයට අනුව නුවණින් විමසන යෝගාවචරයාට අතීත හේතූන් නිසා වර්තමාන ඵල ද වර්තමාන හේතූන් නිසා අනාගත ඵල ද හටගන්නා බවත් වර්තමාන හේතූන්ගේ අභාවයෙන් අනාගත ඵල නිරුද්ධ වන බවත් මනා ව අවබෝධ වේ. මෙම අවබෝධය ඇති කර ගත් යෝගාවචරයාට නාම-රූප ධර්ම පිළිබඳ අතීත - අනාගත -

වර්තමාන යන කාලත්‍රය ගැන සැක දුරු වී යයි. බුද්ධාදි අට තැන් පිළිබඳ සැක ද (තාවකාලික ව) සන්සිඳීමට පත් වේ. සංස්කාරයන්ගේ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණය පිළිබඳ ව ද සැකයක් ඇති නො වේ. මෙහි දී නාම-රූප ධර්ම පිළිබඳ සැක දුරු වී යන්නේ සමුච්ඡේද වශයෙන් නොව තදඞ්ග වශයෙනි. මෙසේ පඤ්ච-උපාදනස්කන්ධ (නාම-රූප) පිළිබඳ ව පටිච්චසමුප්පාදයට අනුව නුවණින් දකිමින් අතීත - වර්තමාන - අනාගත - ආධ්‍යාත්මික - බාහිර ධර්ම පිළිබඳ ව හේතු ප්‍රත්‍යයයන් මැනවින් අවබෝධ කර ගනිමින් සැක දුරු කර ගැනීම <u>කඞ්ඛාවිතරණවිසුද්ධිය</u> යි. එය 'යථාභූතඤාණ', 'සම්මාදස්සන' යන නම්වලින් ද හැඳින්වෙන අතර මෙම ඥානය ද 'ඤාතපරිඤ්ඤා' හෙවත් නාම-රූප ධර්ම පිළිබඳ ස්වභාව-ලක්ෂණ (පච්චත්තලක්ඛණ) වටහා ගැනීමේ අවබෝධයට අයත් වේ.

<u>කඞ්ඛාවිතරණවිසුද්ධිය</u> සම්පූර්ණ කර ගත් යෝගාවචරයාව <u>'චූල්ලසෝතාපන්න'</u> නමින් පුරාණ ආචාර්යවරයන් විසින් හඳුන්වනු ලැබ ඇත. මෙම අවස්ථාවට පත් යෝගාවචරයා කලුරිය කරන්නේ නම් ඒකාන්තයෙන් ම සුගතිගාමී වේ. එමෙන් ම මෙම යෝගාවචරයා මෙතැන් පටන් ඉදිරියට නව මහාවිදර්ශනාඥාන උපදවා ගැනීමටත් එසේ ම ප්‍රමාණවත් හේතූන් ඇති කල්හි මාර්ග-ඵල ලැබීමටත් සුදුසුකම් ලබයි.

## 5. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි

කඞ්ඛාවිතරණවිසුද්ධිය සම්පූර්ණ කර ගත් යෝගාවචරයා අනතුරු ව විදර්ශනා භාවනාව දියුණු කර ගෙන යාමෙහි දී සිතට අරමුණු වන ආලෝකය, ප්‍රීතිය බඳු තත්ත්වයන් නිසා 'මාර්ග-ඵල ලැබුවෙමි'යි කියා මුළා විය හැකි ය. එසේ මුළා නො වී සැබෑ ලෙස ම මාර්ග - ඵල ලැබෙන පරිදි විදර්ශනා භාවනාව ඉදිරියට සම්පූර්ණ කර ගෙන යාම සඳහා නිවැරදි මග කුමක් ද්'යි කියා අවබෝධ කර ගැනීම, <u>මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය</u> යි. සඞ්ඛාරපරිච්ඡේදඤාණයෙන් දිට්ඨිවිසුද්ධියත් පච්චයපරිග්ගහඤාණයෙන් කඞ්ඛාවිතරණවිසුද්ධියත් ඇති කර ගත් යෝගාවචරයා විසින් 'ඤාතපරිඤ්ඤා' හෙවත් සංස්කාර ධර්මයන්ගේ ස්වභාව ලක්ෂණ පිළිබඳ අවබෝධය සම්පූර්ණ කර ගන්නා ලද්දේ වෙයි. 'ඤාතපරිඤ්ඤාව' සම්පූර්ණ කර ගත් යෝගාවචරයාට මාර්ගය හා අමාර්ගය (මග - නො මග) පිළිබඳ ඥානය ඇති වන්නේ අනතුරු ව ඇති 'තීරණපරිඤ්ඤාවට' එළැඹීමෙනි. ලෞකික 'පරිඤ්ඤා' තුනක් තිබේ. ('පරිඤ්ඤා' යනු පිරිසිඳ අවබෝධ කිරීම, සම්පූර්ණ ලෙස අවබෝධ කර ගැනීම යන අර්ථය යි.)

**1. ඤාතපරිඤ්ඤා :-** නාම-රූප ධර්මයන්ගේ ස්වභාව-ලක්ෂණ (පච්චත්තලක්ඛණ) අවබෝධ කර ගැනීමේ ඥානය. එනම්, 'රූප්පන හෙවත් වහා වෙනස් වනසුලු බව රූපයේ ලක්ෂණය යි. අරමුණෙහි රස විඳීම වේදනාවන්ගේ ලක්ෂණය යි' යනාදි වශයෙනි. සඞ්ඛාරපරිච්ඡේදඤාණයේ (නාමරූපපරිච්ඡේදඤාණයේ) පටන් පච්චයපරිග්ගහඤාණය දක්වා අයත් වන්නේ 'ඤාතපරිඤ්ඤා' භූමියට යි.

**2. තීරණපරිඤ්ඤා :-** නාම-රූප ධර්මයන්ගේ ත්‍රිලක්ෂණය (සාමඤ්ඤලක්ඛණ) අවබෝධ කර ගැනීමේ ඥානය. එනම්, 'රූපය අනිත්‍යය ය - වේදනා අනිත්‍යය ය' යනාදි වශයෙනි. කලාපසම්මසනඤාණයේ (නයවිපස්සනා) පටන් උදයබ්බයානුපස්සනාඤාණය දක්වා අයත් වන්නේ 'තීරණපරිඤ්ඤා' භූමියට යි.

**3. පහානපරිඤ්ඤා :-** නාම-රූප ධර්ම පිළිබඳ නිත්‍යසංඥා ආදිය දුරු කිරීම් වශයෙන් ඇති වන විදර්ශනාඥාන. භඞ්ගානුපස්සනාඤාණයේ පටන් ඉහළට (ලෝකෝත්තර මාර්ගඥාන ලැබීම තෙක්) 'පහානපරිඤ්ඤා' භූමිය යි. මෙයට උදයබ්බයඤාණයේ උපරිම අර්ධය ද ඇතුළත් බව ඇතැම් ආචාර්යවරු අදහස් දක්වති.

මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය ඇති කර ගැනීම සඳහා යෝගාවචරයා විසින් 'කලාපසම්මසන' හෙවත් 'නයවිපස්සනා' ක්‍රමයට විදර්ශනා වැඩීම ආරම්භ කළ යුතු ය. මෙහි දී 'කලාපසම්මසන' හෙවත් 'නයවිපස්සනා' භාවනා ක්‍රමය ලෙස හැඳින්වෙන්නේ අතීත - වර්තමාන - අනාගත යන තුන් කාලයට අයත් විවිධ ආකාරයේ සංස්කාර ධර්මයන් සමස්තයක් වශයෙන් ගෙන එම සංසකාරයන්ගේ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ලක්ෂණ වටහා ගැනීම යි. එනම් රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන ස්කන්ධ පස,

1. අතීත
2. අනාගත
3. වර්තමාන
4. ආධ්‍යාත්මික (අජ්ඣත්ත)
5. බාහිර (බහිද්ධා)
6. රළු (ඕළාරික)
7. සියුම් (සුඛුම)
8. පහත් (හීන)
9. උසස් (පණීත)
10. දුර
11. ළඟ

යන එකොළොස් ආකාරය අනුව අරමුණු කර ගෙන සංස්කාර ධර්ම අනිත්‍ය - දුක්ඛ - අනාත්ම වශයෙන් විදර්ශනාවට නැංවීම 'කලාපසම්මසන' ක්‍රමය හෙවත් 'නයවිපස්සනාව' යි. එම අවබෝධයෙහි පිහිටා තව දුරටත් පටිච්චසමුප්පාදයට අනුව හා ස්කන්ධ වශයෙන් අරමුණු කරමින් සංස්කාර ධර්මයන් අනිත්‍ය - දුක්ඛ - අනාත්ම වශයෙන් විදර්ශනාවට නංවා බැලිය යුතු ය.

අනතුරු ව පඤ්ච-උපාදනස්කන්ධයන්ගේ සාමාන්‍ය-ලක්ෂණ වන අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණය

මැනවින් අවබෝධ කර ගැනීම සඳහා මහාචත්තාළීසාකාර විපස්සනා භාවනා ක්‍රමය භාවිත කළ හැකි බව විසුද්ධිමග්ග ග්‍රන්ථයෙහි සඳහන් වේ. චත්තාළීසාකාර විපස්සනා භාවනාව යනු අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ලක්‍ෂණ තුන සතළිස් ආකාරයකින් විස්තර වශයෙන් නුවණින් දැකීම යි. පඤ්ච-උපාදනස්කන්ධයන්හි මෙම ආදීනව සතළිස ම දක්නට ලැබේ.

## චත්තාළීසාකාර විපස්සනා භාවනාව

**1. අනිච්චතෝ** - **අනිත්‍ය වශයෙන් දැකීම:-**

රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන පඤ්ච-උපාදනස්කන්ධ වනාහි වහා හටගෙන බිඳී යන බැවින් ද ස්ථිර ව නො පවත්නා බැවින් ද හටගැනීමක් අවසානයක් ඇති බැවින් ද අනිත්‍ය ය.

**2. දුක්ඛතෝ** - **දුක් වශයෙන් දැකීම:-**

නාම (වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ), රූප (පඨවී, ආපෝ, තේජෝ, වායෝ) ධර්මයන් නිරන්තරයෙන් ඇති ව නැති වෙමින් සත්ත්වයා පෙළන බැවින් ද දුකට ම හේතු වී පවතින බැවින් ද දුක් ය.

**3. රෝගතෝ** - **රෝගයක් වශයෙන් දැකීම:-**

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි නොයෙක් ප්‍රත්‍යයයන්ගෙන් සන්සිඳුවා ගත යුතු රෝගයක් බඳු නිසා ද රෝගයන්ට වස්තුවක් බැවින් ද රෝගයක් බඳු ය.

**4. ගණ්ඩතෝ** - **ගඬුවක් (පිළිකාවක්) වශයෙන් දැකීම:-**

වේදනා ගෙන දෙන බැවින් ද කෙලෙස් නමැති සැරව වැගිරෙන බැවින් ද හටගැනීම් - දිරීම් - බිඳීම් සහිත බැවින් ද පඤ්ච-උපාදනස්කන්ධ ගඬුවක් බඳු ය.

**5. සල්ලතෝ** - **උලක් වශයෙන් දැකීම:-**

ඇතුළත විදින (උලක්) බඳු ව පීඩා ගෙන දෙන බැවින් ද බැහැර කිරීමට දුෂ්කර බැවින් ද පඤ්ච-උපාදනස්කන්ධ උලක්

බඳු ය.

**6. අසතෝ - විපතක් හා පාපයක් වශයෙන් නුවණින් දැකීම:-**

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි ආදීනව බහුල බැවින් ගර්හා කළ යුත්තකි. එමෙන් ම අයහපත, නපුර, පරිහානිය කැඳවන බැවින් ද විපත්වලට හා පාපයට තෝතැන්නක් ව පවතින බැවින් ද 'අඝ' ය.

**7. ආබාධතෝ - ආබාධයක් වශයෙන් නුවණින් දැකීම:-**

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි අනුන් විසින් රැක බලා ගත යුතු රෝගියෙකු මෙන් තමන්ට අවසඟ ව පවතින බැවින් ද රෝගාබාධයන්ට වස්තුවක් බැවින් ද ආබාධයක් බඳු ය.

**8. පරතෝ - අනුන් සතු දේ වශයෙන් නුවණින් දැකීම:-**

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි තමාගේ වසඟයෙහි නො පවතින බැවින් ද තමාට යටහත් ව නො පවතින බැවින් ද 'පර' ය.

**9. පලෝකතෝ - බිඳී යන දේ වශයෙන් නුවණින් දැකීම:-**

ව්‍යාධි - ජරා - මරණ ආදියෙන් පඤ්ච-උපාදනස්කන්ධ බිඳී යන බැවින් 'පලෝක' ය.

**10. ඊතිතෝ - ව්‍යසන වශයෙන් නුවණින් දැකීම:-**

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි අනේකවිධ විපත් - ව්‍යසන ගෙන දෙන බැවින් 'ඊති' ය.

**11. උපද්දවතෝ - උපද්‍රව වශයෙන් නුවණින් දැකීම:-**

මහත් වූ අනර්ථ සිදු කරන බැවින් ද සියලු උපද්‍රවයන්ට වස්තු වන බැවින් ද පඤ්ච-උපාදනස්කන්ධයෝ 'උපද්‍රවයෝ' ය.

**12. භයතෝ - භය වශයෙන් නුවණින් දැකීම:-**

සියලු භීතීන්ට ආකරයක් බැවින් ද සියලු දුක්වල නිරෝධය වන නිවනට ප්‍රතිපක්ෂ බැවින් ද පඤ්ච-

උපාදනස්කන්ධ 'භය' ය.

**13. උපසග්ගතෝ - අන්තරායක්, දෝෂයක් වශයෙන් නුවණින් දැකීම:-**

නොයෙක් අනර්ථ ලුහුබඳින නිසා ද දෝෂයන්ගෙන් ගහණ බැවින් ද පඤ්ච-උපාදනස්කන්ධයෝ 'උපසග්ගයෝ' ය.

**14. චලතෝ - සැලෙන දේ වශයෙන් නුවණින් දැකීම:-**

ජරා - ව්‍යාධි - මරණයන්ගෙන් මෙන් ම ලාභ - අලාභාදි ලෝක ධර්මවලින් පඤ්ච-උපාදනස්කන්ධ නිතර සැලෙන, වෙනස් වන බැවින් 'චල' ය.

**15. පභඞ්ගුතෝ - බිඳෙන දේ වශයෙන් නුවණින් දැකීම:-**

බාහිර උපක්‍රම ආදියෙන් හා ස්වභාවයෙන් ම බිඳෙනසුලු බැවින් පඤ්ච-උපාදනස්කන්ධ 'පභඞ්ගු' ය.

**16. අද්ධුවතෝ - අස්ථිර දේ වශයෙන් නුවණින් දැකීම:-**

සියලු අවස්ථාවල ම වෙනස් වන බැවින් ද ස්ථිර භාවයක් නැති බැවින් ද පඤ්ච-උපාදනස්කන්ධ 'අද්ධුව' ය.

**17. අත්තාණතෝ - අනාරක්ෂිත දේ වශයෙන් නුවණින් දැකීම:-**

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි සත්ත්වයන්ව ජාති - ජරා - මරණ ආදි සසර දුකින් රැක ගැනීමට සමත් නො වේ. පඤ්ච-උපාදනස්කන්ධ පවතින තෙක් සත්ත්වයන්ට ක්ෂේම භාවයක්, නිර්භයභාවයක් නොමැති බැවින් ස්කන්ධයෝ 'අත්තාණ' වෙත්.

**18. අලේණතෝ - ආරක්ෂිත ස්ථානයක් නො වේ ය'යි නුවණින් දැකීම:-**

ඇලීමට නුසුදුසු බැවින් ද ආරක්ෂාවක් සොයන සත්ත්වයන්ට ආරක්ෂිත ස්ථානයක් නො වන බැවින් ද ස්කන්ධයෝ 'අලේණ' වෙත්.

**19. අසරණතෝ - පිහිටක් නැති දේ වශයෙන් නුවණින් දැකීම:-**

ස්කන්ධයන් ඇසුරු කරන්නා වූ සත්ත්වයන්ට එයින් කිසි පිහිටක් නැති බැවින් පඤ්ච-උපාදනස්කන්ධ 'අසරණ' ය.

**20. රිත්තතෝ - හිස් දේ වශයෙන් නුවණින් දැකීම:-**

සත්ත්වයන් විසින් වරදවා සලකනු ලබන්නා වූ නිත්‍ය - සුභ - සුඛ - ආත්මභාවයන්ගෙන් පඤ්ච-උපාදානස්කන්ධ හිස් බැවින් 'රිත්ත' ය.

**21. තුච්ඡතෝ - තුච්ඡ වශයෙන් නුවණින් දැකීම:-**

හිස් බැවින් මෙන් ම සාරත්වයෙන් අල්ප බැවින් ස්කන්ධයෝ 'තුච්ඡ' වෙත්.

**22. සුඤ්ඤතෝ - ශූන්‍ය වශයෙන් නුවණින් දැකීම:-**

ස්වාමි - නිවාසී - කාරක - වේදක - අධිට්ඨායක ආදි වශයෙන් කිසිවෙක් පඤ්ච-උපාදානස්කන්ධ තුළ නැති බැවින් ද ආත්මීය ස්වභාවයෙන් හිස් බැවින් ද 'ශූන්‍ය' ය.

**23. අනත්තතෝ - අනාත්ම වශයෙන් නුවණින් දැකීම:-**

'තමා' ය, 'ආත්මය' ය වශයෙන් ස්වාමීත්වයකින් ගත යුතු කිසිවක් නැති බැවින් පඤ්ච-උපාදානස්කන්ධ 'අනාත්ම' ය.

**24. ආදීනවතෝ - ආදීනව (දෙස්) දැකීම් වශයෙන් නුවණින් දැකීම:-**

පඤ්ච-උපාදානස්කන්ධයන්ගේ පැවැත්ම දුක් සහිත බැවින් ද දිළිඳුභාවයෙන් යුක්ත බැවින් ද ආදීනව සහිත ය.

**25. විපරිණාමධම්මතෝ - පෙරළෙන (වෙනස් වන) ස්වභාවයෙන් යුතු දේ වශයෙන් නුවණින් දැකීම:-**

ජරාවට පත් වීම් වශයෙන් ද මරණයට පත් වීම් වශයෙන් ද ස්කන්ධයන් වහා පෙරළෙන ස්වභාවයෙන් යුතු ය.

**26. අසාරකතෝ - සාරයක් නැති දේ වශයෙන් නුවණින් දැකීම:-**

දුර්වල ගසක එළය මෙන් පහසුවෙන් බිඳී යන බැවින් පඤ්ච-උපාදානස්කන්ධ 'අසාරක' ය.

**27.** අසමූලතෝ - ව්‍යසනයන්ට හා පාපයන්ට මුල් වූ දේ වශයෙන් නුවණින් දැකීම:-

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි සියලු ව්‍යසනයන්ට හා පාපයන්ට මුල් වන බැවින් 'අඝමූල' ය.

**28.** වධකතෝ - වධකයන් වශයෙන් නුවණින් දැකීම:-

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි මිතුරු විලාශයෙන් පැමිණෙන සතුරෙකු මෙන් පඤ්ච-උපාදනස්කන්ධ කෙරෙහි විශ්වාසය තැබූවන්ව එම ස්කන්ධයන් විසින් ම ජරා - මරණාදියෙන් නසා දමන බැවින් ස්කන්ධයෝ 'වධකයෝ' ය.

**29.** විභවතෝ - විනාශයක් ලෙස නුවණින් දැකීම:-

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි සත්ත්වයන්ට අභිවෘද්ධියක් නොව විනාශය ම ගෙන දෙන නිසා 'විභව' ය.

**30.** සාසවතෝ - ආස්‍රවයන්ට හිත වූ දේ වශයෙන් නුවණින් දැකීම:-

ආස්‍රව (කෙලෙස්) හටගැනීමට පඤ්ච-උපාදනස්කන්ධයන්ගේ පැවැත්ම හේතු වන බැවින් 'සාසව' ය.

**31.** සඞ්ඛතතෝ - හේතූන් නිසා හටගත් දේ වශයෙන් නුවණින් දැකීම:-

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි හේතු - ප්‍රත්‍යයයන්ගෙන් හටගත් පැවැත්මක් බැවින් 'සඞ්ඛත' ය.

**32.** මාරාමිසතෝ - මාරයාගේ ගොදුරු වශයෙන් නුවණින් දැකීම:-

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි මරණය නම් වූ මරුගේ (මච්චුමාර) හා කෙලෙස් නමැති මරුගේ ගොදුරු බැවින් 'මාරාමිස' ය.

**33. ජාතිධම්මතෝ - ඉපදීම ස්වභාවය කොට ඇති දේ වශයෙන් නුවණින් දැකීම:-**

ජාතිය හෙවත් උපත යනු පඤ්ච-උපාදානස්කන්ධයන්ගේ හටගැනීම යි. හටගැනීම (උපත) ස්වභාවය කොට ඇති බැවින් පඤ්ච-උපාදානස්කන්ධ 'ජාතිධම්ම' ය.

**34. ජරාධම්මතෝ - දිරීම ස්වභාවය කොට ඇති දේ වශයෙන් නුවණින් දැකීම:-**

ජරාව හෙවත් දිරීම - මහලු වීම පඤ්ච-උපාදානස්කන්ධයන්ට අයත් ධර්මතාවකි. නිරතුරු ව වෙනස් වන පඤ්ච-උපාදානස්කන්ධ ක්‍රමයෙන් ජරා - ජීර්ණ තත්ත්වයට පත් වන බැවින් 'ජරාධම්ම' ය.

**35. ව්‍යාධිධම්මතෝ - ව්‍යාධිය ස්වභාවය කොට ඇති දේ වශයෙන් නුවණින් දැකීම:-**

ව්‍යාධි - ලෙඩ - දුක් - පීඩා සියල්ල හටගන්නේ පඤ්ච-උපාදානස්කන්ධ ඇති බැවිනි. එබැවින් පඤ්ච-උපාදානස්කන්ධ 'ව්‍යාධිධම්ම' ය.

**36. මරණධම්මතෝ - මරණය ස්වභාවය කොට ඇති දේ වශයෙන් නුවණින් දැකීම:-**

ක්ෂණික ව සිදු වන බිඳී යාම මෙන් ම ජීවිතය නිරුද්ධ වීමේ 'සම්මුති-මරණය' පවතින්නේ ද පඤ්ච-උපාදානස්කන්ධ ඇති බැවිනි. එබැවින් පඤ්ච-උපාදානස්කන්ධ 'මරණධම්ම' ය.

**37. සෝකධම්මතෝ - ශෝකයට හේතු වන දේ වශයෙන් නුවණින් දැකීම:-**

ශෝකයට හේතු වන සෑම දේ ම හටගන්නේ පඤ්ච-උපාදානස්කන්ධ ඇති බැවිනි. පඤ්ච-උපාදානස්කන්ධ නැති නම් ශෝකයට කරුණක් ද නැත. එබැවින් පඤ්ච-උපාදානස්කන්ධ 'සෝකධම්ම' ය.

**38.** **පරිදේවධම්මතෝ - හඬන්නට හේතු වන දේ වශයෙන් නුවණින් දැකීම:-**

හඬන්නට, වැලපෙන්නට සිදු වන ඥාතිව්‍යසන, භෝගව්‍යසන ආදි කටුක අත්දැකීම්වලට සත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වන්නේ පඤ්ච-උපාදනස්කන්ධ ඇති බැවිනි. එබැවින් පඤ්ච-උපාදනස්කන්ධ 'පරිදේවධම්ම' ය.

**39.** **උපායාසධම්මතෝ - දැඩි ලෙස සිත වෙහෙස වන දවන දේ වශයෙන් නුවණින් දැකීම:-**

දැඩි මානසික පීඩාවන්ට සත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වන්නේ පඤ්ච-උපාදනස්කන්ධ පවතින නිසා ය. එබැවින් පඤ්ච-උපාදනස්කන්ධ වනාහි 'උපායාසධම්ම' ය.

**40.** **සංකිලේසිකධම්මතෝ - කෙලෙසීමේ ස්වභාවයෙන් යුතු ධර්මතාවක් වශයෙන් නුවණින් දැකීම:-**

පඤ්ච-උපාදනස්කන්ධ වනාහි තෘෂ්ණා, දෘෂ්ටි ආදි කෙලෙස්වලින් හා දුශ්චරිතවලින් කෙලෙසීමට පත් වන ක්ෂේත්‍රය බැවින් 'සංකිලේසිකධම්ම' ය.

මෙම ආදීනව සතළිසෙන් අනිච්ච, පලෝක, චල, පභඞ්ගු, අද්ධුව, විපරිණාමධම්ම, අසාරක, විභව, සඞ්ඛත, මරණධම්ම යන දසය 'අනිත්‍ය' ලක්ෂණය ප්‍රකට කරයි. එම දසාකාරය අනුව පඤ්ච-උපාදනස්කන්ධ විදර්ශනාවට නංවන විට අනිච්චානුපස්සනාව පනස් ආකාර වේ. තව ද පර, රිත්ත, තුච්ඡ, සුඤ්ඤ, අනත්ත යන ආදීනව පස 'අනාත්ම' ලක්ෂණය ප්‍රකට කරයි. එම පස් ආකාරය අනුව පඤ්ච-උපාදනස්කන්ධ විදර්ශනාවට නංවන විට අනත්තානුපස්සනාව විසිපස් ආකාර වේ. දුක්ඛ, රෝග ආදි වූ සෙසු ආදීනව විසිපහ තුළින් ප්‍රකට කෙරෙන්නේ 'දුක්ඛ' ලක්ෂණය යි. එම විසිපස් ආකාරය අනුව පඤ්ච-උපාදනස්කන්ධ විදර්ශනාවට නංවන විට දුක්ඛානුපස්සනාව එකසිය විසිපස් ආකාර වේ. මෙලෙස ආකාර දෙසියයකින් **(50 + 25 + 125)** අනිත්‍යාදි වශයෙන් පඤ්ච-උපාදනස්කන්ධ විදර්ශනා නුවණින් සම්මර්ශනය කරන විට

'නයවිපස්සනා' නමින් හැඳින්වෙන, පඤ්ච-උපාදනස්කන්ධ ත්‍රිලක්ෂණයට නංවා බැලීමේ විදර්ශනා භාවනාව සිතෙහි තහවුරු වේ.

අනතුරු ව තව දුරටත් නාම - රූප ධර්ම විදර්ශනා කිරීමට 'රූපසත්තක' හා 'අරූපසත්තක' යන ක්‍රම ද භාවිත කළ හැකි ය.

# රූපසත්තක ක්‍රමය
# (රූපය විදර්ශනාවට නංවන ආකාර 7)

**1. <u>ආදානනික්ඛේපන</u>** - 'ආදාන' යනු ප්‍රතිසන්ධිය යි. 'නික්ඛේපන' යනු මරණය යි. මේ දෙක අතර ගෙවී යන ආයු-කාලය එක් ජීවිතයකි. උපරිම වශයෙන් ගත් කල්හි එය වර්ෂ සියයක් තරම් වනු ඇත. මේ කාලය තුළ පවතින සියලු සංස්කාර ධර්ම අනිත්‍ය ය. හටගෙන බිඳී යන බැවින් ද වෙනස් වන (විපරිණාම) බැවින් ද නිත්‍ය බවට විරුද්ධ බැවින් ද අනිත්‍ය ය. එසේ හටගත් අනිත්‍ය වූ සංස්කාර ධර්ම ජරාවට පත් ව ඒකාන්තයෙන් ම බිඳී යයි. එබැවින් මෙම සංස්කාර ධර්ම වනාහි සත්ත්වයන් නිරන්තරයෙන් පෙළන බැවින් ද ඒකාන්ත දුක් බැවින් ද දුකට වස්තුවක් වන බැවින් ද සැපයට විරුද්ධ බැවින් ද දුක ය. නිරතුරු ව වෙනස් වන සංස්කාර ධර්ම නො දිරන ලෙස නො බිඳෙන ලෙස පවත්වා ගැනීමට සත්ත්වයන් කැමති වුවත් එය එසේ කළ නො හැක. සංස්කාර ධර්ම තමාගේ වසඟයෙහි පවත්වා ගත නො හැකි බැවින් ද අස්වාමික බැවින් ද මමත්වයෙන් හිස් (ශූන්‍ය) බැවින් ද ආත්මීය අදහසට විරුද්ධ බැවින් ද අනාත්ම ය. මෙසේ ප්‍රතිසන්ධියේ පටන් මරණය දක්වා පවතින රූප සියල්ල අනිත්‍ය - දුක්ඛ - අනාත්ම වශයෙන් නුවණින් දකිමින් විදර්ශනාවට නැංවීම 'ආදානනික්ඛේපන' ක්‍රමය යි.

**2. <u>වයෝවුද්ධත්ථඞ්ගම</u>** - කාලානුරූප ව සිදු වන රූපයේ විපරිණාමය පරිච්ඡේදවලට වෙන් කර ගෙන විදර්ශනාවට නැංවීම ය, මෙයින් අදහස් කරනු ලබන්නේ.

වර්ෂ සියයක් ජීවත් වන කෙනෙකුගේ පළමු වර්ෂ තිස්තුන 'ප්‍රථම වයස' ලෙසත් දෙවැනි වර්ෂ තිස්හතර 'මධ්‍යම වයස' ලෙසත් ඉතිරි වර්ෂ තිස්තුන 'පශ්චිම වයස' ලෙසත් වෙන් කර ගෙන මෙලෙස රූපය විදර්ශනාවට නැංවිය යුතු ය. එනම්, 'ප්‍රථම වයසෙහි පැවති රූපය මධ්‍යම වයසට නො පැමිණ ප්‍රථම වයසෙහි දී ම නිරුද්ධ වෙයි. එබැවින් ප්‍රථම වයසෙහි පවතින රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය. මධ්‍යම වයසෙහි පවතින රූපය පශ්චිම වයසට නො පැමිණ මධ්‍යම

වයසෙහි දී ම නිරුද්ධ වෙයි. එබැවින් මධ්‍යම වයසෙහි පවතින රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය. පශ්චිම වයසෙහි පවතින රූපය මරණින් ඔබ්බට ගමන් කිරීමක් නැත. එබැවින් එම රූපය ද අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙනි. අනතුරු ව එම වර්ෂ සියය වර්ෂ දහයේ පරිච්ඡේද දහයකට බෙදා ගනිමින්,

**1.** පළමු වසර දහය - මන්ද දශකය (ළදරු කාලය)
**2.** දෙවැනි වසර දහය - ක්‍රීඩා දශකය (කෙළිදෙළෙන් ගෙවන කාලය)
**3.** තෙවැනි වසර දහය - වර්ණ දශකය (සොඳුරු යෞවන කාලය)
**4.** සිවුවැනි වසර දහය - බල දශකය (කාය බලයෙන් යුක්ත වන කාලය)
**5.** පස්වැනි වසර දහය - ප්‍රඥා දශකය (නුවණ මුහුකුරා යන කාලය)
**6.** හයවැනි වසර දහය - හානි දශකය (ශරීර ශක්තිය පිරිහෙන කාලය)
**7.** හත්වැනි වසර දහය - 'පබ්භාර' දශකය (ශරීරය මඳක් කුදු ගැසෙන කාලය)
**8.** අටවැනි වසර දහය - 'පවඞ්ක' දශකය (ශරීරය වඩාත් කුදු ගැසෙන කාලය)
**9.** නවවැනි වසර දහය - මෝමූහ දශකය (කළ දේ අමතක වන කාලය)
**10.** දසවැනි වසර දහය - සයන දශකය (සයනයෙහි ගත කරන අවසන් කාලය)

මෙලෙස කොටස් කර ගෙන අනතුරු ව මෙසේ රූපය විදර්ශනාවට නැංවිය යුතු ය. එනම්, 'ප්‍රථම දශකයෙහි රූපය දෙවැනි දශකයට නො පැමිණ එහි ම නිරුද්ධ වෙයි. එබැවින් එම රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය..... නවවැනි දශකයෙහි පැවති රූපය දසවැනි දශකයට නො පැමිණ එහි ම නිරුද්ධ වෙයි. එබැවින් එම රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය. දසවැනි දශකයෙහි පැවති රූපය ඊළඟ භවයට නො පැමිණ එහි ම නිරුද්ධ වෙයි. එබැවින් එම රූපය

අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙනි.

මෙසේ දශක වශයෙන් විදර්ශනාවට නංවා අනතුරු ව වර්ෂ පහ බැගින් කොටස් විස්සකට බෙදා ගෙන ඉහත දැක්වූ ආකාරයට රූපය විදර්ශනාවට නැංවිය යුතු ය. එනම්, 'ප්‍රථම වර්ෂ පසෙහි පැවති රූපය දෙවැනි වර්ෂ පහට නො ගොස් එහි ම නිරුද්ධ වේ. එබැවින් එම රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය... විසිවැනි පස්වසෙහි පැවති රූපය මරණයෙන් ඔබ්බට ගමන් නො කොට එහි ම නිරුද්ධ වේ. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙනි.

නැවත වර්ෂ සතර බැගින් විසිපස් කොටසක් වශයෙන් බෙදා ගෙන ද වර්ෂ තුන බැගින් තෙතිස් කොටසකට බෙදා ගෙන ද වර්ෂ දෙක බැගින් පනස් කොටසකට බෙදා ගෙන ද වර්ෂය බැගින් සියක් කොටසකට බෙදා ගෙන ද ඉහත දැක්වූ ලෙසින් රූපය විදර්ශනාවට නැංවිය යුතු ය. අනතුරු ව එක් වර්ෂයක් ඍතු තුනට බෙදා ගෙන විදර්ශනාවට නැංවිය යුතු ය. එනම්, 'වස්සාන සිවු මසෙහි පැවති රූපය හේමන්තයට නො පැමිණ එහි ම නිරුද්ධ වෙයි. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය' යනුවෙනි. සෙසු ඍතු දෙක පිළිබඳ වත් මෙසේ ම ය. අනතුරු ව දෙමස බැගින් වර්ෂය කොටස් හයකට බෙදා ගෙන ද 'පුර' පක්ෂය - 'අව' පක්ෂය වශයෙන් මාසය කොටස් දෙකකට බෙදා ගෙන ද රූපය විදර්ශනාවට නැංවිය යුතු ය. අනතුරු ව එක් දිනක් සලකා ගෙන 'දහවල පැවති රූපය රාත්‍රියට නො පැමිණ එහි ම නිරුද්ධ වෙයි. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය. එමෙන් ම පෙරවරුව - මධ්‍යාහ්නය - සවස්වරුව - රාත්‍රී ප්‍රථම යාමය - රාත්‍රී මධ්‍යම යාමය - රාත්‍රී පශ්චිම යාමය වශයෙන් දිනය කොටස් හයකට බෙදා ගෙන පෙර සේ ම රූපය විදර්ශනාවට නැංවිය යුතු ය.

අනතුරු ව ඉදිරියට යාම, ආපසු හැරී ඒම, දිශා - අනුදිශා බැලීම ආදි ක්‍රියාවන් සලකා ගෙන 'ඉදිරියට යෑමේ දී පැවති රූපය හැරී ආපසු ඒම දක්වා නො පැවතී එහි ම නිරුද්ධ වන්නේ ය. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය. සක්මන් කිරීමේ දී එක්

පියවරක් තැබීම,

1. පය එසවීම
2. ඉදිරියට යැම
3. ඔබිනොබ චලනය කිරීම
4. පහත් කිරීම
5. බිම තැබීම
6. තද කිරීම

වශයෙන් කොටස් හයකට බෙදා ගෙන ඒ එක් එක් කොටසක දී පැවති රූපය අනෙක් කොටසට පත් නො වී එහි ම නිරුද්ධ වන බව වටහා ගනිමින් 'රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය. මෙසේ රූපය විදර්ශනාවට නංවන යෝගාවචරයාට, රූපය වනාහි ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ගෙවීමට, ක්‍ෂය වීමට යන පහනේ වැටිය හා තෙල මෙන් වහා වෙනස් වී යන ධර්මතාවක් බව වැටහේ. මෙලෙස <u>වයෝවුද්ධත්ථඞ්ගම</u> ක්‍රමයෙන් ද යෝගාවචරයාට රූපයේ අනිත්‍යතාව අවබෝධ කර ගැනීමට පහසු වේ.

**3.** <u>'ආහාරමය-රූප' විදර්ශනාවට නැංවීම</u> - ආහාරමය රූපයන්හි අනිත්‍යතාව කුසගිනි ඇති විට හා නැති විට වඩාත් ප්‍රකට ව පෙනේ. කුසගිනි ඇති විට හටගන්නා රූප දුර්වර්ණ ය**;** මලානික ස්වරූපයෙන් යුතු ය. ආහාරයෙන් කුස පිරුණු විට හටගන්නා රූප මෘදු පහසින් යුතු ය**;** ප්‍රණීත ය**;** වර්ණවත් ය. 'කුසගිනි ඇති විට පවතින රූප කුස පිරුණු අවස්ථාව දක්වා නො පැවතී  එහි ම නිරුද්ධ වෙයි. කුස පිරුණු විට පවතින රූප කුසගිනි අවස්ථාව දක්වා නො පැවතී එහි ම නිරුද්ධ වෙයි. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම,' ය යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය.

**4.** <u>'උතුමය - රූප' විදර්ශනාවට නැංවීම</u> - ඍතුමය රූපයන්හි අනිත්‍යතාව ශීත - උෂ්ණ අවස්ථාවන්හි හටගන්නා රූපයන්ගෙන් වඩාත් ප්‍රකට වේ. උෂ්ණ කාලයෙහි හටගන්නා රූප මලානික ය**;** දුර්වර්ණ ය. ශීත කාලයෙහි හටගන්නා රූප

ප්‍රණීත ය; වර්ණවත් ය; මෘදු පහසින් යුතු ය. 'ශීත කාලයෙහි පවතින රූප උෂ්ණ කාලය දක්වා නො පැවතී එහි ම නිරුද්ධ වෙයි. උෂ්ණ කාලයෙහි පවතින රූප ශීත කාලය දක්වා නො පැවතී එහි ම නිරුද්ධ වෙයි. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය' යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය.

**5.** <u>'කර්මජ රූප' විදර්ශනාවට නැංවීම</u> - කර්මජ (පුරාණ කර්මය නිසා හටගත්) රූප පිළිබඳ ව ප්‍රකට ව දැනගත හැක්කේ 'සළායතන-ද්වාර' ගැන සැලකීමෙනි. ඒ ඒ ද්වාරයන්හි පවතින කර්මජ රූප කලාප මෙසේ ය.

<u>ඇස (චක්ඛුද්වාර) - රූප කලාප වර්ග හයකි.</u>

1. **චක්ඛුදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, චක්ඛුප්පසාද
2. **කායදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, කායප්පසාද
3. **භාවදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, භාවරූප
4. **උතුසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා
5. **චිත්තසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා
6. **ආහාරසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා

සියලු ම රූප **(10x3) + (8x3) = 54**

කන (සෝතද්වාර), නාසය (ඝානද්වාර), දිව (ජිව්හාද්වාර) යන ආයතනවල ද ඉහත දැක්වූ පරිදි ම රූප පනස්හතර බැගින් ඇත. වෙනස වන්නේ 'චක්ඛුප්පසාද' - රූපය යෙදුණු තැන පිළිවෙළින් සෝතප්පසාද, ඝානප්පසාද, ජිව්හාප්පසාද යන රූප යෙදිය යුතු බව යි.

<u>කය (කායද්වාර) - රූප කලාප වර්ග පහකි.</u>

1. **කායදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, කායප්පසාද
2. **භාවදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, භාවරූප
3. **උතුසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා
4. **චිත්තසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා
5. **ආහාරසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා

සියලු ම රූප **(10x2) + (8x3) = 44**

<u>හදයවත්ථු (හෘදයවස්තු-රූපය) - රූප කලාප වර්ග හයකි.</u>

1. **වත්ථුදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, හදයරූප
2. **කායදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, කායප්පසාද
3. **භාවදසක** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, භාවරූප
4. **උතුසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා
5. **චිත්තසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා
6. **ආහාරසමුට්ඨාන** - පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා

සියලු ම රූප **(10x3) + (8x3) = 54**

යෝගාවචරයා විසින් ඒ ඒ ද්වාරයන්හි පුරාණ කර්මය නිසා හටගත් රූප කලාප ද සෙසු උතු - චිත්ත - ආහාර සමුට්ඨාන රූප කලාප ද යන රූප සියල්ල පිළිබඳ ව නුවණින් සලකමින් එම රූප සියල්ල මෙසේ විදර්ශනාවට නැංවිය යුතු ය. එනම්, 'ඇසෙහි (චක්ඛුද්වාරයෙහි) හටගත් රූප කනට

(සෝතද්වාරයට) නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එසේ ම කනෙහි රූප නාසයට ද නාසයේ රූප දිවට ද දිවෙහි රූප කයට ද කයෙහි රූප හෘදයවස්තු-රූපයට ද නො පැමිණ එහි ම නිරුද්ධ වේ. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙනි.

**6.** **<u>'චිත්තජ - රූප' විදර්ශනාවට නැංවීම</u>** - ඒ ඒ සිත්වල සහජාතභාවයෙන් හටගන්නා රූප ද ඇත. එම චිත්තජ-රූපවල අනිත්‍යය සොම්නස් - දොම්නස් අවස්ථාවල හටගන්නා රූපවලින් වඩාත් ප්‍රකට වේ. සිත සොම්නස් සහගත අවස්ථාවල හටගන්නා රූප මෘදු ය; ප්‍රණීතය ය; වර්ණවත් ය. සිත දොම්නස් සහගත අවස්ථාවල හටගන්නා රූප දුර්වර්ණ ය; මලානික ය. 'සොම්නස් සහගත අවස්ථාවල දී හටගන්නා රූප දොම්නස් සහගත අවස්ථාව දක්වා නො පැවතී එහි ම නිරුද්ධ වේ. දොම්නස් සහගත අවස්ථාවල දී හටගන්නා රූප සොම්නස් සහගත අවස්ථාව දක්වා නො පැවතී එහි ම නිරුද්ධ වේ. එබැවින් රූපය අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය,' යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය.

**7.** **<u>'ධම්මතා - රූප' විදර්ශනාවට නැංවීම</u>** - මෙහි දී 'ධම්මතා - රූප' වශයෙන් සැලකෙන්නේ රන් - රිදී - මුතු - මැණික් ආදි වශයෙන් අනේක ප්‍රභේද වූ කල්පය හටගන්නා කාලයෙහි සිට ලොව පහළ වන ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ නො වූ රූප ය. 'උතුජ - රූප' ගණයට අයත් වන එම රූප ප්‍රධාන වශයෙන් පඨවී, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන 'ශුද්ධාෂ්ටක' රූප කලාපයන්ගෙන් සැකසී ඇත. ශබ්ද - රූපය ද ඇතුළත් වන කලාපවල රූප ගණන නවයකි. මෙම ධම්මතා - රූපවල අනිත්‍යය පහසුවෙන් වටහා ගැනීමට අශෝක ගස්වල කොළ උදාහරණයක් වශයෙන් සැලකිය හැකි ය. අශෝක ගස්වල හටගන්නා අංකුර මුලින් ම මඳ රතු පාට ය. දින කිහිපයකින් මෝරන ලා දළු, තද රතු පැහැයෙන් යුතු ය. දින කිහිපයකින් නැවතත් ලා රතට හැරෙන එම දළු තවත් දින කිහිපයකින් ලා කොළ පැහැයෙන් යුතු ලපටි පත්‍ර බවට පත් වේ. අනතුරු ව පත්‍ර මේරූ කල තද කොළ පැහැයට හැරේ. එසේ පවතින පත්‍ර

කලෙක දී ඉදී පඬුවන් පැහැ ගැන්වී නටුවෙන් ගිලිහී බිම පතිත වේ. මෙසේ ලා රතු පැහැ අංකුරවල පැවති රූප තද රතු පැහැ දළු බවට නො පැමිණ එහි ම නිරුද්ධ වේ. අවශේෂ අවස්ථාවල පැවති රූප ද අවසානයෙහි දී පත්‍රය ඉදී පඬුවන් පැහැ බවට පත් වීම දක්වා නො පැවතී ඒ ඒ අවස්ථාවල ම නිරුද්ධ වෙයි. එබැවින් බාහිර වශයෙන් පවතින රන් - රිදී - මුතු මැණික් ආදි සියලු 'ධම්මතා-රූප' ද අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය.

මෙලෙස, රූපය පිළිබඳ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණය අවබෝධ කර ගැනීම සඳහා 'රූපසත්තක' ක්‍රමය භාවිත කළ හැකි අතර අනතුරු ව නාම ධර්මයන්ගේ ත්‍රිලක්ෂණය අවබෝධ කර ගැනීම සඳහා අරූපසත්තක ක්‍රමය භාවිත කළ හැකි ය.

## අරූපසත්තක ක්‍රමය
## ('නාම' ධර්ම විදර්ශනාවට නංවන ආකාර 7)

**1.** <u>'කලාප' ක්‍රමය</u> - චිත්ත, චෛතසික ධර්ම සමූහ වශයෙන් ගෙන එම නාම ධර්ම අනිත්‍ය - දුක්ඛ - අනාත්ම වශයෙන් විදර්ශනාවට නැංවීම 'කලාප' ක්‍රමය යි. රූපසත්තක භාවනා ක්‍රමයන්හි දක්වුණු ලෙස එම සත් ආකාරය අනුව රූපය විදර්ශනා කරන චිත්ත, චෛතසික ධර්ම සමූහය සමස්තයක් වශයෙන් නුවණින් සලකා ගෙන එම චිත්ත, චෛතසික ධර්ම අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය වශයෙන් මෙහි දී විදර්ශනාවට නැංවිය යුතු ය. උදාහරණයක් ලෙස, 'උපතේ පටන් මරණය දක්වා පවතින රූප මරණයෙන් ඔබ්බට ගමන් කිරීමක් නැත. උපතත් මරණයත් අතර පවතින රූප සියල්ල ම අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය.' මෙලෙස රූපය විදර්ශනා කිරීමේ දී පහළ වන වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන නාම ස්කන්ධ සතරට අයත් නාම ධර්ම සියල්ල ම අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, වශයෙන් විදර්ශනාවට නැංවිය යුතු ය. (මෙහි දී ඒ ඒ සිත් අනුව පහළ වන චෛතසික ධර්ම පිළිබඳ අවබෝධයක් යෝගාවචරයා විසින් පළමුවෙන්

ඇති කර ගෙන තිබිය යුතු අතර මෙහි ලා 'කලාප' යන්නෙන් ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, චිත්ත යන ඵස්සපඤ්චමක නාම ධර්ම සමූහය අදහස් කරනු ලැබේ. රූපය විදර්ශනා කිරීමේ දී ඇති වන මෙම නාම ධර්ම සමූහය විදර්ශනාවට නැංවීම 'කලාප' ක්‍රමය යි.)

**2.** <u>'යමක' ක්‍රමය</u> - රූපී හා අරූපී ධර්ම යුගල වශයෙන් ගෙන විදර්ශනාවට නැංවීම 'යමක' ක්‍රමය යි. එනම්, පළමුවෙන් උපතේ පටන් මරණය දක්වා පවතින රූප අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් රූපය පිළිවෙලින් විදර්ශනා කොට එසේ රූපය විදර්ශනා කළ සිත (චිත්ත - චෛතසික ධර්ම) අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් අනෙක් සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. මෙය 'යමක' ක්‍රමය යි. එලෙස ම 'වයෝවුද්ධත්ථඞ්ගම'-රූප, ආහාරමය-රූප, උතුමය-රූප, කම්මජ-රූප, චිත්තජ-රූප, ධම්මතා-රූප අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් විදර්ශනාවට නංවා එසේ රූපය විදර්ශනා කළ සිත ද අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් විදර්ශනාවට නැංවිය යුතු ය.

**3.** <u>'ඛණික' (ක්‍ෂණ වශයෙන් බැලීමේ) ක්‍රමය</u> - උපතේ සිට මරණය දක්වා පවතින රූප අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් පළමුවෙන් රූපය විදර්ශනාවට නංවා එසේ රූපය විදර්ශනා කළ (පළමු) සිත (චිත්ත - චෛතසික ධර්ම) අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් අනෙක් සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. ඒ (දෙවැනි) සිත ද අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය යනුවෙන් තවත් (තුන්වැනි) සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. එම (තුන්වැනි) සිත ද අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් අනෙක් (සිවුවැනි) සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. එම (සිවුවැනි) සිත ද අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් තවත් (පස්වැනි) සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. මෙසේ රූපසත්තකයට අයත් සෙසු රූප ද විදර්ශනාවට නංවමින් රූප විදර්ශනා කළ සිත තවත් සිත් පරම්පරා (චිත්ත වීථි) සතරකින් විදර්ශනා කිරීම 'ඛණික' ක්‍රමය යි.

4. <u>'පටිපාටි' ක්‍රමය</u> - උපතේ සිට මරණය දක්වා පවතින රූප අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් රූපය විදර්ශනාවට නංවා එසේ රූපය විදර්ශනා කළ (පළමු) සිත අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් අනෙක් (දෙවැනි) සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. ඒ දෙවැනි සිත තුන්වැනි සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය.තුන්වැනි සිත යළි සිවුවැනි සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. මෙසේ පිළිවෙලින් දසවැනි සිත දක්වා විදර්ශනාවට නංවා එම දසවැනි සිත ද අනිත්‍ය ය - දුක්ඛ ය - අනාත්ම ය, යනුවෙන් එකොළොස්වැනි සිතකින් විදර්ශනාවට නැංවිය යුතු ය. මෙසේ (සත් ආකාරයට ම) රූපය විදර්ශනා කළ සිත තවත් සිත් පරම්පරා දහයකින් පිළිවෙලින් විදර්ශනාවට නැංවීම 'පටිපාටි' ක්‍රමය යි.

5. <u>'දිට්ඨිඋග්ඝාටන' ක්‍රමය</u> - අංක **5, 6, 7** යටතේ දැක්වෙන අරූප විදර්ශනාවන් වනාහි වෙන් වෙන් වූ විදර්ශනා ක්‍රම නො වේ. රූප - අරූප ධර්ම විදර්ශනා කිරීම තුළින් දෘෂ්ටි - මාන - තෘෂ්ණා දුරු කිරීම ය, ඉන් අදහස් වන්නේ.

රූප-අරූප ධර්මයන් විදර්ශනාවට නංවන්නා වූ යෝගාවචරයාට එම ධර්ම සත්ත්වයෙකු නො වේ ය'යි වැටහේ. සත්ත්ව දෘෂ්ටිය දුරු වූ කල්හි සංස්කාර පිළිබඳ වූ වැරදි දෘෂ්ටීන් ද දුරු වේ.

තව ද 'මම විදර්ශනා භාවනා වඩමි. මේ මාගේ විදර්ශනාව ය', යනුවෙන් ගන්නා කල්හි එය වැරදි දෘෂ්ටියකි. එහෙත් තියුණු ලෙස, නාම-රූප ධර්ම විදර්ශනාවට නංවන්නා වූ යෝගාවචරයාට හුදෙක් සංස්කාර ධර්මයෝ ම සංස්කාර ධර්මයන් විදර්ශනා කරති' යි කියා අවබෝධ වූ කල්හි දෘෂ්ටිය දුරු කරන ලද' යි සැලකේ.(මෙයින් අදහස් කෙරෙනුයේ 'මම' ය කියා ගනු ලබන්නේත් සංස්කාර ධර්ම ම බවත් ඒ සංස්කාර විසින් නාම-රූප සංස්කාර ධර්ම විදර්ශනාවට නංවන බවත් ය.)

6. <u>මානසමුග්ඝාටන (මානය නැති කිරීමේ) ක්‍රමය</u> - ආත්ම-දෘෂ්ටිය, සත්ත්ව දෘෂ්ටිය දුරු කළ සිතින් සංස්කාර ධර්ම විදර්ශනාවට නංවන යෝගාවචරයාට මානය ඇති නො වේ. එහෙත් යම් යෝගාවචරයෙකු 'මම මැනවින් විදර්ශනා වඩමි' යි

කියා සලකන්නේ නම් ඔහුගේ මානය දුරු වී නැත. සංස්කාර ධර්මයෝ ම සංස්කාර ධර්මයන් විදර්ශනා කරති' යි කියා අවබෝධ කර ගත් කල්හි මානය දුරු කරන ලද්දේ වෙයි.

**7. <u>නිකන්තිපරියාදන (ඇල්ම දුරු කිරීමේ) ක්‍රමය</u>** - මානය දුරු කළ සිතින් සංස්කාර විදර්ශනාවට නංවන යෝගාවචරයාට විදර්ශනාව පිළිබඳ ව ඇල්ම (තණ්හාව) ඇති නො වේ. එහෙත් යම් යෝගාවචරයෙකු 'මාගේ විදර්ශනා වැඩීම හොඳ යැ' යි කියා සලකන්නේ නම් විදර්ශනාව පිළිබඳ ඔහුගේ ඇල්ම දුරු වී නැත. සංස්කාර ධර්මයෝ ම සංස්කාර විදර්ශනා කරති' යි කියා අවබෝධ කර ගත් කල්හි තෘෂ්ණාව දුරු කරන ලද්දේ වෙයි.

සංස්කාර ධර්ම අනාත්ම වශයෙන් විදර්ශනා කිරීමේ දී (ආත්ම) දෘෂ්ටියත් සංස්කාර ධර්ම අනිත්‍ය වශයෙන් විදර්ශනා කිරීමේ දී මානයත් සංස්කාර ධර්ම දුක් වශයෙන් විදර්ශනා කිරීමේ දී තෘෂ්ණාවත් දුරු වී යන බව මෙහි දී සැලකිය හැකි ය.

මෙසේ අරූපසත්තක ක්‍රමය අනුව නාම ධර්ම විදර්ශනාවට නැංවීමෙන් වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන නාම ස්කන්ධයන්ගේ ත්‍රිලක්ෂණය අවබෝධ කර ගැනීම පහසු වේ.

නාම-රූප ධර්මයන්ගේ ත්‍රිලක්ෂණය වටහා ගත් යෝගාවචරයා විසින් අනතුරු ව පඤ්ච-ස්කන්ධ ඇති වීම් - නැති වීම් (සමුදය-වය/උදයබ්බය) වශයෙන් පනස් ආකාරයකින් සම්මර්ශනය කරමින් ස්කන්ධයන්ගේ ඇති වීම - නැති වීම (උදයබ්බය) පිළිබඳ ව අවබෝධ කර ගැනීමට වෑයම් කළ යුතු ය.

**<u>I.) රූප - උපාදනස්කන්ධය:</u>**

**<u>'සමුදය' - ඇති වීම.</u>**

අතීත හේතු:
1. අවිද්‍යාව නිසා රූපය හටගනී.
2. තණ්හාව නිසා රූපය හටගනී.
3. කර්මය නිසා රූපය හටගනී.

වර්තමාන හේතු:
4. ආහාර නිසා රූපය හටගනී.

(1-4) 'ප්‍රත්‍යය' වශයෙන් රූපයේ හටගැනීම නුවණින් දැකීම. **(පච්චයතෝ)**

5. රූපය හටගන්නා ක්ෂණයෙහි හටගැනීමේ (සමුදය) ලක්ෂණය දැකීම.

(5) 'ක්ෂණ' වශයෙන් රූපයේ හටගැනීම නුවණින් දැකීම. **(ඛණතෝ)**

**'වය' - නැති වීම.**

6. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් රූපය නැති වේ.
7. තණ්හාව නිරුද්ධ වීමෙන් රූපය නැති වේ.
8. කර්මය නිරුද්ධ වීමෙන් රූපය නැති වේ.
9. ආහාර නිරුද්ධ වීමෙන් රූපය නැති වේ.

(6-9) 'ප්‍රත්‍යය' වශයෙන් රූපයේ නැති වීම (වය) නුවණින් දැකීම.

10. රූපය බිඳී යන ක්ෂණයෙහි නැති වීමේ (වය) ලක්ෂණය දැකීම.

(10) 'ක්ෂණ' වශයෙන් රූපයේ නැති වීම නුවණින් දැකීම.

## II.) වේදනා - උපාදනස්කන්ධය:

**'සමුදය' - ඇති වීම.**

අතීත හේතු:

1. අවිද්‍යාව නිසා වේදනා හටගනී.
2. තණ්හාව නිසා වේදනා හටගනී.
3. කර්මය නිසා වේදනා හටගනී.

වර්තමාන හේතුව:

4. ස්පර්ශය නිසා වේදනා හටගනී.

(1-4) 'ප්‍රත්‍යය' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම.

5. වේදනා හටගන්නා ක්ෂණයෙහි හටගැනීමේ (සමුදය) ලක්ෂණය දැකීම.

(5) 'ක්ෂණ' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම.

**'වය' - නැති වීම.**

6. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් වේදනා නැති වේ.
7. තණ්හාව නිරුද්ධ වීමෙන් වේදනා නැති වේ.
8. කර්මය නිරුද්ධ වීමෙන් වේදනා නැති වේ.
9. ස්පර්ශය නිරුද්ධ වීමෙන් වේදනා නැති වේ.

(6-9) 'ප්‍රත්‍යය' වශයෙන් 'වය' නුවණින් දැකීම.

10. වේදනා බිඳී යන ක්ෂණයෙහි නැති වීමේ (වය) ලක්ෂණය දැකීම.

(10) 'ක්ෂණ' වශයෙන් 'වය' නුවණින් දැකීම.

**III.) සඤ්ඤා - උපාදානස්කන්ධය:**

**'සමුදය' - ඇති වීම.**

| | | |
|---|---|---|
| අතීත හේතු | 1. අවිද්‍යාව නිසා සඤ්ඤා හටගනී.<br>2. තණ්හාව නිසා සඤ්ඤා හටගනී.<br>3. කර්මය නිසා සඤ්ඤා හටගනී. | 'ප්‍රත්‍යය' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම. |
| වර්තමාන හේතු | 4. ස්පර්ශය නිසා සඤ්ඤා හටගනී. | |
| | 5. සඤ්ඤා හටගන්නා ක්ෂණයෙහි හටගැනීමේ (සමුදය) ලක්ෂණය දැකීම. | 'ක්ෂණ' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම. |

**'වය' - නැති වීම.**

| | |
|---|---|
| 6. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් සඤ්ඤා නැති වේ.<br>7. තණ්හාව නිරුද්ධ වීමෙන් සඤ්ඤා නැති වේ.<br>8. කර්මය නිරුද්ධ වීමෙන් සඤ්ඤා නැති වේ.<br>9. ස්පර්ශය නිරුද්ධ වීමෙන් සඤ්ඤා නැති වේ. | 'ප්‍රත්‍යය' වශයෙන් 'වය' නුවණින් දැකීම. |
| 10. සඤ්ඤා බිඳී යන ක්ෂණයෙහි නැති වීමේ (වය) ලක්ෂණය දැකීම. | 'ක්ෂණ' වශයෙන් 'වය' නුවණින් දැකීම. |

**IV.) සඞ්ඛාර - උපාදානස්කන්ධය:**

**'සමුදය' - ඇති වීම.**

| | | |
|---|---|---|
| අතීත හේතු | 1. අවිද්‍යාව නිසා සඞ්ඛාර හටගනී.<br>2. තණ්හාව නිසා සඞ්ඛාර හටගනී.<br>3. කර්මය නිසා සඞ්ඛාර හටගනී. | 'ප්‍රත්‍යය' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම. |
| වර්තමාන හේතු | 4. ස්පර්ශය නිසා සඞ්ඛාර හටගනී. | |
| | 5. සඞ්ඛාර හටගන්නා ක්ෂණයෙහි හටගැනීමේ (සමුදය) ලක්ෂණය දැකීම. | 'ක්ෂණ' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම. |

**'වය' - නැති වීම.**

6. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් සඞ්ඛාර නැති වේ.
7. තණ්හාව නිරුද්ධ වීමෙන් සඞ්ඛාර නැති වේ.
8. කර්මය නිරුද්ධ වීමෙන් සඞ්ඛාර නැති වේ.
9. ස්පර්ශය නිරුද්ධ වීමෙන් සඞ්ඛාර නැති වේ.

} 'ප්‍රත්‍යය' වශයෙන් 'වය' නුවණින් දැකීම.

10. සඞ්ඛාර බිඳී යන ක්‍ෂණයෙහි නැති වීමේ (වය) ලක්‍ෂණය දැකීම.

} 'ක්‍ෂණ' වශයෙන් 'වය' නුවණින් දැකීම.

## V.) විඥ්ඥාණ - උපාදනස්කන්ධය:

**'සමුදය' - ඇති වීම.**

අතීත හේතු {
1. අවිද්‍යාව නිසා විඥ්ඥාණය හටගනී.
2. තණ්හාව නිසා විඥ්ඥාණය හටගනී.
3. කර්මය නිසා විඥ්ඥාණය හටගනී.

වර්තමාන හේතු {
4. නාම-රූප නිසා විඥ්ඥාණය හටගනී.

} 'ප්‍රත්‍යය' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම.

5. විඥ්ඥාණය හටගන්නා ක්‍ෂණයෙහි හටගැනීමේ (සමුදය) ලක්‍ෂණය දැකීම

} 'ක්‍ෂණ' වශයෙන් 'සමුදය' නුවණින් දැකීම.

**'වය' - නැති වීම.**

6. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් විඥ්ඥාණය නැති වේ.
7. තණ්හාව නිරුද්ධ වීමෙන් විඥ්ඥාණය නැති වේ.
8. කර්මය නිරුද්ධ වීමෙන් විඥ්ඥාණය නැති වේ.
9. නාම-රූප නිරුද්ධ වීමෙන් විඥ්ඥාණය නැති වේ.

} 'ප්‍රත්‍යය' වශයෙන් 'වය' නුවණින් දැකීම.

10. විඥ්ඥාණය බිඳී යන ක්‍ෂණයෙහි නැති වීමේ (වය) ලක්‍ෂණය දැකීම.

} 'ක්‍ෂණ' වශයෙන් 'වය' නුවණින් දැකීම.

මෙම පනස් ආකාරය අනුව උදයබ්බයඤාණය ඇති කර ගන්නා යෝගාවචරයා, ප්‍රත්‍යය වශයෙන් ද, ක්‍ෂණ වශයෙන් ද, ස්කන්ධ පසෙහි ඇති වීම හා නැති වීම පැහැදිලි ව දැක ගනී. මෙම පනස් ආකාරයෙන් ස්කන්ධයන්ගේ ඇති වීම - නැති වීම දකින යෝගාවචරයා ලබා ඇත්තේ තරුණ (ආරම්භක) විදර්ශනාව යි. මෙලෙස (තරුණ) විදර්ශනාව ඇරඹූ යෝගාවචරයාට, දශවිධ විදර්ශනා උපක්ලේශ හටගැනීමට ඉඩ තිබේ. මෙම විදර්ශනා උපක්ලේශ වනාහි ධර්මය අවබෝධ කළ ආර්යශ්‍රාවකයන් වහන්සේට ද භාවනා ප්‍රතිපදාව වරදවා ගත් තැනැත්තාට ද කමටහන අත්හළ කුසීත පුද්ගලයාට ද ඇති නො වේ. නිවැරදි ලෙස විදර්ශනා භාවනාව වඩන, ආරම්භ කළ වීර්ය ඇති කුලපුත්‍රයාට ම මෙම විදර්ශනා උපක්ලේශ ඇති වේ.

## විදර්ශනා උපක්ලේශ

**1.** **ඕභාස** - ආලෝකය (විදර්ශනාවේ බලයෙන් පඤ්ච-නීවරණ යටපත් වීම නිසා බලවත් ආලෝකයක් සිතට අරමුණු වේ.)

**2.** **ඤාණ** - නුවණ (සංස්කාර ධර්මයන්ගේ යථාස්වභාවය වැටහෙන්නට පටන් ගැනීමෙන් පෙර නො පැවති බලවත් නුවණක් ඇති වේ.)

**3.** **පීති** - නිරාමිස ප්‍රීතිය (සංස්කාර ධර්මයන්ගේ යථාස්වභාවය පැහැදිලි ව අරමුණු වන විට පෙර නො වූ විරූ නිරාමිස ප්‍රීතියක් ඇති වේ.)

**4.** **පස්සද්ධි** - සන්සිඳීම (විදර්ශනාව නො කඩවා සිදු කරන විට පහළ වන බලවත් කුසල් සිත් හා ශෝභන චෛතසික නිසා සිත හා නාම-කය සන්සිඳේ. සැහැල්ලු වේ.)

**5.** **සුඛ** - සැපය (විදර්ශනාව නො කඩවා වැඩීම නිසා ප්‍රීතිය, සන්සිඳීම අරමුණු වන විට පෙර අත් නො දුටු බලවත් සැපයක් සිතට දැනේ.)

**6.** **අධිමොක්ඛ** - බලවත් ශ්‍රද්ධාව (සංස්කාර ධර්මයන්ගේ යථාස්වභාවය තමාගේ ම නුවණට අරමුණු වන විට තෙරුවන් පිළිබඳ ව පෙර නො තිබුණු බලවත් ශ්‍රද්ධාවක් ඇති වේ.)

**7.** **පග්ගහ** - වීර්යය (සංස්කාර ධර්මයන්ගේ යථාස්වභාවය නුවණින් දකින විට සසර දුකින් මිදෙනු පිණිස නො කඩවා

භාවනා කර ගෙන යාමට පෙර නො තිබුණු බලවත් උද්‍යෝගයක් මෙන් ම ලිහිල් නො වූත් දැඩි නො වූත් වීර්යයක් සිතෙහි ඇති වේ.)

**8.** උපට්ඨාන - <u>සිහිය</u> (විදර්ශනා සම්ප්‍රයුක්ත වූ සිහිය බලවත් ලෙස ඇති වන අතර අතීත - අනාගත - වර්තමාන යන කාලත්‍රයට අයත් අවශ්‍ය සෑම අරමුණක් ම විදර්ශනා නුවණින් මෙනෙහි කිරීමට තරම් සිහිය පිරිසිදු ව, අචල ව පවතී.)

**9.** උපේක්ඛා - <u>මැදහත් බව</u> [උපේක්ෂාව] (සංස්කාර ධර්මයන්ගේ ත්‍රිලක්ෂණය මනා ව වැටහෙන විට එම සංස්කාර ධර්ම පිළිබඳ ව මධ්‍යස්ථ වීම් වශයෙන් විදර්ශනා උපේක්ෂාව ඇති වේ. එමෙන් ම මනෝද්වාරයෙහි ආවර්ජන උපේක්ෂාව ද බලවත් වේ.)

**10.** නිකන්ති - <u>ඇල්ම</u> (මෙසේ ආලෝකය, ඥානය, ප්‍රීතිය බඳු ගුණයන්ගෙන් යුක්ත ව විදර්ශනාව දියුණු වන විට ඒ පිළිබඳ ව සියුම් වූ ඇල්මක් සිතෙහි ඇති වේ.)

'මාහට මින් පෙර මෙබඳු ආලෝකයක්, ඥානයක් ඇති වූයේ නැත. මෙබඳු ප්‍රීතියක් - සන්සිඳීමක් - සුවයක් - බලවත් ශ්‍රද්ධාවක් - වීර්යයක් - සතියක් - උපේක්ෂාවක් ඇති වූයේ නැත. ඒකාන්තයෙන් මාර්ගයට පත් වීමි; ඵලයට පත් වීමි' යනුවෙන් මෙම විදර්ශනා උපක්ලේශයන්ට මුළා වන යෝගාවචරයා ලෝකෝත්තර මාර්ගය නො ලබා ම 'මම මාර්ගය ලැබුවෙමි'යි කියා ද ලෝකෝත්තර ඵලය නො ලබා ම 'මම ඵලය ලැබුවෙමි'යි කියා ද වරදවා ගන්නට ඉඩ තිබේ. මෙසේ ලෝකෝත්තර ආර්‍යමාර්ගය හා ඵලය නො ලබා ම මාර්ගය හා ඵලය ලබන ලදැ' යි කියා මුළා වීමෙන් විදර්ශනා මාර්ගයෙන් බැහැර වීම සිදු වේ. එවිට එම යෝගාවචරයා මූලකර්මස්ථානය අත්හැර එම උපක්ලේශයන් පිළිබඳ ඇලීමෙන් (තණ්හාවෙන්) යුතු ව අසුන් ගෙන හිඳිනු ඇත. මෙහි ලා ආලෝකය ආදි මුල් උපක්ලේශ නවය උපක්ලේශ වස්තු විනා අකුසල ධර්ම නො වේ. එහෙත් විදර්ශනාව කෙරෙහි ඇති වන ඇල්ම හෙවත් 'නිකන්තිය' උපක්ලේශ වස්තුවක් මෙන් ම උපක්ලේශයක් ද වේ. මෙම දශවිධ උපක්ලේශ තණ්හා - දිට්ඨි - මාන යන ග්‍රහණ තුනෙන් ගුණ වීමෙන් 'ග්‍රහණ' වශයෙන් තිස්-ආකාර වේ. දක්ෂ නො වූ යෝගාවචරයා මෙම ආලෝකය (ඕභාස) ආදි උපක්ලේශ

හටගත් කල්හි එම ආලෝකය 'මම ය - මාගේ ය - මාගේ ආත්මය ය' යනුවෙන් වරදවා ගැනීමෙන් සැලීමට වික්ෂේපභාවයට පත් වේ.

එහෙත් නුවණැති දක්ෂ යෝගාවචරයා ආලෝක ආදිය ඇති වූ කල්හි 'එම ආලෝකය ද අනිත්‍ය ය; හේතු - ඵල වශයෙන් හටගත් ධර්මතාවක් බැවින් එම ආලෝකය ද ක්ෂය වී යන්නේ ය; නැති වී යන්නේ ය; එහි ද නො ඇලිය යුතු වන්නේ ය; ආත්ම වශයෙන් නො ගත යුතු වන්නේ ය; පැවතී නිරුද්ධ වන බැවින් එම ආලෝකය අනිත්‍ය ය; හටගැනීම් - බිඳීම් වශයෙන් සත්ත්වයා පෙළන බැවින් දුකට අයත් ය; එනිසා ම එම ආලෝකය ද මම - මාගේ - මාගේ ආත්මය වශයෙන් ගත යුත්තක් නො වන්නේ ය' යනුවෙන් විදර්ශනාවට නංවා බලයි. එසේ ම ඥාන - ප්‍රීති ආදි සෙසු ධර්මයන් ද මාර්ගය ලෙස වරදවා නො ගනී. මෙසේ මෙම තිස් ආකාර වූ උපක්ලේශයන් දුරු කළ දක්ෂ යෝගාවචරයා ආලෝක ආදිය විදර්ශනා මාර්ගය නො වන බව වටහා ගෙන නිවැරදි ලෙස විදර්ශනාඥාන ලැබෙන මාර්ගය විනිශ්චය කර ගැනීම <u>මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය</u> යි.

මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය අයත් වනුයේ ලෞකික පරිඥා තුනෙන් තීරණපරිඥාවට ය. 'තීරණපරිඥා' යනු සංස්කාර ධර්මයන්ගේ සාමාන්‍ය ලක්ෂණ (එනම්, අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ලක්ෂණ) දැකීමේ නුවණ ය. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය සම්පූර්ණ වන විට සම්මසනඤාණය හා උදයබ්බයඤාණය සම්පූර්ණ වේ. මේ වන විට යෝගාවචරයා ආර්යසත්‍ය තුනක් පිළිබඳ ව ලෞකික විදර්ශනා නුවණින් මනා ව වටහා ගෙන සිටියි. එනම්, දිට්ඨිවිසුද්ධිය සම්පූර්ණ කර ගැනීමෙන් දුක්ඛ-සත්‍යය ද කඞ්ඛාවිතරණවිසුද්ධිය සම්පූර්ණ කර ගැනීමෙන් සමුදය-සත්‍යය ද මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය සම්පූර්ණ කර ගැනීමෙන් මාර්ග-සත්‍යය ද (ලෞකික වශයෙන්) මනා ව නුවණින් වටහා ගැනීමට මෙතෙක් දුරට එම විසුද්ධීන් සම්පූර්ණ කර ගත් යෝගාවචරයා සමත් ව සිටියි.

# 6. පටිපදාඤාණදස්සනවිසුද්ධි

මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය සම්පූර්ණ කර ගත් යෝගාවචරයා සමථ-විපස්සනා වැඩීමට ඇති වන බාධක මගහැර ගනිමින් මනා සිහිනුවණින් යුතු ව දිවා - රාත්‍රී දෙකෙහි ම විදර්ශනා භාවනාවෙහි නියුක්ත වෙමින් පඤ්ච-උපාදානස්කන්ධ ත්‍රිලක්ෂණයට නංවා බලන විට නව මහාවිපස්සනාඤාණ සම්පූර්ණ වේ. 'පටිපදාඤාණදස්සනවිසුද්ධි' නමින් හැඳින්වෙන්නේ මෙම විදර්ශනාඥාන නවය ඇති කර ගැනීම පිළිබඳ ව යි.

1. උදයබ්බයානුපස්සනාඤාණය
2. භඞ්ගානුපස්සනාඤාණය
3. භයතුපට්ඨානඤාණය
4. ආදීනවානුපස්සනාඤාණය
5. නිබ්බිදානුපස්සනාඤාණය
6. මුඤ්චිතුකම්‍යතාඤාණය
7. පටිසඞ්ඛානුපස්සනාඤාණය
8. සඞ්ඛාරුපේක්ඛාඤාණය
9. සච්චානුලෝමිකඤාණය

සෝතාපන්න මාර්ග සිත සහ ඵල සිත ලැබෙන්නේ මෙම විදර්ශනාඥාන බලවත් ලෙස අනුපිළිවෙලින් පහළ වීමෙනි. එනිසා චතුරාර්යසත්‍යය අවබෝධ කර ගැනීමට උත්සාහවත් වන යෝගාවචරයෝ මෙම විදර්ශනාඥාන පිළිබඳ ව ධර්මය තුළින් හදුරා දැනගෙන එම ඥාන ලැබෙන පිළිවෙළට ම විදර්ශනා භාවනාව ප්‍රගුණ කිරීමට වෑයම් කරත්වා!

## [6:1] උදයබ්බයානුපස්සනාඤාණය

පටිපදාඤාණදස්සනවිසුද්ධියට අයත් වන විදර්ශනාඥාන ඇති කර ගැනීමට උත්සාහවත් වන යෝගාවචරයා ඒ සඳහා නැවතත් උදයබ්බයඤාණය දියුණු කර ගැනීම පිණිස වෑයම් කළ යුතු ය. පළමු ව ඇති කර ගත් උදයබ්බයඤාණය නැවත දියුණු කර ගැනීම පිණිස වෑයම් කළ යුත්තේ ඇයි? ඉහත කී විදර්ශනා - උපක්ලේශ ඇති වීමෙන් උදයබ්බයඤාණය දුර්වල ව ගිය

නිසා ය. දුර්වල ව ගිය උදයබ්බයඤාණයෙන් සංස්කාර ධර්මයන්ගේ ත්‍රිලක්ෂණය මැනවින් සලකා ගැනීමට නුපුළුවන. එනිසා යෝගාවචරයා ඉහත මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධිය යටතේ විස්තර කෙරුණු ආකාරයට රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන පඤ්ච-උපාදනස්කන්ධයන්ගේ සමුදය (ඇති වීම), වය (නැති වීම) දකිමින් උදයබ්බයඤාණය නැවතත් බලවත් කර ගත යුතු ය.

සංස්කාර ධර්මයන්ගේ උදය (ඇති වීම), වය (නැති වීම) පැහැදිලි ව මෙනෙහි නො කරන කල්හි ද සන්තතියෙන් වැසී යාම (නාම-රූප ධර්ම අඛණ්ඩ ව පවතින එක ම ප්‍රවාහයක් සේ පෙනීම) නිසා ද අනිත්‍ය ලක්ෂණය අවබෝධ නො වේ. සංස්කාර ධර්ම නිසා නිරතුරු ව ම පවතින පීඩාව මෙනෙහි නො කරන කල්හි ද නිතර සතර ඉරියවු වෙනස් කිරීම නිසා ද දුක්ඛ ලක්ෂණය ප්‍රකට නො වේ. චක්ඛුධාතු ආදි නොයෙක් ධාතූන් වෙන් කොට මෙනෙහි නො කරන කල්හි ද ඝනසංඥාවෙන් (සන්තති, සමූහ, ආරම්මණ, කිච්ච යන ඝන සතර) වැසී යාම නිසා ද අනාත්ම ලක්ෂණය අවබෝධ නො වේ.

සංස්කාර ධර්මයන්ගේ උදය (ඇති වීම), වය (නැති වීම) නුවණින් සම්මර්ශනය කරන විට අනිත්‍ය ලක්ෂණය වසා ගෙන පැවති සන්තති ඝනය (එනම්, නාම-රූප ධර්ම අඛණ්ඩ ව පවතින එකම ප්‍රවාහයක් සේ පෙනෙන පරම්පරා සම්බන්ධය) සිතින් දුරු වී යයි. එවිට අනිත්‍ය ලක්ෂණය ඇති සැටියෙන් ම ප්‍රකට ව වැටහේ.

එක් ඉරියවුවක සිටින විට නාම-රූප ධර්ම නිසා ඇති වන පීඩාව ඉරියවුව වෙනස් කළ කල්හි නැති වී යයි. එබැවින් ඉරියාපථ හෙවත් ඉරියවුවල පැවැත්ම දුක්ඛ ලක්ෂණය ආවරණය කරන්නකි. එහෙත් උදය-වය වශයෙන් සංස්කාර ධර්මයන්ගේ ඇති වීම් - නැති වීම් දකින යෝගාවචරයාට ඉරියවු වෙනස් වීම් සඞ්ඛ්‍යාත ඉරියාපථයෙන් දුක්ඛ ලක්ෂණය ආවරණය නො වේ. සංස්කාර (නාම-රූප) ධර්මයන්ගේ ඉපදීම්-බිඳීම් දෙක මැනැවින් දකින යෝගාවචරයාට නිරතුරු ව ඇති වන සංස්කාරයන්ගේ පීඩාව පහසුවෙන් මනසිකාර කළ හැකි

වේ. එවිට දුක්ඛ ලක්ෂණය ඇති සැටියෙන් ම ප්‍රකට වේ.

ස්කන්ධයන්ගේ පැවැත්ම සැකසී තිබෙන්නේ පඨවීධාතු ආදි නොයෙක් ධාතූන්ගේ සමවායෙනි. එම ධාතූන් වෙන් වෙන් වශයෙන් නො දකින තැනැත්තා ඒ සියල්ල ඝනසංඥවෙන් වරදවා ගෙන ස්කන්ධයන් වනාහි සත්ත්වයෙක, පුද්ගලයෙක, ආත්මයකැ'යි වරදවා ගනී. එහෙත් උදය-වය පිළිබඳ ඥනය ඇති කර ගත් යෝගාවචරයාගේ එම ඥනය යොමු වී පවතින්නේ නොයෙක් ධාතූන් විෂයෙහි ය. ඒ අනුව ස්කන්ධයන් සෑදී තිබෙන පඨවීධාතු ආදි නොයෙක් ධාතූන්ගේ උදය-වය දකින යෝගාවචරයාට ඝනසංඥව දුරු වී ගොස් අනාත්ම ලක්‍ෂණය ඇති සැටියෙන් ම ප්‍රකට වේ.

## [6:2] භඞ්ගානුපස්සනාඤාණය

මෙලෙස පඤ්ච-උපාදනස්කන්ධයන්ට අයත් නාම-රූප ධර්ම අනිත්‍ය - දුක්ඛ - අනාත්ම වශයෙන් විදර්ශනාවට නංවා බලන යෝගාවචරයාට විදර්ශනා නුවණ තියුණු වී ගොස් සංස්කාර ධර්ම වහා හටගෙන බිඳී යන අයුරු පෙනේ. සංස්කාරයන්ගේ උදය-වය හා ත්‍රිලක්‍ෂණය ඉතා ම ප්‍රකට ව වැටහෙන්නට වූ කල්හි සංස්කාරයන්ගේ හටගැනීම - ස්ථිතිය - පැවැත්ම - නිමිත්ත යන ආකාර අරමුණු නො වී සංස්කාරයන්ගේ බිඳීම, ක්‍ෂය වීම, නිරුද්ධ වීම ම යෝගාවචරයාගේ සිතට අරමුණු වීමට පටන් ගනී. මෙලෙස හේතු-ප්‍රත්‍යයයන්ගෙන් හටගන්නා සංස්කාර වහා නිරුද්ධ වී, බිඳී ක්‍ෂය වී යන ආකාරය දකින යෝගාවචරයාට එම අවබෝධය තියුණු වූ අවස්ථාවේ දී භඞ්ගානුපස්සනා නම් විදර්ශනාඥනය ඇති වේ.

එම භඞ්ගානුපස්සනාඤාණය තව දුරටත් බලවත් වීම සඳහා යෝගාවචරයා වර්තමානයට අයත් රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන සංස්කාරයන්ගේ බිඳී යාම විදසුන් නුවණින් බැලිය යුතු ය. එම ස්කන්ධයන්ගේ බිඳීම දකින්නා වූ විදසුන් සිත ද බිඳී යන අයුරු තවත් සිතකින් විදර්ශනා කළ යුතු ය. අනතුරු ව තමාට ප්‍රත්‍යක්‍ෂ වූ වර්තමාන ස්කන්ධයන්ගේ නිරෝධය (භඞ්ගය) සාක්‍ෂ්‍ය කොට ගනිමින් අතීතයේ පැවතී බිඳී ගියා වූ ද අනාගතයෙහි හටගන්නා වූ ද

සියලු සංස්කාරයන්ගේ නිරෝධය විදර්ශනා නුවණින් දක ගත යුතු ය.

මෙලෙස භඞ්ගානුපස්සනාඥාණය ඇති කර ගැනීමෙන් සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණය අවබෝධ වන විට යෝගාවචරයා සංස්කාර ධර්ම පිළිබඳ ව බලවත් ලෙස කලකිරේ. එම යෝගාවචරයාට සංස්කාර පිළිබඳ ව 'නන්දි' හෙවත් සප්‍රීතික තෘෂ්ණාව ඇති නො වේ. සංස්කාර පිළිබඳ රාගය දුරු වෙමින් සිතෙහි විරාගය ඇති වේ. මෙලෙස භඞ්ගානුපස්සනා විදර්ශනාඥානය ඇති කර ගත් යෝගාවචරයා එම ලෞකික විදර්ශනාඥානයෙන් රාගය (තදඞ්ග වශයෙන්) දුරු කරයි. තෘෂ්ණාව වැඩෙන්නට ඉඩ නො දෙයි. සංස්කාර ධර්මයන්ගේ බිඳීම ම දකින යෝගාවචරයාට හුදෙක් සංස්කාර ධර්මයන් ම හටගෙන බිඳී යන බවත් මෙම පඤ්ච-උපාදානස්කන්ධ තුළ සත්ත්ව - පුද්ගල - ආත්ම වශයෙන් ගත යුතු කිසිවක් ම නැති බවත් වඩාත් ප්‍රකට ව අවබෝධ වේ. එම අවබෝධය තුළින් යෝගාවචරයාගේ සිත නිවනට නැඹුරු වේ.

භඞ්ගානුපස්සනාව දියුණු වූ යෝගාවචරයාට සංස්කාර බිඳී යනු පෙනෙන්නේ දුබල මැටි බඳුනක් බිඳී යන පරිද්දෙනි. එමෙන් ම සියුම් දූවිලි රැසක් විසිරී යන පරිද්දෙනි. වර්ෂාව පවතින අවස්ථාවක ගං ඉවුරක සිටින මනුෂ්‍යයෙකුට වැසි බිඳු පතිත වීමෙන් ගඟ දිය මතුපිට හටගන්නා දියබුබුළු වහා බිඳී යනු පෙනෙන්නේ යම් සේ ද භඞ්ගානුපස්සනාව දියුණු වූ යෝගාවචරයාට සංස්කාර ධර්ම බිඳී යනු පෙනෙන්නේ ද එපරිද්දෙනි.

මෙම තත්ත්වයට භඞ්ගානුපස්සනාඥාණය දියුණු වූ කල්හි එම යෝගාවචරයාට ආනිසංස ධර්ම අටක් ලැබේ.

1. 'සදතනික පැවැත්මක් ඇතැ'යි යනුවෙන් වරදවා ගන්නා භව (ශාශ්වත) දෘෂ්ටිය දුරු වේ.
2. ජීවිතයට තිබෙන ඇල්ම (ජීවිතාශාව) දුරු වේ.
3. සසර දුකින් මිදෙනු පිණිස නිරතුරු ව භාවනා කිරීමෙහි යෙදී සිටියි.
4. පිරිසිදු දිවිපැවැත්මෙන් (ආජීවයෙන්) යුක්ත වෙයි.

5. බාහිර කටයුතු පිළිබඳ උත්සාහය දුරු වී යයි.
6. බිය දුරු වී යයි.
7. ඉවසීම හා යටහත් - සුවච බව ඇති වේ.
8. අරති - රති මැඩලීමේ හැකියාව ඇති වේ.

**[6:3] භයතුපට්ඨානඤාණය**

සියලු සංස්කාර ධර්මයන්ගේ ක්‍ෂය වීම - විනාශ වීම - බිඳීම - නිරුද්ධ වීම විදර්ශනා නුවණින් අරමුණු කරමින් භඞ්ගානුපස්සනාඤාණය ඇති කර ගත් යෝගාවචරයාට එම භඞ්ගානුපස්සනාඤාණය තව දුරටත් වඩන විට සියලු භව - ගති - ඨිති - සත්තාවාස යනාදි වශයෙන් ප්‍රභේද වූ සංස්කාර ධර්ම පිළිබඳ ව මහත් වූ බියක් ඇති වේ. සුව සේ ජීවත් වීමට කැමති බියජනක මනුෂ්‍යයෙකුට සිංහ - ව්‍යාඝ්‍ර - දිවි - වලස් - යක්‍ෂ - රාක්‍ෂ - නපුරු බලු - ගොන් - අලි - ඇතුන් - විෂඝෝර සර්පයන් ආදි සත්ත්වයන් හා හෙණ පිපිරීම් - සොහොන් - යුදබිම් - ගිනි අඟුරු වළවල් ආදිය දුටු විට බියක් ඇති වන්නේ යම් සේ ද එලෙස ම සංස්කාරයන්ගේ ආදීනව දකින යෝගාවචරයා සංස්කාර පිළිබඳ ව මහත් සේ බිය වෙයි. 'අතීතයෙහි පැවති සංස්කාර ද නිරුද්ධ ව ගියේ ය. වර්තමානයෙහි දත් පවතින සංස්කාර ද ක්‍ෂණයකින් නිරුද්ධ වෙයි. අනාගතයෙහි හටගන්නා වූ සංස්කාර ද එසේ ම නිරුද්ධ වී යන්නේ ය' යනුවෙන් විදර්ශනා නුවණින් දකින යෝගාවචරයාට එම අවස්ථාවෙහි දී ඇති වන විදර්ශනාඥනය <u>භයතුපට්ඨානඤාණය</u> යි. මේ පිළිබඳ ව දක්වෙන උපමාවක් මෙසේ යි. එක් ස්ත්‍රියකගේ පුතුන් තිදෙනෙකු වැරදි කරන ලදු ව රජු විසින් ඔවුන්ගේ හිස් සිඳ දැමීමට නියෝග කරන ලදී. පුතුන් සමගින් වධකස්ථානයට ගියා වූ එම ස්ත්‍රිය, රාජපුරුෂයන් විසින් තම වැඩිමහලු පුතුගේ හිස සිඳ දෙවැනි පුතුගේ ද හිස සිදීමට ආරම්භ කළ කල්හි තම කනිටු පුතු පිළිබඳ ඇල්ම අත්හැර දැම්මා ය. (කනිටු පුතු ද අනතුරු මොහොතෙහි මිය යන බැවිනි.) එපරිද්දෙන් ම යෝගාවචරයා විසින් අතීත සංස්කාර බිඳී ගිය අයුරු නුවණින් දැකීම, එම ස්ත්‍රිය විසින් තම වැඩිමහලු පුතුගේ සිඳින ලද හිස දැකීම බඳු ය. දෙවැනි පුතුගේ හිස සිඳිනු ලබන අයුරු එම ස්ත්‍රිය විසින් දැක ගනු ලබන්නේ යම් සේ ද

එලෙසින් යෝගාවචරයා විසින් වර්තමාන සංස්කාර බිඳී යන අයුරු විදසුන් නුවණින් දක ගනු ලැබේ. එම ස්ත්‍රිය, අනතුරු ව වධයට කැප වන තම කනිටු පුතු පිළිබඳ ඇල්ම අත්හැර දමන්නේ යම් සේ ද එලෙසින් යෝගාවචරයා විසින් අනාගතයේ හටගන්නා වූ සංස්කාර ද බිඳී යන අයුරු විදර්ශනා නුවණින් දක අනාගතය පිළිබඳ ඇල්ම අත්හරිනු ලැබේ. මෙම අවබෝධය සපිරෙන අවස්ථාව <u>භයතුපට්ඨානඤාණය</u> යි.

භයතුපට්ඨානඤාණය ඇති කර ගත් යෝගාවචරයා සංස්කාරයන්ට බිය වන්නේ නපුරු සතෙකු, යක්ෂයෙකු දුටු කල තැති ගන්නා භීරුක පුද්ගලයෙකු මෙන් නොව හුදෙක් ආදීනව නුවණින් දැකීම් වශයෙන් පමණි. එනම්, 'අතීත සංස්කාර සියල්ල නිරුද්ධ විය. වර්තමාන සංස්කාර ද නැති ව යයි. අනාගත සංස්කාර ද එලෙස ම නැති ව යන්නේ ය' යනුවෙන් සංස්කාරයන්ගේ යථාස්වභාවය තීරණය කර ගැනීම ම මෙහි ලා සංස්කාරයන්ට බිය වීම යනුවෙන් අදහස් කෙරේ. නුවර දොරටුව සමීපයෙහි තිබෙන ගිනිඅඟුරු වළවල් තුනක් දකින මිනිසෙක්, 'මේවාට වැටෙන යමෙක් වේ ද ඔහු විනාශයට පත් වන්නේ ය' යනුවෙන් තීරණය කරයි. එපරිද්දෙන් ම සංස්කාරයන්ගේ බිඳීම දකින යෝගාවචරයා භවත්‍රයට අයත් අතීත - වර්තමාන - අනාගත යන කාලත්‍රයට සඞ්ග්‍රහ වන සියලු සංස්කාර බිඳී යන අයුරු නුවණින් දකියි. එනිසා හෙතෙම තව දුරටත් සංස්කාර ප්‍රිය නො කරයි. සංස්කාර නැවත නැවතත් හටගැනීම පිළිබඳ ව බිය වෙයි. එය <u>භයතුපට්ඨානඤාණය</u> යි.

## <u>[6:4] ආදීනවානුපස්සනාඤාණය</u>

විදර්ශනා භාවනාව මැනවින් ප්‍රගුණ කරමින් ඉහත සඳහන් භයතුපට්ඨානඤාණය ඇති කර ගත් යෝගාවචරයාට සියලු භවයන්හි පිහිටක් රැකවරණයක් නැති බව ප්‍රත්‍යක්ෂ වේ. සියලු භවයන්ට අයත් කිසිදු සංස්කාරයක් නො පතන එම යෝගාවචරයාට භවත්‍රය පිළිබඳ ව වැටහෙන්නේ ගිනිදැල් නිවුණු ගිනිඅඟුරු වළක් පරිද්දෙනි. තව ද එම යෝගාවචරයාට සතර මහාභූතයන් උග්‍ර විෂඝෝර සර්පයන් සිවුදෙනෙකු ලෙසත් පඤ්චස්කන්ධ වනාහි ඔසවා ගත් කඩු ඇති ව លුහුබැඳ එන වධකයන් පස්දෙනෙකු ලෙසත් ආධ්‍යාත්මික ආයතන හය

පාළු-ගමක් ලෙසත් බාහිර ආයතන හය ගම් පහරන සොරුන් ලෙසත් සප්ත-විඤ්ඤාණට්ඨිති, නව-සත්තාවාස ආදිය එකොළොස් ගින්නෙන් ඇවිළී ඇති ලෙසත් වැටහේ. සියලු සංස්කාර ගඬුවක් (පිළිකාවක්), රෝගයක්, උලක්, පීඩාවක් (විපතක්), ආබාධයක් ආදි වශයෙන් ආස්වාද රහිත වූ මහත් ආදීනව රැසක් ලෙස වැටහේ. එය සුව සේ ජීවත් වනු කැමති භීරුක(බියසුලු) මිනිසෙකු චණ්ඩ වන සතුන් සහිත රමණීය වනයකට පැමිණීම මෙනි. චණ්ඩ වන සතුන් සහිත රමණීය වනයකට පැමිණි භීරුක(බියසුලු) මිනිසා බියෙන් තැති ගෙන හාත්පස බලනුයේ වනයේ ආදීනව ම දකියි. එලෙස ම විදර්ශනා වඩන යෝගාවචරයා ද භඞ්ගානුපස්සනාඤාණය ඇති කර ගෙන සංස්කාරයන්ගේ බිඳී යාම නුවණින් දකිමින් සියලු සංස්කාරයන් පිළිබඳ ව බිය වන කල්හි එම සංස්කාර පිළිබඳ ව නීරසාකාරයෙන් (ආස්වාද රහිත ලෙසින්) විදර්ශනා නුවණින් දැකීම, ආදීනවඤාණය යි. එය මෙසේ විස්තර වශයෙන් දක්වෙයි.

"සංස්කාරයන්ගේ හටගැනීම බියක් ලෙස දැකීම භයතුපට්ඨානඤාණය යි. එම බියට පිහිට වන කිසිවක් සංස්කාර තුළ නැති බව වැටහීම ආදීනවඤාණය යි. එනිසා සංස්කාරයන් හට නො ගැනීම හෙවත් නූපදීම ක්ෂේමයකැ'යි (නිර්භයභාවයකැ'යි) දැකීම ශාන්ත පදය වූ නිවන පිළිබඳ ඥානය යි." මෙලෙස,

1. උප්පාද (හටගැනීම)
2. පවත්ති (කෙලෙසුන්ගේ හා සංස්කාරයන්ගේ පැවැත්ම)
3. නිමිත්ත (ආකාරය)
4. ආයූහන (කර්ම රැස්වීම)
5. පටිසන්ධි (නැවත භවයෙහි ප්‍රතිසන්ධිය ලැබීම)

යන සංස්කාරයන් පිළිබඳ වූ මෙම කරුණු බියක් වශයෙන් ද ඒ සියල්ල නැති වීම, අභාවයට-නිරෝධයට යාම සැපක් වශයෙන් ද අවබෝධ කර ගත් යෝගාවචරයා විසින් ආදීනවඤාණය පිළිබඳ ව හා සන්තිපදඤාණය (එනම් ශාන්ත පදය වූ නිවන පිළිබඳ නුවණ) පිළිබඳ ව දස ආකාරයකින් කුසලතාව ඇති කර ගැනීමෙන් ආදීනවඤාණය ලබන ලද්දේ

වෙයි.

මෙලෙස ආදීනවඤාණය ඇති කර ගත් යෝගාවචරයා නොයෙක් දෘෂ්ටීන් නිසා සැලෙන්නේ නැත. තව ද එම යෝගාවචරයා විසින් සංස්කාර ධර්මයන්ගේ හටගැනීම, පැවැත්ම, නිමිත්ත, කර්ම රැස්වීම හා නැවත ප්‍රතිසන්ධිය දකින්නේ මෙලෙස ය. එනම්, සුව සේ ජීවත් වනු කැමති භීරුක(බියසුලු) මනුෂ්‍යයෙකු නපුරු සතුන් සහිත වනයකට පැමිණි කලෙක මෙන් ද දිවියන් සහිත ගුහාවකට පැමිණි කලෙක මෙන් ද කිඹුලන්-රකුසන් අරක්ගත් නදියකට පැමිණි කලෙක මෙන් ද කඩු ගත් සතුරන් පිරිසකට මැදි වූ කලෙක මෙන් ද විෂ සහිත බොජුනක් ලැබුණු කලෙක මෙන් ද සොරුන් රැක සිටින මාර්ගයක් මෙන් ද දල්වෙන ගිනිඅඟුරු වළක් මෙන් ද සටනෙහි යෙදුණු සෙබළුන් සහිත යුදබිමක් මෙන් ද වශයෙනි. මෙසේ විදර්ශනා වඩන නුවණැති යෝගාවචරයා භවත්‍රයෙහි ක්ෂේම භූමියක් නො දකිමින් සියලු සංස්කාර ආදීනව රැසක් ලෙස අවබෝධ කර ගනී. සංස්කාර නිරෝධය හෙවත් නිවන ම පරම සැපයක් ලෙස දකියි.

**<u>[6:5] නිබ්බිදානුපස්සනාඤාණය (කලකිරීමේ නුවණ)</u>**

විදර්ශනා නුවණ මුහුකුරවා ගැනීමෙන් ආදීනවානුපස්සනාඤාණය ඇති කර ගත් යෝගාවචරයා සියලු සංස්කාරයන්ගේ ආදීනව අවබෝධ කර ගැනීම නිසා භවත්‍රයෙහි ම කලකිරෙයි. භවත්‍රය පිළිබඳ ව සතුටු නො වෙයි. එය <u>නිබ්බිදානුපස්සනාඤාණය</u> යි. රනින් කළ කූඩුවක සිර කොට සිටින සිංහයා එහි විසීමට සතුටු නො වෙයි. සිංහයා කැමති වන්නේ වනයෙහි නිදහසේ සිටීමට යි. එලෙස ම සංස්කාරයන්ගේ ආදීනව අවබෝධ කර ගත් යෝගාවචරයා භවත්‍රයෙහි සිර වී සිටීමට කැමති නො වෙයි. එම යෝගාවචරයා සතුටු වන්නේ සියලු සංස්කාරයන්ගෙන් වහා මිදී නිර්වාණ අභය පුරයට, ක්ෂේම භූමියට පත් වීමට යි. එනිසා මෙලෙස නිබ්බිදානුපස්සනාඤාණය ඇති කර ගත් යෝගාවචරයා සංස්කාර නිරෝධයෙහි හෙවත් නිවනෙහි ඇති සැනසිල්ල දකිමින් නිරන්තරයෙන් සමථ - විදර්ශනා භාවනාවෙහි ම සිත් අලවා වාසය කරයි.

## [6:6] මුඤ්චිතුකමයතාඤාණය (සංස්කාරයන්ගෙන් මිදෙනු කැමති නුවණ)

ඉහත සඳහන් භයතුපට්ඨානඤාණය, ආදීනවානුපස්සනාඤාණය, නිබ්බිදනුපස්සනාඤාණය යන ඥාන තුන ම අර්ථ වශයෙන් එකක් ම ය. සියලු සංස්කාර මහත් වූ භයක් ලෙස දැකීම භයතුපට්ඨානඤාණය යි. සංස්කාරයන්ගේ මහත් වූ ආදීනව වැටහීම ආදීනවානුපස්සනාඤාණය යි. සංස්කාර පිළිබඳ ව කලකිරීම නිබ්බිදනුපස්සනාඤාණය යි. සංස්කාරයන් පිළිබඳ එම නිබ්බිදනුපස්සනාඤාණය හෙවත් කලකිරීමේ නුවණ ඇති කර ගත් යෝගාවචරයා භවත්‍රයට අයත් සියලු සංස්කාරයන්ගෙන් මිදෙන්නට නිදහස් වන්නට ඒකාන්තයෙන් ම කැමති වෙයි. ඒ පිළිබඳ ව උපමාවකින් දක්වන්නේ නම්, ඒ මෙසේ යි. එනම්, දැලට කොටු වූ මත්ස්‍යයෙකු, සර්පයෙකුගේ මුවට හසු වූ මැඩියෙකු, කූඩුවක දමන ලද වලිකුකුළෙකු, උගුලකට හසු වූ මුවෙකු, අහිකුණ්ඨිකයෙකුට හසු වූ සර්පයෙකු, මඩෙහි එරුණු ඇතෙකු, ගුරුළෙකුට හසු වූ නාග රාජයෙකු, සතුරන්ට මැදි වූ මනුෂ්‍යයෙකු එම උවදුරෙන් මිදෙන්නට කැමති වන්නේ යම් සේ ද එපරිද්දෙනි. මෙසේ විදර්ශනා වඩන යෝගාවචරයා සංස්කාරයන්ගේ ආදීනව අවබෝධ කර ගෙන කලකිරීම නිසා සියලු සංස්කාරවලින් නිදහස් වීමට බලවත් සේ කැමති වෙයි. සංස්කාරවලින් මිදී සංස්කාර නිරෝධය හෙවත් නිවනට පත් වනු කැමති වෙයි. මෙය <u>මුඤ්චිතුකමයතාඤාණය</u> යි.

## [6:7] පටිසඞ්ඛානුපස්සනාඤාණය

සියලු සංස්කාරයන්ගේ ආදීනව දැක සියලු සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමති යෝගාවචරයා සංස්කාරයන් වෙතින් මිදීම සඳහා එම සංස්කාර නැවත ත්‍රිලක්ෂණයට නංවා බැලිය යුතු ය. සංස්කාර ධර්මයන්ගේ නිරන්තර ඇති වීම - නැති වීම හෙවත් අනිත්‍යය දැකීමෙන් නිත්‍යසංඥාවෙන් සිත මිදෙයි. සංස්කාරයන් නිසා නිරන්තරයෙන් පවතින පීඩාව හෙවත් දුක්ඛ ලක්ෂණය දැකීමෙන් සුඛසංඥාවෙන් සිත මිදෙයි. සංස්කාරයන්ගේ පිළිකුල් බව හෙවත් අසුභ ලක්ෂණය දැකීමෙන් සුභසංඥාවෙන් සිත මිදෙයි. සංස්කාරයන් තුළ මමත්වයෙන් ගත යුතු කිසිවක්

නැති බව හෙවත් අනාත්ම ලක්ෂණය දැකීමෙන් ආත්මසංඥාවෙන් සිත මිදෙයි. මෙලෙස නිත්‍ය - සුඛ - සුභ - ආත්ම යන විපරීත සංඥාවලින් සිත මුදවා ගෙන පැහැදිලි ලෙස ම සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය - දුක්ඛ - අසුභ - අනාත්ම ලක්ෂණ විස්තර වශයෙන් බලවත් විදර්ශනා නුවණින් අවබෝධ කර ගැනීම <u>පටිසඞ්ඛානුපස්සනාඥාණය</u> යි.

## <u>[6:8] සඞ්ඛාරුපේක්ඛාඥාණය</u>

පටිසඞ්ඛානුපස්සනාඥාණයෙන් සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම - අසුභ ලක්ෂණ පැහැදිලි ව අවබෝධ කර ගත් යෝගාවචරයා ඒ අතරින් අවබෝධ කර ගැනීමට දුෂ්කර වූ ද සූක්ෂ්ම වූ ද අනාත්ම ලක්ෂණය වෙත විශේෂ අවධානය යොමු කළ යුතු ය. සඞ්ඛාරුපේක්ඛාඥාණය ඇති කර ගැනීම සඳහා යෝගාවචරයා සංස්කාර ධර්මයන්ගේ ශූන්‍යතාව හෙවත් අනාත්ම ලක්ෂණය පැහැදිලි ලෙස ම අවබෝධ කර ගත යුතු ය. ඒ සඳහා උපකාරී වන ක්‍රම රාශියක් විසුද්ධිමග්ගයෙහි සඳහන් වේ. ඒ සෑම ක්‍රමයකින් ම අවබෝධ කර ගත යුතු වන්නේ රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන ස්කන්ධ පස තුළ නිත්‍ය - සුඛ - සුභ - ආත්ම-සාර වූ කිසිවක් නැත ය, යනුවෙනි. යෝගාවචරයා විසින් විශේෂයෙන් ම ස්කන්ධ පස තුළ මමත්වයෙන්, ආත්මසංඥාවෙන් ගත යුතු කිසිවක් නැති බව විදර්ශනා නුවණින් අවබෝධ කර ගත යුතු ය. මෙලෙස සංස්කාර ධර්මයන්ගේ යථාස්වභාවය ක්‍රමයෙන් අවබෝධ වෙත් ම සංස්කාර පිළිබඳ බිය හා ඇල්ම දුරු වී ගොස් සංස්කාර පිළිබඳ මධ්‍යස්ථභාවයක් සිතෙහි ඇති වේ. ඒ පිළිබඳ ව විසුද්ධිමග්ගයෙහි දක්වෙන උපමාව මෙසේ යි. එක් පුරුෂයෙකුට ඉතා ප්‍රිය-මනාප බිරිඳක් වූ අතර ඔහු එම බිරිඳගෙන් වෙන් ව මොහොතක් හෝ ගත කිරීමට නො කැමති වෙයි. ඒ තරමට ම භාර්යාව ඔහුට ප්‍රිය බැවිනි. එහෙත් ඔහුගේ බිරිඳ පසු කලෙක වෙනත් පුරුෂයෙකු සමගින් සබඳතා පවත්වනු දැක එම පුරුෂයා බලවත් දොම්නසට පත් වෙයි. තම බිරිඳ ගැන කලකිරුණු එම පුරුෂයා ඇයව අත්හැර දමා ඇයගෙන් නිදහස් විය. බිරිඳගෙන් නිදහස් වූ එම පුරුෂයා පෙර

තම බිරිඳ ව සිටි ස්ත්‍රිය දුන් අන්‍ය පුරුෂයෙකු සමග සිටිනු දැකීමෙන් දුකට දොම්නසට පත් නො වෙයි. එයට හේතුව එම ස්ත්‍රිය පිළිබඳ මමත්වයක් දුන් ඔහුට නැති බැවිනි. එලෙස ම සියලු සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමති යෝගාවචරයා පටිසඞ්ඛානුපස්සනාඤාණයෙන් සංස්කාරයන්ගේ ත්‍රිලක්ෂණය විදර්ශනා නුවණින් විමසනුයේ 'මම ය, මාගේ ය' යනුවෙන් ගත යුතු කිසිවක් නො දැක බිය හා ඇල්ම දුරු කොට සියලු සංස්කාරයන් පිළිබඳ ව උදාසීන වෙයි. මධ්‍යස්ථ වෙයි.

පටිසඞ්ඛානුපස්සනාඤාණයෙන් සංස්කාර ධර්මයන්ගේ ආදීනව පැහැදිලි ව දැක ගත් යෝගාවචරයා සංස්කාර නිරෝධය (නිවන) ශාන්තිපදය සේ දකියි. අනතුරු ව සඞ්ඛාරුපේක්ඛාඤාණය ලැබ සංස්කාර ධර්මයන්ගේ පැවැත්ම පිළිබඳ බිය හා ඇල්ම දුරු කොට සංස්කාර පිළිබඳ ව උපේක්ෂාවට පත් යෝගාවචරයාගේ සිත ශාන්තිපදය වන සංස්කාර නිරෝධය දෙසට යොමු වෙයි. මෙහි දී ඇලීම් - ගැටීම් වශයෙන් සංස්කාර උපාදානය කර ගැනීම පිළිබඳ ව උපේක්ෂාවට පත් යෝගාවචරයාගේ සිත අනිච්චානුපස්සනා - දුක්ඛානුපස්සනා - අනත්තානුපස්සනා යන ත්‍රිවිධානුපස්සනාවන් මුල් කර ගෙන ත්‍රිවිධ විමෝක්ෂමුඛයන්ට යොමු වේ. මෙලෙස සඞ්ඛාරුපේක්ඛාඤාණය ඇති කර ගැනීමෙන් විදර්ශනා භාවනා ප්‍රතිපදාව ලෞකික වශයෙන් මුදුන් පත් වීම 'සිඛාපත්තවිපස්සනා' (විදර්ශනාවේ මුදුන් පැමිණීම), නමින් ද 'වුට්ඨානගාමිනීවිපස්සනා' (ලෝකෝත්තර මාර්ගයට යොමු කරවන විදර්ශනාව) නමින් ද හැඳින් වේ.

ලෝකෝත්තර මාර්ගය 'විමෝක්ෂ' නමින් හැඳින්වෙන්නේ කෙලෙසුන්ගෙන් හා ලෝකයෙන් නික්මීම යන අර්ථයෙනි. එය 'අනිමිත්ත-විමෝක්ෂ', 'අප්පණිහිත-විමෝක්ෂ', 'සුඤ්ඤත-විමෝක්ෂ' වශයෙන් තෙවැදෑරුම් වන අතර එසේ නම් ලබන්නේ එම විමෝක්ෂයන්ට මුල් වන ත්‍රිවිධ අනුපස්සනාවන් නිසා ය. එනම්, අනිච්චානුපස්සනා විදර්ශනාවෙන් (අනිත්‍ය වශයෙන් දැකීමෙන්) සංස්කාරයන්ගේ අනිත්‍ය ලක්ෂණය ප්‍රකට වන කල්හි නිත්‍යසංඥා, නිත්‍ය නිමිති දුරු වී යයි. එනිසා අනිච්චානුපස්සනාව තුළින් නිත්‍ය නිමිති දුරු කෙරෙමින් ලබන

ලෝකෝත්තර මාර්ගය 'අනිමිත්තවිමෝක්ෂ' නම් වේ. දුක්ඛානුපස්සනා විදර්ශනාවෙන් (දුක් වශයෙන් දැකීමෙන්) සංස්කාරයන්ගේ දුක්ඛ ලක්ෂණය ප්‍රකට වන කල්හි සංස්කාර පිළිබඳ ප්‍රාර්ථනා දුරු වී යයි. එසේ දුක්ඛානුපස්සනාව තුළින් සංස්කාර පිළිබඳ ප්‍රාර්ථනා (ප්‍රණිධි), දුරු කෙරෙමින් ලබන ලෝකෝත්තර මාර්ගය 'අප්පණිහිතවිමෝක්ෂ' නම් වේ. අනත්තානුපස්සනා විදර්ශනාවෙන් (අනාත්ම වශයෙන් දැකීමෙන්) සංස්කාරයන් සත්ත්ව - පුද්ගල - ආත්මභාවයන්ගෙන් ශූන්‍ය බව දකියි. එසේ අනත්තානුපස්සනාව තුළින් සංස්කාර ධර්ම සත්ත්ව - පුද්ගල - ආත්මභාවයන්ගෙන් ශූන්‍ය ය'යි දකිමින් ලබන ලෝකෝත්තර මාර්ගය 'සුඤ්ඤතවිමෝක්ෂ' නම් වේ. මෙලෙස ඒ ඒ යෝගාවචරයාට ලෝකෝත්තර මාර්ගය ලැබීමේ දී අනිච්චානුපස්සනාව හෝ දුක්ඛානුපස්සනාව හෝ අනත්තානුපස්සනාව මුල් වන අතර එසේ මුල් වන අනුපස්සනාව අනුව ලෝකෝත්තර මාර්ගය අනිමිත්තවිමෝක්ෂ - අප්පණිහිතවිමෝක්ෂ - සුඤ්ඤතවිමෝක්ෂ යන නම් ලබයි. විමෝක්ෂයට (ලෝකෝත්තර මාර්ගයට) පත් වීම සඳහා මුල් වන්නේ අනිච්චානුපස්සනා-දුක්ඛානුපස්සනා-අනත්තානුපස්සනා යන ත්‍රිවිධානුපස්සනා බැවින් එම ත්‍රිවිධානුපස්සනා 'විමෝක්ෂ-මුඛ' යන නමින් හැඳින්වේ.

මෙලෙස සඞ්ඛාරුපේක්ඛාඤාණය ලබා ගන්නා යෝගාවචරයා සෝතාපත්ති මාර්ගයේ දෙරටුව අබියසට පැමිණ සිටින්නෙකි.

**<u>[6:9] අනුලෝමඤාණය</u>**

සෝතාපන්න වීමට ඉතා ආසන්න වූ යෝගාවචරයා සඞ්ඛාරුපේක්ඛාඤාණය වඩාත් හොඳින් බහුල කරන විට ශ්‍රද්ධා - විරිය - සති - සමාධි ආදි ධර්ම ඉතා බලවත් ව ඇති වේ. එයින් සඞ්ඛාරුපේක්ඛාඤාණය වඩාත් තියුණු වේ. සෝතාපත්ති මාර්ගයට පත් වීමට ඉතා සමීප අවස්ථාවෙහි දී එලෙස දියුණු වූ සඞ්ඛාරුපේක්ඛාඤාණයෙන් සංස්කාර ධර්ම අනිත්‍ය වශයෙන් හෝ දුක් වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ අරමුණු කෙරෙමින් සිත භවාඞ්ගයට බැස ගනියි. අනතුරු ව එම සඞ්ඛාරුපේක්ඛාඤාණයෙන් අරමුණු කළ පරිද්දෙන් ම සංස්කාර

අනිත්‍ය හෝ දුක්ඛ හෝ අනාත්ම වශයෙන් අරමුණු කෙරෙමින් මනෝද්වාරාවජ්ජන චිත්තය ඇති වේ. ඉන් අනතුරු ව මනෝද්වාරාවජ්ජන චිත්තයෙන් සංස්කාර අරමුණු කළ පරිද්දෙන් ම සංස්කාර අරමුණු කරමින් ජවන චිත්තයක් ඇති වේ. එය 'පරිකර්ම' ජවනය නමින් හැඳින්වේ. අනතුරු ව එලෙස ම සංස්කාර අරමුණු කෙරෙමින් තවත් ජවන චිත්තයක් ඇති වේ. එය 'උපචාර' ජවනය නමින් හැඳින්වේ. අනතුරු ව පූර්ව ජවනවලින් සංස්කාර අරමුණු කළ පරිද්දෙන් ම සංස්කාර අරමුණු කෙරෙමින් තවත් ජවන චිත්තයක් ඇති වන අතර එම ජවන චිත්තය 'අනුලෝම' නමින් හැඳින්වේ. මෙම තෙවන ජවන් සිත සමගින් ඇති වන විදර්ශනා නුවණ 'අනුලෝමඤාණය' යි. එම විදර්ශනාඥනය ඊට පූර්වයෙන් ඇති වූ උදයබ්බය ආදි ඥන අටට අනුලෝම ව - අනුකූල ව පහළ වන බැවින් ද මතු සම්පූර්ණ වන සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සමගින් අනුලෝම වන බැවින් ද 'අනුලෝමඤාණ' නම් වේ. ඒ පිළිබඳ උපමාවක් මෙසේ යි. දැහැමි රජ කෙනෙක්, විනිශ්චයකාර අමාත්‍යයන් විසින් පෞරාණික රාජධර්මයට අනුව දැහැමින් දෙන ලද විනිශ්චයක් අසා අගතිගාමී නො වී එයින් සතුටු වෙයි. අනුලෝමඤාණය ද එම රජු බඳු ය. පූර්ව විදර්ශනාඥන අට විනිශ්චයකාර ඇමතියන් බඳු ය. බෝධිපාක්ෂික ධර්ම වනාහි පෞරාණික රාජධර්මය බඳු ය. එම විනිශ්චයකාර ඇමතිවරුන් පෞරාණික රාජධර්මයන්ට අනුව දුන් විනිශ්චය රජු විසින් පිළිගනු ලැබීම මෙන් පෙර විදර්ශනාඥනයන්ට ද බෝධිපාක්ෂික ධර්මයන්ට ද අනුලෝම වෙමින් 'අනුලෝමඤාණය' පහළ වේ.

මෙම අනුලෝමඤාණය වනාහි සංස්කාර අරමුණු කෙරෙමින් පහළ වන 'වුට්ඨානගාමිනී' (ලෝකෝත්තර මාර්ගයට යොමු කෙරෙන) විදර්ශනාඥන පෙළෙහි අවසන් ඥනය යි. වුට්ඨානගාමිනී විපස්සනාව සියලු ආකාරයෙන් ම අවසන් වන්නේ ඉන් අනතුරු ව පහළ වන ගෝත්‍රභූඤාණයෙනි.

මෙම අනුලෝමඤාණය පහළ වූ කල්හි එම යෝගාවචරයා සයවැනි විශුද්ධිය වූ <u>පටිපදාඤාණදස්සනවිසුද්ධිය</u> ද සම්පූර්ණ කෙරෙමින් ලෝකෝත්තර භූමියෙහි දෙරටුව අභියසට ම පැමිණ සිටියි.

# 7. ඤාණදස්සනවිසුද්ධි

## [1] ප්‍රථම (සෝතාපත්ති) - මාර්ගඥානය

අනුලෝමඤාණයට අනතුරු ව පහළ වන්නේ ගෝත්‍රභූඤාණය යි. එය සංස්කාර ධර්ම අරමුණු කරන ඥානයක් නොව ලෝකෝත්තර මාර්ග සිත පහළ වීමට උපකාරී වෙමින්, නිවන අරමුණු කෙරෙමින් පහළ වන ඥානයකි. එබැවින් ගෝත්‍රභූඤාණය, පටිපදාඤාණදස්සනවිසුද්ධියට අයත් නො වේ. එහෙත් ගෝත්‍රභූඤාණයෙන් කෙලෙස් ප්‍රහාණය වීමක් සිදු නො වන නිසා එය ඤාණදස්සනවිසුද්ධියට ද අයත් නො වේ. එනිසා ගෝත්‍රභූඤාණය වනාහි, පටිපදාඤාණදස්සනවිසුද්ධියටත් ඤාණදස්සනවිසුද්ධියටත් අතර පහළ වන විදර්ශනාඥාන පරම්පරාවට ම අයත් විශේෂ ඥානයක් ලෙස සැලකේ. පෘථග්ජන ගෝත්‍රය ඉක්මවා යමින් යෝගාවචරයාව ආර්ය-භූමියට යොමු කරවමින් මෙම ඥානය පහළ වන බැවින්, මෙය 'ගෝත්‍රභූඤාණය' නමින් හැඳින්වේ. ගෝත්‍රභූඤාණය ඇති වූ පසු නැවත පෘථග්ජන බවට පත් වීමක් නැති අතර ඒකාන්ත වශයෙන් ම අනතුරු ක්ෂණයෙහි සෝතාපත්ති මාර්ග චිත්තය පහළ වෙමින් ආර්ය-භූමියට පත් වීම නියත වශයෙන් සිදු වේ.

අනතුරු ව පූර්ව විදර්ශනාඥානයන්ගෙන් සංස්කාර ධර්මයන්ගේ යථාස්වභාවය අවබෝධ කර ගත් යෝගාවචරයන් වහන්සේ විසින් අනුලෝමඤාණයෙන් විදර්ශනාඥාන පෙළ මුදුන් පමුණුවා ගෙන තව දුරටත් සංස්කාර අරමුණු නො කෙරෙමින් ගෝත්‍රභූඤාණයෙන් අරමුණු වූ සංස්කාර නිරෝධය හෙවත් නිවන අරමුණු කෙරෙමින් දහසක් නයින් ප්‍රතිමණ්ඩිත සෝතාපත්ති මාර්ග චිත්තය ප්‍රතිවේධ කරනු ලැබේ. මෙලෙස සෝතාපත්ති මාර්ගඥානය ප්‍රතිවේධ කිරීම <u>ඤාණදස්සනවිසුද්ධිය</u> යි. (ඤාණදස්සනවිසුද්ධිය නමින් දක්වෙන්නේ ලෝකෝත්තර මාර්ගඥාන සතර ය.)

සෝතාපත්ති මාර්ගඥානය ලැබීමෙන්, එම යෝගාවචරයන් වහන්සේ විසින් මෙම ආනිසංස ද ලබන ලද්දේ වෙයි.

සෝතාපත්ති මාර්ගඥානයෙන්,

1. අපායගාමී රාග - ද්වේෂ - මෝහ ප්‍රහාණය වේ.

2. අපාය දෙරටු සියල්ල ම එම ආර්යයන් වහන්සේට වැසී යයි.
3. අනවරාග්‍ර සංසාර දුක්ඛසමුද්‍රය වියළවා දමනු ලැබේ. (එනම් සසර දුක උපරිම ආත්මභාව හතකට සීමා වේ.)
4. සප්ත ආර්යධනයෙන් යුක්ත වූවෙක් වෙයි.
5. මිථ්‍යා මාර්ග සියල්ල බැහැරලන ලද්දෙක් වෙයි.
6. සියලු බිය හා වෛර සන්සිඳුවන ලද්දෙක් වෙයි.
7. සම්මාසම්බුදුපියාණන් වහන්සේගේ ඖරසපුත්‍රභාවයට පත්වූවෙක් වෙයි.
8. තවත් බොහෝ ලෞකික, ලෝකෝත්තර ආනිසංස රැසක හිමිකරුවෙක් වේ.

<u>සෝතාපත්ති ඵලය</u>

ලෝකෝත්තර මාර්ග සිතට අනතුරුව ම ඵලය ලැබීම ලෝකෝත්තර කුසල ධර්මයන්ගේ ධර්මතාව යි. අට්ඨකථාවන්හි විවරණය කෙරෙන ආකාරයට ශ්‍රද්ධාව මුල් කර ගෙන (සද්ධාධුර) සෝතාපත්ති මාර්ගය ප්‍රතිවේධ කරන ආර්යයන් වහන්සේ '<u>සද්ධානුසාරී</u>' නම් වන සේක. ප්‍රඥාව මුල් කර ගෙන (පඤ්ඤාධුර) සෝතාපත්ති මාර්ගය ප්‍රතිවේධ කරන ආර්යයන් වහන්සේ '<u>ධම්මානුසාරී</u>' නම් වන සේක. මේ ප්‍රථම ආර්යයන් වහන්සේ ය. මාර්ග සිතට අනතුරු ව ම ඵල සිත ලැබේ. ඵල සිත ලැබූ ක්‍ෂණයෙන් පසු සෝතාපත්ති ඵලස්ථ හෙවත් දෙවැනි ආර්යයන් වහන්සේ බවට පත් වන සේක. සෝතාපත්ති මාර්ග චිත්ත වීථිය ධර්ම ග්‍රන්ථයන්හි දක්වා ඇත්තේ මෙසේ ය. (ජවන චිත්ත වීථියක චිත්තක්‍ෂණ හතකි.)

0. මනෝද්වාරාවජ්ජන චිත්තය
1. පරිකර්ම
2. උපචාර
3. අනුලෝමඤාණය

} (පටිපදාඤාණදස්සනවිසුද්ධියට අයත් වේ.)

---

4. ගෝත්‍රභූඤාණය

- - - - - - - - - - - - - - - -

5. සෝතාපත්ති මාර්ග චිත්තය } (ඤාණදස්සනවිසුද්ධි)

---

6. සෝතාපත්ති ඵල චිත්තය
7. සෝතාපත්ති ඵල චිත්තය
0. භවාඞ්ග චිත්තය

අනතුරු ව ප්‍රත්‍යවේක්ෂාඥාන ඇති වේ. භවාඞ්ග චිත්ත සන්තතිය සිඳගෙන මනෝද්වාරාවජ්ජන චිත්තය ද ලෝකෝත්තර මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කිරීම් වශයෙන් ජවන චිත්තයන් සතක් ද පිළිවෙලින් ඇති වේ. නැවත භවාඞ්ග පතනය වී ඵල ආදිය ප්‍රත්‍යවේක්ෂා කිරීමේ ජවන් චිත්තයන් (ඥාන) ඇති වේ. මෙම ප්‍රත්‍යවේක්ෂාඥානවලින් ප්‍රත්‍යවේක්ෂා (නුවණින් කරුණු සැලකීම) කරනු ලබන්නේ කරුණු පහක් පිළිබඳ ව ය.

1. මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කිරීම.
2. ඵලය ප්‍රත්‍යවේක්ෂා කිරීම.
3. ප්‍රහීණ වූ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කිරීම.
4. අවශේෂ වූ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කිරීම.
5. නිවන ප්‍රත්‍යවේක්ෂා කිරීම.

'මා විසින් මෙම මාර්ගයෙන් ආර්යභාවය ලබන ලද්'යි යනුවෙන් මාර්ගය පිළිබඳ ව ද 'ඒ හේතුවෙන් මා විසින් මෙම ආනිසංස ධර්ම ලබන ලද්'යි යනුවෙන් ඵලය පිළිබඳ ව ද 'දිට්ඨි, විචිකිච්ඡා ආදි මෙනම් කෙලෙස් ප්‍රහීණ ය' යනුවෙන් ප්‍රහීණ කෙලෙස් පිළිබඳ ව ද 'කාමරාග, ව්‍යාපාද ආදි මෙනම් කෙලෙස් අප්‍රහීණ ය' යනුවෙන් ඉදිරි මාර්ග තුනෙන් ප්‍රහාණය වන කෙලෙස් පිළිබඳ ව ද 'මෙම උතුම් නිර්වාණ ධාතුව මා විසින් අරමුණු කිරීම් වශයෙන් සාක්ෂාත් කරන ලද්'යි යනුවෙන් නිවන පිළිබඳ ව ද සෝතාපන්න ආර්යයන් වහන්සේ විසින් ප්‍රත්‍යවේක්ෂා කරනු ලැබේ. ප්‍රහීණ කෙලෙස් හා අවශේෂ කෙලෙස් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂාඥාන ඇතැම් සේඛ ශ්‍රාවකයන්ට නො ලැබෙන්නට ද ඉඩ තිබේ. එහෙත් මාර්ගය, ඵලය හා නිවන පිළිබඳ ප්‍රත්‍යවේක්ෂාඥාන ආර්යයන් වහන්සේලා සෑම දෙනාට ම ලැබෙන්නේ ම ය.

මෙලෙස සෝතාපත්ති ඵලයට පත් ආර්යයන් වහන්සේලා ප්‍රධාන වශයෙන් තිදෙනෙකි.

1. **<u>ඒකබීජී:</u>** - යළි එක්වරක් මිනිස් ලොව උපත ලබා පිරිනිවෙන සෝතාපන්න ආර්යයන් වහන්සේ.

2. **කෝලඞ්කෝල:** - ආත්මභාව **2 - 3 - 4 - 5 - 6** වශයෙන් දෙව් - මිනිස් දෙගතියෙහි උපත ලබා පිරිනිවෙන සෝතාපන්න ආර්යයන් වහන්සේ.

3. **සත්තක්ඛත්තුපරම:** - දෙව් - මිනිස් දෙගතියෙහි උපරිම වශයෙන් සත්වරක් උපත ලබා සත්වැනි භවයෙහි දී පිරිනිවෙන සෝතාපන්න ආර්යයන් වහන්සේ.

**[2] දෙවැනි (සකදාගාමී) මාර්ගඥානය**

සෝතාපත්ති ඵලයට පත් වූ ආර්යශ්‍රාවකයන් වහන්සේ අනතුරු ව සකදාගාමී මාර්ගඥානය ලැබීම සඳහා කාමරාග - පටිඝ සංයෝජන තුනී වන පරිද්දෙන් ද ඉන්ද්‍රිය - බල - බෝධ්‍යාඞ්ග ධර්මයන් වර්ධනය වන පරිද්දෙන් ද රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන පඤ්ච-උපාදානස්කන්ධ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණය අනුව බලමින් විදර්ශනාවට නැංවිය යුතු ය. එවිට දෙවැනි මාර්ග චිත්තය ලැබෙන අවස්ථාවෙහි දී විදර්ශනාඥාන පෙළ පෙර පරිද්දෙන් ම ඇති වෙමින් සඞ්ඛාරුපේක්ඛාඤාණයට අනතුරු ව මනෝද්වාරාවජ්ජන චිත්තය ද අනුලෝමඤාණ, ගෝත්‍රභූඤාණ ද පිළිවෙලින් පහළ වී සකදාගාමී මාර්ග චිත්තය ඇති වේ. එම සකදාගාමී මාර්ග චිත්තය සමගින් ඇති වන ඥානය, සකදාගාමීමග්ගඤාණය යි. එය <u>ඤාණදස්සනවිසුද්ධියට</u> අයත් වේ. ඒ පිළිබඳ චිත්තවීථිය මෙසේ ය.

**0.** මනෝද්වාරාවජ්ජන චිත්තය
**1.** පරිකර්ම ජවනය
**2.** උපචාර ජවනය
**3.** අනුලෝම ජවනය
} **(පටිපදාඤාණදස්සනවිසුද්ධියට අයත් වේ.)**

**4.** වෝදාන චිත්තය

**5.** සකදාගාමී මග්ග චිත්තය } **(ඤාණදස්සනවිසුද්ධි)**

**6.** සකදාගාමී ඵල චිත්තය
**7.** සකදාගාමී ඵල චිත්තය
**0.** භවඞ්ග චිත්තය

අනතුරු ව ප්‍රත්‍යවේක්ෂාඥාන ආදිය ලැබේ.

දෙවැනි මාර්ගඥානය හා සෙසු ඉදිරි මාර්ගඥාන සම්බන්ධයෙන් ඇති වන ගෝත්‍රභූඤාණය හැඳින්වෙන්නේ 'වෝදාන' නමිනි. සකදාගාමී ශ්‍රාවකයන් වහන්සේ නැවත මනුෂ්‍ය ලෝකයෙහි උපතක් කරා පැමිණෙතොත් ඒ එක්වරක් පමණි. 'සකදාගාමී' නමින් හැඳින්වෙන්නේ ද ඒ නිසා ම ය. යෝගාවචරයන් වහන්සේ, සකදාගාමී මාර්ග චිත්තය ලැබෙන අවස්ථාවෙහි දී තෙවැනි ආර්යයන් වහන්සේ බවට ද ඵල සිත ලැබීමත් සමග ම සිවුවැනි ආර්යයන් වහන්සේ බවට ද පත් වන සේක.

## [3] තෙවැනි (අනාගාමී) මාර්ගඥානය

සකදාගාමී ඵලයට පත් වූ ආර්යශ්‍රාවකයන් වහන්සේ අනතුරු ව අනාගාමී මාර්ගඥානය ලැබීම සඳහා කාමරාග-පටිඝ සංයෝජන මුළුමනින් ම ප්‍රහාණය වන පරිද්දෙන් ද ඉන්ද්‍රිය - බල - බෝධ්‍යාඞ්ග ධර්ම තව දුරටත් වර්ධනය වන පරිද්දෙන් ද රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ යන පඤ්ච-උපාදානස්කන්ධ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්ෂණය අනුව බලමින් විදර්ශනාවට නැංවිය යුතු ය. එවිට තෙවැනි මාර්ග චිත්තය ලැබෙන අවස්ථාවෙහි දී විදර්ශනාඥාන පෙළ පෙර පරිද්දෙන් ම ඇතිවෙමින් සඞ්ඛාරුපේක්ඛාඤාණයට අනතුරු ව පිළිවෙලින් මනෝද්වාරාවජ්ජන චිත්තයත් අනුලෝමඤාණ, ගෝත්‍රභූඤාණ (වෝදාන) ආදියත් පිළිවෙලින් පහළ වී අනාගාමී මාර්ග චිත්තය ඇති වේ. එම අනාගාමී මාර්ග චිත්තය සමගින් ඇති වන ඥානය - ඤාණදස්සනවිසුද්ධියට අයත් වේ. ඒ පිළිබඳ චිත්තවීථිය සකදාගාමී චිත්තවීථියට සමාන වන අතර වෙනස වන්නේ සකදාගාමී මාර්ග හා ඵල සිත් වෙනුවට අනාගාමී මාර්ග හා ඵල සිත් යෙදීම යි. අනතුරු ව ප්‍රත්‍යවේක්ෂාඥාන ආදිය ලැබේ. යෝගාවචරයන් වහන්සේ, අනාගාමී මාර්ග චිත්තය ලැබෙන අවස්ථාවෙහි දී පස්වැනි ආර්යයන් වහන්සේ බවට ද ඵල සිත ලැබීමත් සමග ම සවැනි ආර්යයන් වහන්සේ බවට ද පත් වන සේක. අනාගාමී ආර්යයන් වහන්සේලා ඕරම්භාගීය (සක්කායදිට්ඨි, විචිකිච්ඡා,

සීලබ්බතපරාමාස, කාමරාග, පටිඝ) සංයෝජන ප්‍රහාණය කර ඇති බැවින් නැවත කාමධාතුවෙහි නූපදිති.

## [4] සිවුවැනි (අරහත්ත) මාර්ගඥනය

අනාගාමී ඵලයට පත් වූ ආර්යශ්‍රාවකයන් වහන්සේ අනතුරු ව අර්හත් මාර්ගඥනය ලැබීම සඳහා රූපරාග - අරූපරාග - මාන - උද්ධච්ච - අවිජ්ජා යන සෙසු සංයෝජන සියල්ල මුළුමනින් ම ප්‍රහාණය වන පරිද්දෙන් ද ඉන්ද්‍රිය - බල - බෝධ්‍යාඞ්ග ධර්ම තව දුරටත් වර්ධනය වන පරිද්දෙන් ද රූප - වේදනා - සඤ්ඤ - සඞ්ඛාර - විඤ්ඤණ යන පඤ්ච-උපාදනස්කන්ධ අනිත්‍ය - දුක්ඛ - අනාත්ම යන ත්‍රිලක්‍ෂණය අනුව බලමින් විදර්ශනාවට නැංවිය යුතු ය. එවිට සිවුවැනි මාර්ග චිත්තය ලැබෙන අවස්ථාවෙහි දී විදර්ශනාඥන පෙළ පෙර පරිද්දෙන් ම ඇතිවෙමින් සඞ්ඛාරුපේක්ඛාඤණයට අනතුරු ව පිළිවෙළින් මනෝද්වාරාවජ්ජන චිත්තයත් අනුලෝමඤණ- ගෝත්‍රභූඤණත් (වෝදන) පිළිවෙළින් පහළ වී අර්හත් මාර්ග චිත්තය ඇති වේ. එම අර්හත් මාර්ග චිත්තය සමගින් ඇති වන ඥනය - <u>ඤණදස්සනවිසුද්ධියට</u> අයත් වේ. ඒ පිළිබඳ චිත්තවීථිය සකදගාමී චිත්තවීථියට සමාන වන අතර වෙනස වන්නේ සකදගාමී මාර්ග හා ඵල සිත් වෙනුවට අර්හත් මාර්ග හා ඵල සිත් යෙදීම යි. අනතුරු ව ප්‍රත්‍යවේක්‍ෂාඥන ආදිය ලැබේ. ඉහත දක්වන ලද ප්‍රත්‍යවේක්‍ෂාඥනවලින් රහතන් වහන්සේට ලැබෙන්නේ සතරක් පමණි. කෙලෙස් සියල්ල ප්‍රහීණ බැවින් ඉතිරි කෙලෙස් ගැන ප්‍රත්‍යවේක්‍ෂා කිරීමක් නැත. රහතන් වහන්සේට ප්‍රත්‍යවේක්‍ෂාඥන ලැබෙන්නේ,

1. මාර්ගය
2. ඵලය
3. නිවන
4. ප්‍රහීණ කෙලෙස්

යන ධර්ම පිළිබඳ ව ය. යෝගාවචරයන් වහන්සේ අර්හත් මාර්ග චිත්තය ලබන අවස්ථාවෙහි දී සත්වැනි ආර්යයන් වහන්සේ බවට ද ඵල සිත ලැබීමත් සමගින් සියලු කෙලෙස්

ප්‍රහාණය කළ, සියලු ස්කන්ධ බර බහා තැබූ, මහාක්ෂීණාශ්‍රව, අග්‍ර දක්ෂිණාර්හ අටවැනි ආර්යයන් වහන්සේ බවට ද පත් වන සේක.

මේ අනුව ඤාණදස්සනවිසුද්ධි නමින් හැඳින්වෙන,

1. සෝතාපත්තිමග්ගඤාණය
2. සකදාගාමීමග්ගඤාණය
3. අනාගාමීමග්ගඤාණය
4. අරහත්තමග්ගඤාණය

යන සතර මාර්ගඥාන සපුරා ගෙන සියලු භව බන්ධනයන්ගෙන් නිදහස් වී අනුපාදපරිනිබ්බාන නම් වූ උතුම් නිවනින් සැනසීම සඳහා නුවණැති සත්පුරුෂයෝ නො පමා ව වෑයම් කරත්වා!

# 8. මාර්ග-ඵල ලැබීම සඳහා සපුරා ගත යුතු බෝධිපාක්ෂික ධර්ම

දුක්ඛ - සමුදය - නිරෝධ - මාර්ග යන චතුරාර්යසත්‍යය පිළිබඳ අවබෝධය 'බෝධි' නම් වේ. එම අවබෝධය (බෝධිය) ලැබීම සඳහා සියලු බුදු - පසේබුදු - මහරහතන් වහන්සේලා සම්පූර්ණ කළා වූ තිස්හතක් වූ ධර්ම වනාහි බෝධිපාක්ෂික ධර්ම නම් වේ. යමෙක් චතුරාර්යසත්‍යය අවබෝධ කර ගෙන අවිද්‍යාව නැති කොට විද්‍යාව ඇති කර ගනිමින් භව ගමන අවසන් කිරීමට අපේක්ෂා කරත් ද ඒ හැමදෙනා විසින් ම මෙම සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සම්පූර්ණ කළ යුතු ම ය. එම බෝධිපාක්ෂික ධර්ම **(37)** මෙසේ යි.

**1)** <u>සතර සතිපට්ඨාන</u> **[4]**

1. කායානුපස්සනා සතිපට්ඨානය (කය අනුව නුවණින් දකිමින් සිහිය පිහිටුවා ගැනීම)
2. වේදනානුපස්සනා සතිපට්ඨානය (විඳීම් අනුව නුවණින් දකිමින් සිහිය පිහිටුවා ගැනීම)
3. චිත්තානුපස්සනා සතිපට්ඨානය (සිත අනුව නුවණින් දකිමින් සිහිය පිහිටුවා ගැනීම)
4. ධම්මානුපස්සනා සතිපට්ඨානය (ධර්මතා අනුව නුවණින් දකිමින් සිහිය පිහිටුවා ගැනීම)

**2)** <u>සතර සම්මප්පධාන</u>*** [4]**

*(*'පධාන' යනු වීර්යය යි.)*

1. තමා තුළ ඇති නො වූ අකුසල් ඇති නො වීම පිණිස කරන උත්සාහය.
2. තමා තුළ ඇති වූ අකුසල් දුරු කිරීම පිණිස කරන උත්සාහය.
3. තමා තුළ ඇති කර නො ගත් කුසල් ඇති කර ගැනීම පිණිස කරන උත්සාහය.
4. තමා තුළ ඇති කර ගත් කුසල් රැක ගනිමින් දියුණු කර ගැනීම පිණිස කරන උත්සාහය.

3) <u>සතර ඉද්ධිපාද (සෘද්ධිපාද)</u> [4]

1. ඡන්ද - ඉද්ධිපාදය (සමථ, විපස්සනා ධර්ම දියුණු කිරීමේ බලවත් කැමැත්ත)
2. විරිය - ඉද්ධිපාදය (සමථ, විපස්සනා ධර්ම දියුණු කිරීමේ බලවත් උත්සාහය)
3. චිත්ත - ඉද්ධිපාදය (සමථ, විපස්සනා ධර්ම දියුණු කිරීම පිළිබඳ දැඩි අධිෂ්ඨානය හෙවත් චිත්තය)
4. වීමංසා - ඉද්ධිපාදය (සමථ, විපස්සනා ධර්ම දියුණු කිරීම පිළිබඳ වීමංසනය හෙවත් ප්‍රඥාව)

4) <u>පඤ්ච ඉන්ද්‍රිය</u>* [5]

*(*'ඉන්ද්‍රිය' යනු සෙසු ධර්ම තමාට අනුකූල කර ගනිමින් අධිපතිභාවය සිදු කරන ධර්මයෝ ය.)*

1. සද්ධා - ඉන්ද්‍රිය
2. විරිය - ඉන්ද්‍රිය
3. සති - ඉන්ද්‍රිය
4. සමාධි - ඉන්ද්‍රිය
5. පඤ්ඤා - ඉන්ද්‍රිය

5) <u>පඤ්ච බල</u>* [5]

*(*කෙලෙසුන් මැඩලීම පිණිස ඉතා බලවත් බවට පත් ඉන්ද්‍රිය ධර්ම 'බල' නම් වේ.)*

1. සද්ධා - බල
2. විරිය - බල
3. සති - බල
4. සමාධි - බල
5. පඤ්ඤා - බල

6) <u>සප්ත බෝධ්‍යාංග* (බොජ්ඣඞ්ග)</u> [7]

*(*චතුරාර්යසත්‍යය අවබෝධ කර ගැනීමට සෘජු ව ම උපකාරී වන ධර්ම 'බොජ්ඣඞ්ග' නම් වේ.)*

1. සතිසම්බොජ්ඣඞ්ගය - සතර සතිපට්ඨානය මනා ව වැඩීම.

2. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය - ධර්මතා පිළිබඳ ව මනා ව නුවණින් විමසීම.
3. විරියසම්බොජ්ඣඞ්ගය - සතරාකාර වීර්යය මනා ව ඇති කර ගැනීම.
4. පීතිසම්බොජ්ඣඞ්ගය - සමථ, විපස්සනා වැඩීමෙන් ඇති වන නිරාමිස ප්‍රීතිය.
5. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය - සමථ, විපස්සනා වැඩීම තුළින් ඇති වන සන්සිඳීම.
6. සමාධිසම්බොජ්ඣඞ්ගය - සමථ, විපස්සනා වැඩීම තුළින් ඇති වන සිතේ එකඟ බව.
7. උපේක්ඛාසම්බොජ්ඣඞ්ගය - සමථ, විපස්සනා වැඩීම තුළින් ඇති වන සිතේ මැදහත් බව.

7) <u>ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය</u> **[8]**

1. සම්මාදිට්ඨි - නිවැරදි අවබෝධය (චතුරාර්යසත්‍යය පිළිබඳ අවබෝධඥානය - මාර්ග සිත්වල යෙදෙන ප්‍රඥා චෛතසිකය)
2. සම්මාසඞ්කප්ප - නිවැරදි සංකල්පනා (නෙක්ඛම්ම සංකල්පනා ආදිය හා මාර්ග සිත්වල යෙදෙන විතක්ක චෛතසිකය)
3. සම්මාවාචා - නිවැරදි වචන කථා කිරීම* (මුසාවාද ආදි වාග්දුශ්චරිතවලින් වැළකීම)
4. සම්මාකම්මන්ත - නිවැරදි කායික ක්‍රියා* (ප්‍රාණඝාත ආදි කායදුශ්චරිතවලින් වැළකීම)
5. සම්මාආජීව - නිවැරදි ජීවිකාව* (ජීවිකාව පිණිස සිදු කරන කායදුශ්චරිත හා වාග්දුශ්චරිතවලින් වැළකීම) *මෙම අංග තුන ද මාර්ග සිත්හි යෙදෙන විරති චෛතසිකයෝ වෙති.
6. සම්මාවායාම - නිවැරදි උත්සාහය (සතරාකාර වීර්යය-මාර්ග සිත්වල යෙදෙන විරිය චෛතසිකය)

7. සම්මාසති - නිවැරදි සිහිය (සතර සතිපට්ඨානයෙහි සිත මනා කොට පිහිටුවා ගැනීම)

8. සම්මාසමාධි - නිවැරදි සමාධිය (උපචාර සහිත වූ අෂ්ට සමාපත්තීන් ඇති කර ගැනීම)

බෝධිපාක්ෂික ධර්ම සියල්ල **4 + 4 + 4 + 5 + 5 + 7 + 8 = 37** කි.

චතුරාර්යසත්‍යය අවබෝධ වීම වනාහි හුදෙක් ප්‍රාර්ථනා කළ පමණින් ම සිදු වන්නක් නො වේ. ඒ සඳහා කළ යුතු දේ නම්, නො පමා ව මෙම සත්තිස් බෝධිපාක්ෂික ධර්ම වැඩීම යි. පෙර වැඩවිසූ බුදු, පසේබුදු, මහරහත් උතුමන් වහන්සේලා ද අනාගාමී, සකදාගාමී, සෝතාපන්න මාර්ග-ඵලලාභී උතුමන් වහන්සේලා ද එම අධිගමයන්ට පත් වූයේ මෙම බෝධිපාක්ෂික ධර්ම සම්පූර්ණ කර ගැනීමෙනි.

# 9. සප්ත විශුද්ධීන් ඇති කර ගත් ආර්යශ්‍රාවකයන් වහන්සේලා

බෝධිපාක්ෂික ධර්ම ඇති කර ගැනීමෙන් ශ්‍රී සද්ධර්මය අවබෝධ කර ගනිමින් ආර්ය-භූමියට පත් වූ ආර්යශ්‍රාවකයන් වහන්සේලා එකසිය අටදෙනෙකු පිළිබඳ ව අට්ඨකථාවන්හි සඳහන් වේ. එම ආර්යයන් වහන්සේලා ආර්ය-භූමියට පත් ව සිටින්නේ <u>සප්ත විශුද්ධීන්</u> ද ඇති කර ගනිමිනි. එකසිය අටක් (108) වූ එම ආර්යශ්‍රාවකයන් වහන්සේලා පිළිවෙළින් මෙසේ යි.

**<u>සෝතාපන්න (ඵලස්ථ) ආර්යයන් වහන්සේලා 12</u>**

සක්කායදිට්ඨි (ආත්මදෘෂ්ටිය), විචිකිච්ඡා (සැකය), සීලබ්බතපරාමාස (වැරදි ශීල-ව්‍රත අනුගමනය කිරීම) යන ත්‍රිවිධ භවසංයෝජන ප්‍රහාණය කරමින් ලෝකෝත්තර-ආර්ය අෂ්ටාංගික මාර්ගයට පත් ආර්යශ්‍රාවකයන් වහන්සේ 'සෝතාපන්න' නම් වන සේක. සෝතාපන්න ශ්‍රාවකයන් වහන්සේලා (උපදින භව ගණන අනුව) තිදෙනෙක් වෙති.

1. **ඒකබීජී** - එක්වරක් යළි මෙලොව උපත ලබා අර්හත්වයට පත් වන සෝතාපන්න ආර්යයන් වහන්සේ.
2. **කෝලඞ්කෝල** - ආත්මභාව **2 - 3 - 4 - 5 - 6** වශයෙන් යළි දෙව් - මිනිස් සුගතීන්හි උපත ලබා අර්හත්වයට පත් වන සෝතාපන්න ආර්යයන් වහන්සේ.
3. **සත්තක්ඛත්තුපරම** - උපරිම වශයෙන් ආත්මභාව හතක් ම යළි දෙව් - මිනිස් සුගතීන්හි උපත ලබා හත්වැනි ජීවිතයෙහි දී අර්හත්වයට පත් වන සෝතාපන්න ආර්යයන් වහන්සේ.

මෙම ශ්‍රාවකයන් වහන්සේලා තිදෙන සෝතාපන්න වීම සඳහා අනුගමනය කරන ප්‍රතිපද‍ා සතරකි. එනම්,

1. **දුක්ඛාපටිපදාදන්ධාභිඤ්ඤා** - දුක සේ පිළිවෙත් පුරා සෙමෙන් ධර්මය අවබෝධ කිරීම.
2. **දුක්ඛාපටිපදාඛිප්පාභිඤ්ඤා** - දුක සේ පිළිවෙත් පුරා වහා ධර්මය අවබෝධ කිරීම.
3. **සුඛාපටිපදාදන්ධාභිඤ්ඤා** - සුව සේ පිළිවෙත් පුරා සෙමෙන් ධර්මය අවබෝධ කිරීම.
4. **සුඛාපටිපදාඛිප්පාභිඤ්ඤා** - සුව සේ පිළිවෙත් පුරා වහා ධර්මය අවබෝධ කිරීම.

සෝතාපන්න ශ්‍රාවකයන් වහන්සේලා තිදෙන මෙම ප්‍රතිපදා සතරෙන් ගුණ වූ කල **(3x4)** දොළොස්දෙනෙකි.

<u>සකදාගාමී (ඵලස්ථ) ආර්යයන් වහන්සේලා 12</u>

සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාස යන ත්‍රිවිධ සංයෝජන ප්‍රහාණය කරමින් කාමරාග-පටිඝ සංයෝජන ද තුනී කර ගත් යළි එක්වරක් මෙලොව උපත ලබා අර්හත්වයට පත් වනසුලු ආර්යයන් වහන්සේ 'සකදාගාමී' නම් වන සේක. කාම - රූප - අරූප යන භව තුනෙහි දී ධර්මය අවබෝධ කර ගැනීම් වශයෙන් සකදාගාමී ආර්යයන් වහන්සේලා තිදෙනෙක් වෙති. එම තිදෙනා වහන්සේ ඉහත සඳහන් 'සුඛාපටිපදා' ආදි ප්‍රතිපදා සතරෙන් ගුණ වූ කල **(3x4)** දොළොස්දෙනෙක් වෙති.

<u>අනාගාමී (ඵලස්ථ) ආර්යයන් වහන්සේලා 24</u>

සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාස - කාමරාග - පටිඝ යන ඕරම්භාගීය (කාමධාතුවට බැඳ තබන) සංයෝජන මුළුමනින් ම ප්‍රහාණය කිරීමෙන් නැවත උපතක් පිණිස කාමධාතුවට නො පැමිණ, සුද්ධාවාස බ්‍රහ්මලෝකවල උපත ලබා එහි ම අර්හත්වයට පත් ව එහි ම පිරිනිවෙන ආර්යයන් වහන්සේ 'අනාගාමී' නම් වන සේක. අනාගාමී ආර්යයන් වහන්සේලා ප්‍රධාන වශයෙන් පස්දෙනෙක් වෙති.

1. **අන්තරාපරිනිබ්බායී** -මරණින් මතු පහළ වන්නා වූ සුද්ධාවාසයෙහි නියමිත ආයු ප්‍රමාණයෙන් අඩක් ගත වීමට පෙර අර්හත්වයට පත් ව පිරිනිවෙන අනාගාමී ආර්යයන් වහන්සේ.

2. **උපහච්චපරිනිබ්බායී** -මරණින් මතු පහළ වන්නා වූ සුද්ධාවාසයෙහි නියමිත ආයු ප්‍රමාණයෙන් අඩක් ගත වූ පසු අර්හත්වයට පත් ව පිරිනිවෙන අනාගාමී ආර්යයන් වහන්සේ.

3. **අසඞ්ඛාරපරිනිබ්බායී** -මරණින් මතු සුද්ධාවාසයෙහි පහළ වූ පසු ආයාසයකින් තොර ව ම අර්හත්වයට පත් ව එහි දී පිරිනිවෙන අනාගාමී ආර්යයන් වහන්සේ.

4. **සසඞ්ඛාරපරිනිබ්බායී** -මරණින් මතු සුද්ධාවාසයෙහි පහළ වූ පසු වීර්ය කොට අර්හත්වයට පත් ව එහි දී පිරිනිවෙන අනාගාමී ආර්යයන් වහන්සේ.

5. **උද්ධංසෝතෝ අකනිට්ඨගාමී** - ‘අවිහ’ ආදි යට සුද්ධාවාසවල පහළ ව අනුපිළිවෙලින් ඉහළ සුද්ධාවාසවල උපත ලබමින් ‘අකනිට්ඨ’ සුද්ධාවාසය දක්වා ම ගොස් ‘අකනිට්ඨ’ සුද්ධාවාසයෙහි දී අර්හත්වයට පත් ව එහි දී පිරිනිවෙන අනාගාමී ආර්යයන් වහන්සේ.

අනාගාමී ආර්යයන් වහන්සේලා මරණින් මතු පහළ වන්නා වූ සුද්ධාවාස බ්‍රහ්මලෝක පහකි. රූපාවචර බ්‍රහ්මලෝක ගණයට අයත් මෙම බ්‍රහ්මලෝකවල වාසය කරන්නේ අනාගාමී හා අර්හත් ඵලයන්ට පත් වූ ආර්යයන් වහන්සේලා බැවින් ඒවා ‘සුද්ධාවාස’ (ශුද්ධ සත්ත්වයන්ගේ වාසභූමි) නම් වේ. ඒවා නම්,

1.'අවිහ' බඹලොව - මෙහි ඉහත සඳහන් අනාගාමී
*(ආයු-කාලය උපරිම මහාකල්ප 1000 කි.)* ආර්යයන් වහන්සේලා පස්දෙන ම විද්‍යමාන වෙති. **(5)**

2.'අතප්ප' බඹලොව - මෙහි ද ඉහත සඳහන් අනාගාමී
*(ආයු-කාලය උපරිම මහාකල්ප 2000 කි.)* ආර්යයන් වහන්සේලා පස්දෙන ම විද්‍යමාන වෙති. **(5)**

3.'සුදස්ස' බඹලොව - මෙහි ද ඉහත සඳහන් අනාගාමී
*(ආයු-කාලය උපරිම මහාකල්ප 4000 කි.)* ආර්යයන් වහන්සේලා පස්දෙන ම විද්‍යමාන වෙති. **(5)**

4.'සුදස්සී' බඹලොව - මෙහි ද ඉහත සඳහන් අනාගාමී
*(ආයු-කාලය උපරිම මහාකල්ප 8000 කි.)* ආර්යයන් වහන්සේලා පස්දෙන ම විද්‍යමාන වෙති. **(5)**

5.'අකනිට්ඨ' බඹලොව- මෙහි 'උද්ධංසෝතෝ අකනිට්ඨගාමී'
*(ආයු-කාලය උපරිම මහාකල්ප 16000 කි.)* ආර්යයන් වහන්සේ හැර ඉහත සඳහන් සෙසු අනාගාමී ආර්යයන් වහන්සේලා සිවුදෙන විද්‍යමාන වෙති. **(4)**

මේ අනුව සුද්ධාවාස පසෙහි ප්‍රභේද වශයෙන් අනාගාමී ආර්යයන් වහන්සේලා **(5 + 5 + 5 + 5 + 4 = 24)** විසිහතරදෙනෙක් විද්‍යමාන වෙති.

**<u>රහතන් වහන්සේලා (ඵලස්ථ) 2</u>**

සක්කායදිට්ඨි - විචිකිච්ඡා - සීලබ්බතපරාමාස - කාමරාග - පටිඝ - රූපරාග - අරූපරාග - මාන - උද්ධච්ච - අවිජ්ජා යන දස සංයෝජන ප්‍රහාණය කරමින් සියලු භවබැඳුම් ලිහා දමමින් නැවත නූපදින ලෙස සියලු කෙලෙස් දුරු කළ ආර්යයන් වහන්සේ රහතන් වහන්සේ ය. රහතන් වහන්සේලා ප්‍රධාන වශයෙන් දෙකොටසකි.

1. **ශුෂ්කවිදර්ශක** - ධ්‍යාන පාදක කර නො ගනිමින් ***(සුක්ඛවිපස්සක)*** විදර්ශනාව ම පාදක කර ගනිමින්

අර්හත්වයට පත් වූ ආර්යයන් වහන්සේ '<u>ශුෂ්කවිදර්ශක</u>' රහතන් වහන්සේ ය. ධ්‍යාන සම්පූර්ණ නො කළ ද විදර්ශනාව වඩන යෝගාවචරයන් වහන්සේට විදර්ශනාවේ බලයෙන් පඤ්ච-නීවරණ යටපත් වී සිත එකඟ වීමෙන් සමාධිය ඇති වේ. එය විදර්ශනා සමාධිය යි. එවිට සමාධි - ප්‍රඥා ශික්‍ෂා දෙක ම එයින් සම්පූර්ණ වේ. ශුෂ්කවිදර්ශනාව යනු සමථ ධ්‍යාන රහිත බව විනා විදර්ශනා සමාධිය රහිත බව නො වේ. ශුෂ්කවිදර්ශක රහතන් වහන්සේ පූර්වයෙන් ධ්‍යාන ලබා නො තිබුණත් විදර්ශනාව ම පාදක කර ගෙන මාර්ග - ඵල ලබන මොහොතෙහි දී එම මාර්ග සිත ප්‍රථමධ්‍යානයට සමාන වූ සමාධි ගුණයකින් යුක්ත වන බව ධර්ම ග්‍රන්ථයන්හි සඳහන් වේ.

2. **සමථයානික** - පළමු ව රූපාවචර - අරූපාවචර ධ්‍යාන, සමාපත්ති ඇති කර ගෙන ධ්‍යාන පාදක කර ගෙන විදර්ශනාව වඩා අර්හත්වයට පත් වූ ආර්යයන් වහන්සේ <u>සමථයානික</u> වන සේක.

## <u>මාර්ගස්ථ ශ්‍රාවකයන් වහන්සේලා 4</u>

ඉහත සඳහන් සියලු ම ආර්යයන් වහන්සේලා ඵලයට පත් වූ (ඵලස්ථ) උතුමෝ ය. ඵලයට පත් වන්නේ ලෝකෝත්තර ආර්ය-අෂ්ටාඞ්ගික මාර්ගය සපුරා ගෙන ය. ලෝකෝත්තර ආර්ය-අෂ්ටාඞ්ගික මාර්ගය වනාහි කෙලෙස් දුරු වීමේ අවධීන් අනුව චිත්තසන්තානයෙහි පහළ වන්නේ වාර හතරක දී ය. එනිසා සම්මාදිට්ඨි ආදි අංග අටෙන් යුතු ලෝකෝත්තර මාර්ගය, මාර්ග සිත් අනුව චතුර්විධ වේ. අභිධර්මයට අනුව එක් ලෝකෝත්තර මාර්ග සිතක් ලැබෙන්නේ එක චිත්තක්ෂණයක දී ය. මෙම ලෝකෝත්තර මාර්ග සිත් සතර තමා තුළ පහළ වන ක්‍ෂණයේ දී එම ආර්යයන් වහන්සේලා මාර්ගස්ථයෝ වෙති.

1. **සෝතාපත්ති මාර්ග සිත** - මෙම මාර්ග සිත ලබන ක්‍ෂණයෙහි සෝතාපන්න මාර්ගස්ථ ආර්යයන් වහන්සේ විද්‍යමාන වන සේක.
2. **සකදාගාමී මාර්ග සිත** - මෙම මාර්ග සිත ලබන ක්‍ෂණයෙහි සකදාගාමී මාර්ගස්ථ ආර්යයන් වහන්සේ විද්‍යමාන වන සේක.
3. **අනාගාමී මාර්ග සිත** - මෙම මාර්ග සිත ලබන ක්‍ෂණයෙහි අනාගාමී මාර්ගස්ථ ආර්යයන් වහන්සේ විද්‍යමාන වන සේක.
4. **අර්හත් මාර්ග සිත** - මෙම මාර්ග සිත ලබන ක්‍ෂණයෙහි අර්හත් මාර්ගස්ථ ආර්යයන් වහන්සේ විද්‍යමාන වන සේක.

| | |
|---|---|
| සෝතාපන්න (ඵලස්ථ) ආර්යයන් වහන්සේලා | **12** |
| සකදාගාමී (ඵලස්ථ) ආර්යයන් වහන්සේලා | **12** |
| අනාගාමී (ඵලස්ථ) ආර්යයන් වහන්සේලා | **24** |
| අර්හත් (ඵලස්ථ) ආර්යයන් වහන්සේලා | **2** |
| මාර්ගස්ථ ආර්යයන් වහන්සේලා | **4** |
| | **54** |

ඇතැම් ශ්‍රාවකයන් වහන්සේලා ශ්‍රද්ධාව මුල් කර ගෙන (සද්ධාධුර) ධර්මය අවබෝධ කරන අතර ඇතැම් ශ්‍රාවකයන් වහන්සේලා ප්‍රඥාව මුල් කර ගෙන (පඤ්ඤාධුර) ධර්මය අවබෝධ කරති. ඉහත ශ්‍රාවකයන් වහන්සේලා පනස්සතරදෙනා වහන්සේ සද්ධාධුර, පඤ්ඤාධුර දෙකෙන් ගුණ වූ කල්හි **(54x2)** සියලු ම <u>ආර්යශ්‍රාවකයන් වහන්සේලා එකසිය අටදෙනෙක් **(108)** වෙති.</u>

මෙම උතුම් ආර්යයන් වහන්සේලා එකසිය අටදෙනා වහන්සේ විද්‍යමාන වන්නේ බුදුසසුනක ම පමණි. මෙම ආර්යභාවයට පත් වීම සඳහා හේතු වන සප්ත විශුද්ධීන්

විද්‍යමාන වන්නේ ද බුදුසසුනක ම පමණි. එනිසා දුර්ලභ මිනිසත් බවක් ලැබූ නුවණැති සත්පුරුෂ සැමදෙන බුදුසසුනක් සම්මුඛ ව පවතින මෙම දුර්ලභ ක්ෂණයෙහි සප්ත විශුද්ධීන් සම්පූර්ණ කර ගෙන ආර්යභාවයට වහා පත් ව සියලු බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළ ශාන්ත-සුඛ ලක්ෂණ අමෘත නිර්වාණ ශාන්තිය අවබෝධ කර ගැනීමට වෑයම් කරත්වා...!

සාධු ! සාධු !! සාධු !!!

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:


- ✍ **මජ්ඣිමනිකායේ 'රථවිනීත' සූත්‍රය.**
- ✍ **අඞ්ගුත්තරනිකාය (තිකනිපාතය)**
- ✍ **මජ්ඣිමනිකායට්ඨකථා (පපඤ්චසූදනී).**
- ✍ **ඛුද්දකපාඨට්ඨකථා**
- ✍ **විසුද්ධිමග්ග (පාළි).**
- ✍ **සිංහල විශුද්ධි මාර්ගය** - පූජ්‍ය මාතර ශ්‍රී ධම්මවංස නාහිමි.
- ✍ **විදර්ශනා භාවනා ක්‍රමය** -
  අතිපූජනීය රේරුකානේ චන්‍දවිමල මහානාහිමි.
- ✍ **බෝධිපාක්ෂික ධර්ම විස්තරය** -
  අතිපූජනීය රේරුකානේ චන්‍දවිමල මහානාහිමි.
- ✍ **මහාචත්තාළීසාකාර විපස්සනා භාවනා ක්‍රමය** -
  අතිපූජනීය රේරුකානේ චන්‍දවිමල මහානාහිමි.
- ✍ **සූවිසි මහගුණය** - අතිපූජනීය රේරුකානේ චන්‍දවිමල මහානාහිමි.
- ✍ **ප්‍රඥාවේ ආලෝකය** - පා අවුක් භාවනා ග්‍රන්ථ.
- ✍ **සමසතළිස් කර්මස්ථාන භාවනා** -
  අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍ද්‍රයන් වහන්සේ.
- ✍ **විදර්ශනා පරපුර** -
  අතිපූජනීය මාතර ඤාණාරාම ස්වාමීන්‍ද්‍රයන් වහන්සේ.